Australian Aid

MURAGALA | CPPP

මැතිවරණ ක්‍රමවේදයන් සඳහා වන ජාත්‍යන්තර පදනම

# ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන නියෝජනය සඳහා වන සියයට 25ක කෝටාව පිලිබඳ ඇගයීමක්:

## බලපෑම සහ උගත් පාඩම්



# ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන නියෝජනය සඳහා වන සියයට 25ක කෝටාව පිළිබඳ ඇගයීමක්: බලපෑම සහ උගත් පාඩම්


මහාචාර්ය එස්.ඒ. ප්‍රභා එම්.මනුරත්න

හරීන්ද්‍ර බී දසනායක

ආචාර්ය රජ්නි ගමගේ

කනකා අබේගුණවර්ධන

ඕස්ට්‍රේලියානු රජය වෙනුවෙන් ඕස්ට්‍රේලියානු ආධාර වැඩසටහන යටතේ මැතිවරණ පද්ධති සඳහා වන අන්තර්ජාතික පදනම (IFES) විසින් මුරගල - ප්‍රගතිශීලී දේශපාලන සහ ප්‍රතිපත්ති කේන්ද්‍රය මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි.

## අයිතිය බැහැර කිරීම

මෙම ප්‍රකාශනය සඳහා ඕස්ට්‍රේලියානු රජය විසින් එහි විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව මඟින් අරමුදල් සපයන ලදී. මෙම ප්‍රකාශනයෙහි සඳහන් අදහස් හුදෙක් කතුවරුන්ගේ පමණක් වන අතර අවශ්‍යයෙන්ම ඕස්ට්‍රේලියානු රජයේ ඒවා නොවේ.

**ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන නියෝජනය සඳහා වන සියයට 25ක කෝටාව පිළිබඳ ඇගයීමක්: බලපෑම සහ උගත් පාඩම්**

කර්තෘ හිමිකම © 2024 මැතිවරණ පද්ධති සඳහා වන ජාත්‍යන්තර පදනම. සියලුම හිමිකම් ඇවිරිණි.

# ස්තුතිය ↗

මෙම අධ්‍යයනය සංල්පගත කිරීමේ සිට සම්පූර්ණ කිරීම දක්වා, මැතිවරණ ක්‍රම පිළිබඳ ජාත්‍යන්තර පදනම (IFES) විසින් පර්යේෂණ කණ්ඩායම වෙත ලබා දුන් නිරන්තර ප්‍රතිචාර, ශාස්ත්‍රීය නිදහස සහ මූල්‍ය අනුග්‍රහය නොවන්නට මෙම අධ්‍යයනය සාර්ථක නොවන්නට ඉඩ තිබිණි. මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ සහාය ලබා දුන් නෙරන්ජන් මද්දුමගේ හට අපගේ විශේෂ ස්තුතිය හිමි වේ.

මෙම අධ්‍යනය සඳහා දේශපාලන පක්ෂවල ඉහළ තනතුරු දරන දේශපාලනඥයන්, දේශපාලන පක්ෂ නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, පළාත් පාලන ආයතන සභාපතිවරුන්, කාන්තා නියෝජිතයන් සහ අපේක්ෂකයින් සමඟ සම්මුඛ සාකච්ඡා මාලාවක් පැවැත්වීමට සිදු විය. ස්ත්‍රී අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ක්‍රියාධර සිවිල් සමාජ නායිකාවෝ, කාන්තා සියයට විසි පහ කෝටාව යථාර්ථයක් බවට පත් වීම පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් සහ අදහස් ඉතා නිහතමානීව සහ නිර්ලෝභිව  අප සමඟ ප්‍රකාශ කළහ. දත්ත රැස් කිරීමේ දී පුළුල් සහභාගිත්වයක් සහතික කිරීම සඳහා බිම් මට්ටමේ ප්‍රවේශය සහ සහාය ලබා දීමට උමා චන්ද්‍රප්‍රකාශ්, තුෂාරි මඩහපොල, ඉන්ද්‍රා අයිරාංගනී, සහ ශ්‍රීන් සරූර් අනුපමේය සහයෝගයක් ලබා දුන්නෝය.

වර්ෂ 2018 මැතිවරණයේ කාන්තා නියෝජිතයින් සහ අපේක්ෂිකාවන් සමඟ බදුල්ල, ගාල්ල, යාපනය, කුරුණෑගල සහ පුත්තලම යන ප්‍රදේශවල අප පැවැත්වූ කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගී වූ කාන්තා නියෝජිතවරියන්ට අපගේ විශේෂ ස්තුතිය හිමි වේ. සියයට 25 කෝටා ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූ ආකාරය අවබෝධ කර ගැනීමට ඔවුන්ගේ තීක්ෂ්ණ නිරීක්ෂණ සහ අත්දැකීම් අපට උපකාරී විය. එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ එහි අනාගත විභවය පිළිබඳව ඔවුන් එදා සහ අද සිතූ දේ නිර්ලෝභීව හා අවංකව ප්‍රකාශ කිරීම ගැන අපි ඔවුන් සැමට ස්තූතිවන්ත වෙමු.

**මහාචාර්ය එස්.ඒ. ප්‍රභා එම්.මනුරත්න**
**හරීන්ද්‍ර බී දසනායක**
**ආචාර්ය රජ්නි ගමගේ**
**කනකා අබේගුණවර්ධන**

2024ජනවාරි 18

# පටුන


| | |
|---|---|
| **කෙටි යෙදුම් ලැයිස්තුව** | 1 |
| **විධායක සාරාංශය** | 2 |
| **1. හැඳින්වීම** | 4 |
| 1.1. පසුබිම | 4 |
| 1.2. කෝටාවේ අන්තර්ගතය සහ ආසන වෙන් කිරීම | 5 |
| 1.3. න්‍යායික රාමුව | 6 |
| 1.4. පර්යේෂණ සැලසුම සහ දත්ත රැස් කිරීම | 7 |
| **2. දත්ත විශ්ලේෂණය** | 9 |
| 2.1. ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමේ අදියර | 9 |
| 2.1.1. විවාදයට කාන්තා කණ්ඩායම්වල මැදිහත්වීම | 9 |
| 2.1.2. ව්‍යවස්ථා සම්පාදයකයන් සහ නිලධාරීන් | 12 |
| 2.2. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අදියර | 18 |
| 2.3. පශ්චාත් මැතිවරණ අත්දැකීම් | 23 |
| 2.4. ඉදිරි අපේක්ෂා | 28 |
| **3. නිර්දේශ** | 31 |
| **4. සමාප්ති සටහන් සහ අධ්‍යයනයෙහි සීමා** | 35 |
| **5. පරිශීලන මූලාශ්‍ර** | 37 |

# කෙටි යෙදුම් ලැයිස්තුව

| | |
|---|---|
| **ACMC** | සමස්ත ලංකා මහජන කොංග්‍රසය |
| **CAFFE** | නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය |
| **CEDAW** | කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය |
| **CEPA** | දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය |
| **CMEV** | මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය |
| **CMU** | ලංකා වෙළඳ, කාර්මික සහ පොදු සේවක සංගමය |
| **CPSL** | ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය |
| **CBOs** | ප්‍රජා මූලික සංවිධාන |
| **CSOs** | සිවිල් සමාජ සංවිධාන |
| **FGDs** | ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා |
| **FPTP** | කේවල ඡන්ද ක්‍රමය |
| **ICCPR** | සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය |
| **IFES** | මැතිවරණ ක්‍රම සඳහා වන ජාත්‍යන්තර පදනම |
| **INGOs** | ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන |
| **KIIs** | ප්‍රධාන තොරතුරුදායක සම්මුඛ සාකච්ඡා |
| **LG** | පළාත් පාලන ආයතන |
| **LSSP** | ලංකා සමසමාජ පක්ෂය |
| **MMDA** | මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත |
| **MMPR** | මිශ්‍ර සාමාජික සමානුපාතික නියෝජනය |
| **MP** | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා |
| **NGOs** | රාජ්‍ය නොවන සංවිධාන |
| **PAFFREL** | නිදහස් සහ සාධාරණ මැතිවරණයන් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය |
| **PR** | සමානුපාතික නියෝජනය |
| **PRC** | මහජන අදහස් විමසීමේ කමිටුව |
| **SLFP** | ශ්‍රී ලංකා නිදහස් පක්ෂය |
| **SLILG** | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය |
| **SLPP** | ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ |
| **TSMs** | තාවකාලික විශේෂ පියවර |
| **UNP** | එක්සත් ජාතික පක්ෂය |
| **UPFA** | එක්සත් ජනතා නිදහස් සංධානය |
| **VAWE** | මැතිවරණයන්හි දී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය |
| **WMC** | කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය |

# විධායක සාරාංශය

කාන්තාවන් සඳහා වන සියයට 25 ක කෝටාව වර්ෂ 2016 අංක 1 දරන පළාත් පාලන (සංශෝධන) පනත මඟින් නියම කරන ලද අතර 2017 අංක 16 දරන පළාත් පාලන මැතිවරණ පනත මඟින් ක්‍රියාවට නැංවිණි. මෙම කෝටාව හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස පළාත් පාලන ආයතන තුළ කාන්තාවන්ගේ නියෝජනය සියයට 2 පමණ සිට ආසන්න වශයෙන් සියයට 23 දක්වා ඉහළ යන ලදී. මේ වන විට කෝටාව එක් වටයක් ක්‍රියාත්මක වී ඇති බැවින්, එකී කෝටාවෙහි ප්‍රතිඵල ඇගයීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින අතර, මෙම අධ්‍යනය එම අරමුණ ඉලක්ක කර ගනිමින් සකස් වූවකි. එකී ප්‍රතිඵල, එම ප්‍රතිපත්තිය සම්පාදනය වූ සංදර්භය සහ ඊට තුඩු  දුන් කතිකාව ඇසුරෙහි ස්ථානගත කිරීමට මෙම අධ්‍යයනය උත්සාහ දරයි. ඒ සඳහා, මෙම ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අදියර තුනක් ඔස්සේ ගවේෂණය කරනු ලැබේ. එනම්, මූලික ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමේ අදියර; ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අදියර; සහ පශ්චාත් මැතිවරණ අදියර වශයෙනි. එකී අදියර තුන තුළ ප්‍රධාන භූමිකා හිමි වූ පාර්ශවකාර කණ්ඩායම් තුනක් හඳුනා ගත හැකි අතර, කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින සමාජ ක්‍රියාධර කණ්ඩායම්, දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන්, සහ සියයට 25 කෝටාව මඟින් තේරී පත් වූ සභිකවරියන් මෙම කණ්ඩායම් තුනයි. සියයට විසි පහ කෝටාව පිලිබඳ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මේ කණ්ඩායම් ත්‍රිත්වය විසින් සිදු කළ බලපෑම සහ ඔවුන් සතු වූ අභිලාෂ ද මෙම අධ්‍යයනය මඟින් විමර්ශනය කරනු ලැබේ. කාන්තා නියෝජන කෝටාව පිළිබඳ නීතිය සම්පාදනයේ දී එක් එක් පාර්ශව කෙරෙන් තරගකාරී ලෙස ඉදිරිපත් වූ අභිලාෂ සහ කතිකාවන් ද කෝටාව පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී සිදු වූ විවිධාකාර දේශපාලන කේවල් කිරීම් ද  කාන්තා පළාත් පාලන සභිකවරියන් තේරී පත්වීමෙන් පසු මුහුණ දුන් ශුභදායී සහ අසුභදායී අත්දැකීම් ද අධ්‍යයනය කිරීමට උත්සාහ දැරිණි. ගුණාත්මක ක්‍රමවේදයක් අනුගමනය කළ අධ්‍යයනයක් වශයෙන්, මෙහිදී සියයට විසි පහ කෝටාව පිළිබඳ අත්දැකීම්, ආඛ්‍යාන, ආවර්ජන සහ විවිධ පැතිකඩ ඔස්සේ ප්‍රවේශ වීම අවධාරණය කරයි. දේශපාලන පක්ෂ නායකයින්, කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන්, සහ මෙම ක්‍රියාවලියට සම්බන්ධ වූ රාජ්‍ය නිලධාරීන් සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා හරහා සහ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශයන්හි සහ විවිධ වාර්ගික, ආගමික සහ පන්තිමය පසුබිම්වලට අයත් කාන්තා නායිකාවන් සමඟ සිදු කරන ලද කණ්ඩායම් සාකච්ඡා හරහා මෙම අධ්‍යනයට අවශ්‍ය දත්ත රැස් කරන ලදී.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන නිරීක්ෂණ මෙසේය:

1. පළාත් පාලනය තුළ කාන්තා නියෝජනය වැඩි කිරීමට සහභාගී වූ විවිධ පාර්ශ්වකරුවන් අතර පැවති එකම පොදු එකඟතාව බවට පත් වූයේ කාන්තාවන්ගේ සංඛ්‍යාත්මක නියෝජනය සඳහා සියයට 25ක කෝටාවක් හඳුන්වා දීම පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස, දේශපාලන පද්ධතිය තුළ මුල් බැසගත් ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානතා හෝ දේශපාලන පක්ෂ සහ පළාත් පාලන ආයතන තුළ ප්‍රජාතන්ත්‍රවාදී භාවිතාවන් අවම මට්ටමක පැවතීම හෝ ස්ත්‍රීන් කෙරෙහි සමාජයේ පොදු වශයෙන් පවතින අගතීන් ආදී පුලුල් අභියෝග ආමන්ත්‍රණය කිරීම පිණිස මෙම කෝටාව සැලසුම් කෙරී නැති බව පෙනී යයි.
2. ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳ වෙනුවෙන් කටයුතු කළ සංවිධාන දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ කාන්තා නියෝජනය වැඩි කිරීම වෙනනුවෙන් පෙනී සිට ඇත. සියයට විසි පහ කෝටාව පිළිබඳ ප්‍රතිපත්ති සන්දර්භය තුළ එක් අතකින් කෝටාව පිළිබඳ දෘෂ්ටිවාදීමය අභිලාෂ සහ අනෙක් අතට විවිධ පාර්ශවකරුවන්ගේ ප්‍රායෝගික සහ දේශපාලනික අරමුණු එකිනෙක සමඟ තරග කළ බව හඳුනා ගත හැකි විය.
3. විවිධ බලපෑම් කණ්ඩායම් විවිධ අරමුණු සහිතව සියයට විසි පහේ නියෝජනය ලබා දීමට ආධාර හෝ බාධා කිරීම් මධ්‍යයේ, මෙම කෝටාව යථාර්ථයක් බවට පත් වීමට ප්‍රධාන පුද්ගලයන් කිහිප දෙනෙකුගේ දැඩි කැපවීම  වැදගත් වූ බව පැහැදිලි විය.
4. මෙම කෝටාව දේශපාලන පක්ෂවල හෝ ප්‍රජා මූලික සංවිධානවල දිගුකාලීන අත්දැකීම් සහිත නමුත් ජනතා නියෝජනයට අවස්ථාව අහිමිව සිටි කාන්තාවන්ට සභිකවරියන් ලෙස තේරී පත් වීමට ඉඩ සලසන නව දොරටුවක් ලෙස ක්‍රියාත්මක් වූ බව පැහැදිලිය.
5. රාජ්‍ය සහ සිවිල් සමාජ සංවිධාන මගින් පුහුණුව ලැබූ සභිකවරියන් එකී පුහුණුවීම් මගින් සිය කුසලතා වර්ධනය වූ බව සහතික කළ අතර, පළාත් පාලන ආයතනයන්හි පුරුෂ සහ කාන්තා සාමාජිකයින් අතර පවතින බල අසමතුලිතතාව පියවීම පිණිස ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීකරණය, ප්‍රජාතන්ත්‍රකරණය සහ සහ අන්තර්කරණය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩි අවස්ථා කාන්තාවන් සහ පුරුෂයන් යන දෙපාර්ශවයට ම අවශ්‍ය බවට ඉල්ලා සිටින ලදී.

6. කාන්තා අපේක්ෂිකාවන් මෙන්ම සභිකවරියන් ද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පාදක ප්‍රචණ්ඩත්වයට සහ බිය ගැන්වීම්වලට මුහුණ දී ඇති අතර එයින් පෙන්නුම් කරන්නේ ඔවුන් ආරක්ෂා කිරීම සඳහා පවතින නීතිමය රාමු සහ මාධ්‍ය භාවිතයන් ප්‍රමාණවත් නොවන බවයි.
7. තේරී පත් වූ පසු සභිකවරියන්ට, වැඩ කිරීමට සිදු වූයේ පුරුෂ මන්ත්‍රීවරුන්ට වැඩි පහසුකම් සැලසීම සඳහා විධිමත් සහ අවිධිමත් ව්‍යුහයන් ලෙස නිර්මාණය වී තිබූ, කිසිසේත් අන්තර්ග්‍රාහී නොවූ පළාත් පාලන පද්ධතියක් තුළ ය.
8. දෘඪ සහ හිංසාකාරී ව්‍යුහයන් සමඟ කටයුතු කිරීම සඳහා සභිකවරියන් විසින් උපාය මාර්ග සකස් කරගෙන තිබූ බව පෙනෙන අතර, විවිධ පක්ෂ හා කණ්ඩායම් සමග සන්ධාන ඇති කර ගැනීම වැනි උපාය මාර්ග මෙහිදී කැපී පෙනේ.

**මෙම වාර්තාව මගින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ වන්නේ:**

1. සියයට 25 ක කෝටාව සම්පූර්ණ වශයෙන්ම සාක්ෂාත් කරගැනීම උදෙසා අවශ්‍යවන්නා වූ පියවර ගැනීම මඟින් පළාත් පාලන ආයතන තුළ කාන්තාවන්ගේ සංඛ්‍යාත්මක නියෝජනය අවම වශයෙන් දැනට නියම කර ඇති සියයට 25ක හෝ පවතින බවට සහතික කිරීම.
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී සහභාගීත්වය, බල ව්‍යුහයන්, ක්‍රියාවලීන් සහ කාන්තාවන් ප්‍රවර්ධනය සහතික කිරීම සඳහා දේශපාලන පක්ෂ තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම.
3. කාන්තා කෝටාවක් සම්මත කොට ක්‍රියාවට නැංවීමේ දී, එකිනෙක හා තරගකාරී වීම වෙනුවට, දේශපාලන පක්ෂ අතර එකගතා ප්‍රවර්ධනය දිරිමත් කිරීම.
4. කෝටාවක් වැනි ප්‍රතිජනනාත්මක ප්‍රතිපත්තියක් ඉල්ලීමක සිට ප්‍රතිපත්තියක් දක්වා පරිවර්තනය කිරීමේ සංකීර්ණත්වය පිළිබඳ අවබෝධයක් ඒවායේ යෝජකයින් අතර ඇති බව සහතික කිරීම සහ ඔවුන් අතර සම්මුතිය ප්‍රවර්ධනය දිරිමත් කිරීම මඟින්, එවන් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිකයක් දේශපාලන පක්ෂවල හෝ ඒවායේ ප්‍රධාන පුද්ගලයන්ගේ අභිලාෂයන්ට සීමා නොවන බව සහතික කිරීම.
5. සියයට 25 ක කෝටාව පළාත් සභා මට්ටමින් සපුරාලීම සඳහා 2017 අංක 17 දරන පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත යටතේ මැතිවරණ පැවැත්වීම සිදු වන බවට සහතික කර ගත යුතු අතර පාර්ලිමේන්තු මට්ටම තුළ කාන්තාවන් සඳහා අවම වශයෙන් සියයට 25 ක කෝටාවක් හඳුන්වා දීම.
6. වර්තමානයේ දී කාන්තා මන්ත්‍රීවරුන් සඳහා ලබා දෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදිතා පුහුණුව මෙන්ම නිපුණතා ඉලක්ක කරගත් පුහුණුව පිරිමි මන්ත්‍රීවරුන්ට ද ලබා දීම.
7. අන්තර්කරණ සම්මතයන් (අවස්ථා සහ සම්පත් සඳහා සමාන ප්‍රවේශයක් ලබා දීම) ශක්තිමත් කිරීම සහ දේශපාලන තේමා පිළිබඳව වාර්තා කිරීමේදී මාධ්‍ය තුළ (සමාජ මාධ්‍ය ඇතුළුව) පවතින භාවිතයන් වඩාත් අන්තර්ග්‍රාහී බවට පත්කිරීම මෙන් ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට සහ කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම සිදු කරන අපරාධකරුවන්ට එරෙහිව සාර්ථක ලෙස ක්‍රියාත්මක වන,ශක්තිමත් සහ ප්‍රවේශ විය හැකි නීතිමය රාමු සකස් කිරීම.
8. පළාත් පාලන පද්ධතිය වඩාත් සහභාගිත්ව, අන්තර්ග්‍රාහී සහ ප්‍රජාතන්ත්‍රවාදී කිරීම උදෙසා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම
9. සභිකවරියන්ට වඩාත් සඵලදායි ලෙස ක්‍රියා කිරීමට හැකි වන පරිදි දේශපාලන පක්ෂ අතර කාන්තාවන්ගේ සන්ධාන සහ එකගතාවන් ප්‍රවර්ධනය කිරීම.

පළාත් පාලන ආයතනයන්හි කාන්තාවන් සඳහා පවතින සියයට 25 ක කෝටාව, මේ වන විට ක්‍රියාත්මක කර ඇත්තේ ඉතා අස්ථාවර සහ සමාජීය වශයෙන් ධ්‍රැවීකරණය වන තත්වයක් තුළ ය. එය ද, එක් වාරයක් සඳහා පමණි. කාලයාගේ ඇවෑමෙන්, එහි බලපෑම සහ වෙනස්කම් තක්සේරු කිරීම සඳහා අඛණ්ඩ අධ්‍යයන සිදු කිරීම අවශ්‍ය වේ.

1

# හැඳින්වීම

2018 පළාත් පාලන මැතිවරණය සඳහා කාන්තා අපේක්ෂිකාවන් 17,500[1] කට අධික සංඛ්‍යාවක් ඉදිරිපත් කරන ලෙසට ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවලට නියම කෙරුණේ, එම කාර්යය සඳහා දේශපාලන පක්ෂ එතරම් සූදානම්ව නොතිබූ තත්ත්වයක දී ය. එම මැතිවරණයෙන් කාන්තාවන් 2000කට ආසන්න පිරිසක් සභිකවරියන් ලෙස පත් විය. මෙම කෝටාව මගින් මැතිවරණයට පසු මෙරට පළාත් පාලන ආයතනවල සිටින කාන්තාවන් සියයට 2 ක සිට සියයට 22 දක්වා වැඩි කරන ලදී. කෝටා ක්‍රම පිළිබඳ සාහිත්‍යයේ තාවකාලික විශේෂ පියවර (TSMs)[2] ලෙස හඳුන්වන මෙම ක්‍රියාවලිය කාන්තා කණ්ඩායම් සහ වෙනත් විවිධ ක්‍රියාකාරීන් මහත් වූ පරිශ්‍රමයකින් ජයගත් සටනක ප්‍රතිඵලයකි. කාන්තාවන්ගේ කෝටාව සකස් කර සම්මත කරගත් ආකාරය, වර්තමානය වන විට අදාළ පාර්ශ්වකරුවන් විසින් එය දකින ආකාරය සහ ශ්‍රී ලංකාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ සිටින කාන්තාවන්ගේ ප්‍රමාණය වැඩි කිරීම සඳහා ප්‍රතිජනනාත්මක ප්‍රතිපත්ති හඳුන්වාදීම මගින් ඉගෙන ගත හැකි පාඩම් මොනවාද යන්න පිළිබඳව මෙම අධ්‍යයනය අවධානය යොමු කරයි. එමගින් දේශපාලන පක්ෂ නායකයින්ගේ, කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන්ගේ, ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වූ රාජ්‍ය නිලධාරීන්ගේ සහ කෝටාව හේතුවෙන් පළාත් පාලන ආයතනවල ආසන හිමිකර ගත් කාන්තාවන්ගේ අත්දැකීම් විමර්ශනය කරනු ලැබේ.

## 1.1. පසුබිම

සෞඛ්‍ය සහ අධ්‍යාපනය වැනි ක්ෂේත්‍රවල කාන්තා නියෝජනය ඉහළ සමාජ දර්ශකයක පැවතිය ද, ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනයේ මට්ටම ලෝකයේ පහළම මට්ටම් අතර පවතී (Kamdar, Bjarnegård, Håkansson & Zetterberg, p. 42) වර්ෂ 2018 පළාත් පාලන මැතිවරණයට පෙර, පළාත් පාලන මට්ටමේ දී, තේරී පත් වූ සභිකයින්ගෙන් සියයට 1.9 ක් පමණක් කාන්තාවන් වූ අතර, ශ්‍රී ලංකාව යනු කාන්තාවන් සඳහා දේශපාලන කෝටාවක් හඳුන්වා දුන් ආසියාවේ අවසන් රටවලින් එකකි (විජේයරාසා, 2020, පි.12).

කෝටා ක්‍රම මගින් ලෝකයේ විවිධ රටවල ක්‍රියාකාරී දේශපාලනයේ නියැලීමට කාන්තාවන්ට පැවති බාධාවන්ට අභියෝග කර ඇත. ඩෲඩ් ඩැලරප් විසින් පෙන්වා දෙන පරිදි, "කෝටා හඳුන්වාදීම මගින් කාන්තා නියෝජනයේ මට්ටම පිළිබඳ පෙර පැවති න්‍යායන්ට අභියෝග කරයි: වඩාත්ම කාර්මික හා ධනවත් රටවල දේශපාලනය තුළ කාන්තා නියෝජනය ඉහළින්ම පවතී යන න්‍යාය තවදුරටත් වලංගු නොවේ" (2021, පි. 17). පසුගිය දශක දෙක තුළ ඉහළ ආදායම් ලබන ආර්ථිකයන්හි පමණක් නොව, අඩු ආදායම්ලාභී රටවල ද තීරණ ගැනීමේදී කාන්තා සහභාගිත්වය සහතික කිරීම උදෙසා ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණ දක්නට තිබේ. එහෙත්, තවමත් එකී ප්‍රගතිය නියත හෝ රේඛීය නොවේ. දැනට, ජාතික ව්‍යවස්ථාදායකයක සියයට 61ක් වන ඉහළම කාන්තා සහභාගීත්වය රුවන්ඩාවෙහි දක්නට ලැබේ (IPU, 2023). රටවල් 120 කට අධික සංඛ්‍යාවක් විසින් ජාතික හෝ උප-ජාතික සභාවල මහජන නියෝජිතයන් ලෙස තේරී පත් වීමට කාන්තාවන් සඳහා යම් ආකාරයක කෝටා ක්‍රමයක් සකස් කර ඇත (IDEA, 2023).

ශ්‍රී ලංකාවේ ජාතික නීති රාමු, ජාත්‍යන්තර කැපවීම් සහ 2030 තිරසාර සංවර්ධන ඉලක්ක යන සෑම ප්‍රතිපත්තියක් මඟින් ම පාලන ව්‍යුහයන් තුළ කාන්තාවන්ගේ නියෝජනය ඉහළ නැංවීමේ ප්‍රබල අවශ්‍යතාවයක් මතුකරයි. ජාතික ව්‍යවස්ථාදායකය/පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන තුල කාන්තා සහභාගිත්වය ඉහළ නැංවීම මීට ඇතුළත් වේ. නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාව විසින් 1980 දී සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර

[1] https://www.opengovpartnership.org/members/sri-lanka/commitments/LK0015/#_edn199; Sri Lanka vote: New law sees more women standing: https://www.aljazeera.com/news/2018/2/10/sri-lanka-vote-new-law-sees-more-women-standing.

[2] තාවකාලික විශේෂ පියවර (TSMs) යනු ආර්ථික, සමාජීය, සහ දේශපාලන ක්ෂේත්‍රයන්හි පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස්කම් අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම සහ සම්පත් වෙන් කිරීම වෙනුවෙන් වන ප්‍රගතිගාමී සහනශීලී ක්‍රියාමාර්ග වේ.

සම්මුතිය (ICCPR) අනුමත කරන ලදී. එම සම්මුතියෙහි 25 වැනි ව්‍යවස්ථාව "මහජන කටයුතු සිදු කිරීමේ කාර්යය සඳහා සහභාගී වීමට" සහ "සර්වජන හා සමාන ඡන්ද බලයෙන් සහ ඡන්දදායකයින්ගේ නිදහස් අදහස් ප්‍රකාශනය සහතික කරන්නා වූ රහස් ඡන්ද පැවැත්විය යුතු අතර, නියමිත කාලයන්හි පැවැත්වෙන මැතිවරණයන්හී දී ඡන්දය ප්‍රකාශ කිරීමට සහ තේරී පත්වීමට"සියලුම පුරවැසියන් සතු අයිතිවාසිකම් සහතික කරයි. ඡන්දය ප්‍රකාශ කිරීමේ සහ පොදු ජීවිතයට සහභාගී වීමේ අයිතීන් ක්‍රියාත්මක කිරීමේදී ලිංගිකත්වය පදනම් කරගත් කිසිදු වෙනස් කොට සැලකීමක් සිදු කිරීමට යටතේ අවසර නැත (Democracy Reporting International, 2021).

තවද, 1981 දී, ශ්‍රී ලංකාව විසින් කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය (CEDAW) අනුමත කරන ලදී. එමගින් කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම අවසන් කිරීම සඳහා සියලුම සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා සාමාජික රටවලට ධනාත්මක වගකීමක් පවරනු ලැබේ. එහි 4 වන ව්‍යවස්ථාව මගින් ස්ත්‍රීන් හා පුරුෂයන් අතර තථ්‍ය සමානාත්මතාවය සහතික කිරීමේ අරමුණින් විශේෂ තාවකාලික පියවරයන් අනුගමනය කිරීම ප්‍රවර්ධනය කරනු ලැබේ. එසේම, ශ්‍රී ලංකාව විසින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇත. ඒවායේ පස් වන ඉලක්කය මගින් "දේශපාලන, ආර්ථික සහ පොදු ජීවිතයේ තීරණ ගැනීමේ සෑම තරාතිරමකම කාන්තාවන්ගේ පූර්ණ සහ සඵලදායී සහභාගීත්වය සහ නායකත්වය සඳහා සමාන අවස්ථා සහතික කිරීම" අරමුණු කරයි. මේ අනුව ප්‍රගතිය සඳහා වන මිණුම් ලකුණක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අනුගමනය කරන ලද එක් දර්ශකයක් වන්නේ ජාතික සහ පළාත් පාලන ආයතනවල කාන්තාවන්ට හිමි වී ඇති ආසනවල අනුපාතයයි (Democracy Reporting International, 2021).

තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ කාන්තාවන්ගේ ඉහළ සහභාගිත්වයක් ප්‍රවර්ධනය කිරීම සඳහා සිදු කරන ලද ප්‍රතිජනනාත්මක ක්‍රියාමාර්ග පිළිබඳව දශක ගනනාවක් තිස්සේ පැවති කේවල්කිරීම්වලින් පසුව, ශ්‍රී ලංකාව ද පියවර දෙකක ක්‍රියාවලියක් යටතේ කාන්තාවන් සඳහා "ඉතා සංකීර්ණ සහ මඳ වශයෙන් තේරුම් ගත්" (විජයරාසා, 2020) කෝටා ක්‍රමයක් ස්ථාපිත කළේය. 2016 සහ 2017 පුරා සිදු වූ ව්‍යවස්ථාදායක වෙනස්කම් මගින් (i) 2016 දී කාන්තාවන් සඳහා සියයට 25 ක අනිවාර්යයෙන් වෙන් කළ ආසන කෝටාවකින්, සහ (ii) කේවල ක්‍රමය (FPTP) සහ සමානුපාතික නියෝජනය (PR) යන ද්විත්වයටම අදාළ කොට්ඨාශ ලැයිස්තු මගින් කාන්තාවන් නම් කිරීමට දේශපාලන පක්ෂවලට ලබා දුන් උපදෙස් වලින් සමන්විත ද්විපාර්ශ්වික කෝටාවක්, 2017 මැතිවරණ රෙගුලාසි මගින් හඳුන්වා දෙන ලදී. මැතිවරණ ක්‍රමයට අදාළ මෙම ප්‍රතිසංස්කරණ දෙකට තුඩු දුන් සාකච්ඡාවල, සහ ඉන් පෙර සිද වූ ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස පළාත් පාලන ආයතනවල නියෝජිත සංඛ්‍යාව සියයට 35 ට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. වර්ෂ 2018 පෙබරවාරියේ පැවති පළාත් පාලන මැතිවරණය මගින් පළාත් පාලන මට්ටමින් මෙම ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම ආරම්භ විය.

## 1.2. කෝටාවේ අන්තර්ගතය සහ කෝටාවට අනුව ආසන වෙන් කිරීම ↗

2017 අංක 16 දරන පළාත් පාලන ආයතන (සංශෝධන) පනත මගින් කාන්තා කෝටාව හඳුන්වා දෙන ලදී. එම පනත මඟින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 262 : 27F. (1) වගන්තියට පහත සංශෝධනය හඳුන්වා දී තිබේ: "මෙම ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, එක් එක් පළාත් පාලන ආයතනයේ සම්පූර්ණ සභිකයන්ගෙන් සියයට විසිපහකට නොඅඩු වූ ප්‍රමාණයක් සභිකවරියන් විය යුතු ය."

ඉහත සඳහන් මග පෙන්වීමට අනුව දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් විසින් අපේක්ෂක ලැයිස්තු දෙකක් සකස් කළ යුතු වේ: එකක් කාන්තාවන් සඳහා සියයට 10 ක අවශ්‍යතාවයක් සහිතව කොට්ඨාශ මට්ටමින් තරඟ කරන අය සඳහා වන අතර තවත් එකක් කාන්තාවන් සඳහා සියයට 50 ක අවශ්‍යතාවයක් සහිත අතිරේක පුද්ගලයින්ගේ ලැයිස්තුව ලෙස හැඳින්වේ. මැතිවරණ දිනයේ දී, ඡන්දදායකයින්ට තමන් තෝරන දේශපාලන පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය ප්‍රකාශ කළ හැකි අතර, මෙහිදී අපේක්ෂකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමක් සිදු නොවේ. ඡන්ද කොට්ඨාශයක දී, පක්ෂ හා කණ්ඩායම් ලබාගන්නා ඡන්ද සංඛ්‍යාව අනුව ජය ගන්නා පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් අපේක්ෂකයන් තේරී පත්වේ.

ඒ ඒ පළාත් පාලන ආයතන සඳහා ලබා ගෙන ඇති මුළු ඡන්ද සංඛ්‍යාව සභික සංඛ්‍යාවෙන් බෙදීම මගින් එක් එක් පක්ෂයට හෝ කණ්ඩායමකට හිමි වන සභික සංඛ්‍යාව තීරණය වේ. යම් පක්ෂයක් විසින් සභික සංඛ්‍යාවට වඩා

අඩු කොට්ඨාශ ප්‍රමාණයක ජය ලබා ගෙන ඇත්නම්, ඔවුන්ට පරාජිත අපේක්ෂකයන්ගෙන් හෝ අතිරේක පුද්ගල ලැයිස්තුවෙන් අමතර සාමාජිකයින් තෝරා ගත හැක. එහි දී සියයට 25 කාන්තා කෝටාව සපුරාලීම සඳහා, මැතිවරණ කොමසාරිස්වරයා විසින් කොට්ඨාශ මට්ටමින් තේරී පත් වූ කාන්තාවන් සංඛ්‍යාව සලකා බලයි.

යම් පක්ෂයක් හෝ කණ්ඩායමක් ප්‍රමාණවත් කාන්තා ප්‍රතිශතයක් නැතිව, තමන්ට හිමි විය යුතු ආසන සංඛ්‍යාවට වඩා වැඩි කොට්ඨාස ගණනක ජය ලබා ඇති විට, අනෙකුත් පක්ෂවල සමානුපාතික නියෝජන ආසන හරහා කාන්තා නියෝජනය සාක්ෂාත් කරගනු ලැබේ. සියයට 20 ට අඩු ඡන්ද ප්‍රතිශතයක් ලබා ගෙන ඇති හෝ සභිකයන් තිදෙනෙකුට වඩා අඩු ප්‍රමාණයකට හිමිකම් ඇති පක්ෂ, අතිරේක පුද්ගල ලැයිස්තුවෙන් කාන්තාවන් පත්කිරීමෙන් නිදහස් වේ.

## 1.3. න්‍යායික රාමුව ↗

කෝටා යනු එහි පුළුල් අර්ථයෙන් සැලකූ විට අඩු නියෝජනයක් සහිත විවිධ ක්ෂේත්‍රයන් ආමන්ත්‍රණය කිරීමේ මෙවලමක් ලෙස හඳුනාගනු ලැබේ (Sawer, 2000). එම කෝටාවන් නිරන්තරයෙන් හඳුන්වා දෙනු ලබන්නේ (i) පුරුෂයන් හා සමාන සංඛ්‍යාවකින් සහභාගී වීමට කාන්තාවන්ට ඇති අයිතිය ආමන්ත්‍රණය කිරීම සඳහා; (ii) සංකේතාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට, එනම් කණ්ඩායමක් ලෙස කාන්තාවන්ගේ තත්ත්වය සහ ඔවුන්ගේ අභිලාෂයන් ඉදිරියට ගෙන යාම සඳහා; (iii) දේශපාලනය තුළ “කාන්තාවන්ගේ ඉදිරි අභිප්‍රායන්” ප්‍රවර්ධනය කිරීම සඳහා, එනම් කාන්තාවන්ගේ අවශ්‍යතා නියෝජනය වීම සහතික කිරීම සඳහා; සහ (iv) පරමාදර්ශී චරිත හඳුන්වාදීම මගින්, අනාගතයේ දී දේශපාලනය තුළ අඛණ්ඩව සහභාගී වීමට හැකියාව ඇති දක්ෂ කාන්තාවන්ගේ සංචිත වර්ධනය වැනි අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහායි. එහෙත්, කෝටාවලින් පමණක් නියෝජනය තහවුරු කිරීමෙන් මෙම බහුවිධ අපෙක්ෂාවන් සාක්ෂාත් කර ගත හැකි බව සහතික කළ නොහැකිය (Bari, 2005; Bird, 2004; Childs & Krook, 2006).

කෝටා ක්‍රමය පිළිබඳ බොහෝ සංවාදය බොහෝ දුරට එහි සංඛ්‍යාත්මක ගුණය මත රඳා පවතින බව ඩැල්රප් (2021) පෙන්වා දෙයි. කෝටා ක්‍රමය පිළිබඳ සමකාලීන අධ්‍යයන සංඛ්‍යාත්මක නියෝජනය යන සංකල්පයෙන් ඔබ්බට ගොස් විවිධ කෝටා වර්ග සහ එම කෝටා මගින් අදාළ ව්‍යූහයේ සිදු වේ යැයි අපේක්ෂිත වෙනස්වීම් පිළිබඳව ගුණාත්මක අධ්‍යයනයක් කිරීමේ අවශ්‍යතාවය වඩා පැහැදිලිව මතු කරන බවද ඩලෙරප් විසින් අවධාරණය කරනු ලබයි. (Dahlerup, පි. 5). සංඛ්‍යාත්මක නියෝජනය සඳහා වන තර්කය බල සම්පන්න වුවත්, එමගින් සමානුපාතික කාන්තා නියෝජනයකට මග පෑදුවත්, කෝටා ක්‍රමයක වටිනාකම මේ කරුණු ඇසුරින් පමණක් අධ්‍යයනය කිරීම, හැමවිටම ප්‍රමාණවත් නොවේ.  එයට හේතුව, ඩලෙරප් විසින් සාකච්ඡා කරන ලද පරිදි, සංඛ්‍යාත්මක නියෝජනය අධ්‍යයනය කිරීම යම් කෝටාවක් හඳුන්වා දී ක්‍රියාත්මක වන විශාල සමාජ-සංස්කෘතික හා දේශපාලන සන්දර්භය පසුබිමෙහි තබා සිදු විය යුතු වීමයි (පිටුව 11).

ශ්‍රී ලංකාවේ කෝටාව පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයන බොහෝ විට එය අසාර්ථක වූ ප්‍රතිපත්තියක් ලෙස, එනම් අපේක්ෂා කළ අරමුණු සාක්ෂාත් කර නොගත් ප්‍රතිපත්තියක් ලෙස දැකීමට නැඹුරුවක් ඇත. එවැනි සාහිත්‍යයක් මගින් කෝටාවක් අධ්‍යනයේදී, පවතින ප්‍රතිපත්ති සන්දර්භය සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සැලකිල්ලට නොගනී. කෝටා ක්‍රමය පිළිබඳ වඩාත් ගුණාත්මක විශ්ලේෂණයක් සඳහා, කෝටා ක්‍රමය ක්‍රියාත්මක කළ මැතිවරණ ප්‍රතිසංස්කරණය දෙස දේශපාලන පක්ෂවල තරඟකාරී අවශ්‍යතාවලට යටත්ව, කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම් විසින් තේරුම් ගෙන ප්‍රකාශ කළ ආකාරය සහ විවිධ දේශපාලන පක්ෂ සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් කෝටාව සම්මත කරගත් ආකාරය පිළිබඳව ගැඹුරින් විමසා බැලිය යුතුය.

එසේ හෙයින්, කෝටාව ක්‍රියාවට නැංවීමේදී (සැබෑ ප්‍රතිපත්තියේ දී මෙන්ම, ඔවුන් ඒ ගැන කතා කළ ආකාරය ද) ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් සකස් කරනු ලබන විශේෂිත ඉලක්ක කවරේද යන්න සහ කෝටාව සැබවින් ම කෙටුම්පත් කර ක්‍රියාත්මක කළ ආකාරයෙන් මෙම මුල් ඉලක්ක සම්මුතියකට ලක් වූයේ කෙසේද යන්න පිළිබඳව මෙම අධ්‍යයනය මගින් විමසන්නේය. කෝටාවෙහි තාවකාලික ස්වභාවය එහි ඉලක්කයෙහි ස්වරූපයට කෙතරම් දුරට පරිවර්තනය වී ඇත්ද යන්න අපි විමසා බලමු: එය ක්‍රියාමාර්ග සඳහා වූ බීජ වේදිකාව (ඩලෙරප්, පි. 26) මගින් පූර්වයෙන් හඳුනාගත් ආකාරයට තීරණාත්මක කාන්තා නියෝජිත සමූහයක් ගොඩනැගීමද, නැතහොත් එවකට පැවති රෙජීමයේ යහපාලනය පිළිබඳ වාග්මාලාව අනුකූලව වඩාත් 'ප්‍රජාතන්ත්‍රවාදී රටක්' ලෙස පෙනී සිටීමද, නැතහොත් වෙනත් සුදුසු අවශ්‍යතාවලින් ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත පෙළඹවීමක් සිදු කර තිබුණි ද යන්න අපි විමසා බලමු. වෙනත් වචන වලින් කිවහොත්,

මෙම ප්‍රතිපත්තිය වටා ඇති චින්තනය පෙන්වා දෙන්නේ කුමක්ද, සහ ප්‍රාදේශීය මට්ටමින් කාන්තා නියෝජනය කඩිනම් කිරීමේ මෙවලමක් ලෙස එය කොතරම් දුරට සාකච්ඡා වී ඇත් ද යන්න විමසීම මෙහි අරමුණයි.

ශ්‍රී ලංකාවේ කාන්තා නියෝජනය පිළිබඳ විශාල සාහිත්‍යය මගින් ප්‍රධාන ප්‍රවණතා කිහිපයක් පෙන්වා දෙයි. 2016 ට පෙර සිදු කරන ලද අධ්‍යයනයන් මගින් දේශපාලන පක්ෂ ක්‍රමයේ පවතින දුර්වලතා ඉස්මතු කරන අතරම, තේරී පත් වන සභිකයින් ලෙස කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය දැඩි ලෙස ප්‍රකාශ කරනු ලැබේ. 2016/17 දී පමණ, කාන්තා කෝටාව හඳුන්වා දීමත් සමඟ, කාන්තා නියෝජනය පිළිබඳව වූ විවාදය, දේශපාලන පක්ෂ, ස්ථාපිත පද්ධති, කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන් සහ මාධ්‍ය අවකාශය අතර මතු වූ මතභේද මතභේද ඉස්මතු කිරීමේ පැත්තට තල්ලු වූ බවක් පෙනේ. දැන් ආපසු හැරී බලන විට, මේ වෙනස් වීම් වලට හේතුව, දැනුම, අවබෝධය සහ අත්දැකීම් මත පදනම්ව, කෝටාවෙහි යෝජකයින් ප්‍රතිචාර දැක්වූ ආකාරය බවට නිගමනය කළ හැක. සමහර අධ්‍යයනයන් මගින් කෝටාව ක්‍රියාවට නැංවීමට එරෙහිව ප්‍රතිරෝධය දැක්වූයේ කෙසේද සහ එහි බලපෑම සමනය කළ ආකාරය විමර්ශනය කරන අතර (පීරිස් සහ ලේකම්වසම්, 2021), අපගේ අධ්‍යයනය තවදුරටත් තර්ක කරන්නේ, අවසාන ප්‍රතිඵලය තීරණය කිරීමේදී ප්‍රභූ පිරිසගේ මැදහත්වීම හා ඔවුන් අතර තරගකාරිත්වය ප්‍රධාන භූමිකාවක් ඉටු කළ බවයි. කෝටාවෙහි සඵලතාවය තක්සේරු කළ යුත්තේ මෙම මැදහත්වීම් වල ප්‍රතිඵලයට අනුව බැවින්, මෙහි දී ඒ කෙරෙහි අවධානය යොමු කෙරෙයි.

## 1.4. පර්යේෂණ සැලැස්ම සහ දත්ත රැස් කිරීම ↗

මෙම අධ්‍යයනයේ දී, මූලික ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමේ අදියර, ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අදියර සහ පශ්චාත් මැතිවරණ අදියර යන අදියර තුනකින් ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ගවේෂණය කිරීමෙන් සියයට 25 කෝටාව සම්බන්ධයෙන් පවතින සන්දර්භය අවබෝධ කර ගැනීමට උත්සාහ දරනු ලැබේ. මෙම අධ්‍යයනය මූලික වශයෙන් සංවිධානය කර ඇත්තේ එම ප්‍රතිපත්තියට අදාළ මෙම අදියර තුන තුළ විවිධ පාර්ශව ලැබූ අත්දැකීම් සහ ඒ පිළිබඳ ආවර්ජනයන් වටාය. එහි දත්ත ලබා ගෙන ඇත්තේ පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් තුනක්, එනම් : කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම්, දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් සහ සියයට 25 කෝටාව හරහා තේරී පත් වූ සභිකවරියන්, සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා වලිනි. මීට අමතරව, ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වූ රාජ්‍ය නිලධාරීන් ද සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලදී.

**මෙම අධ්‍යයනය මඟින් විමසනු ලබන පර්යේෂණ ප්‍රශ්න වන්නේ:**

1. කාන්තා කෝටාවක් අවශ්‍ය බවට ඉල්ලීම් කළ පාර්ශව සහ එම ප්‍රතිපත්තිය කෙටුම්පත් කළ පාර්ශවයන්ගේ අපේක්ෂාවන් සහ අවශ්‍යතා වූයේ මොනවාද, සහ ඔවුන් විසින් එකී සම්මත වූ ප්‍රතිපත්තිය හැඩගස්වා ගත්තේ කෙසේද?
2. දේශපාලන පක්ෂ සහ ප්‍රාදේශීය සභා විසින් එම ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන ආකාරය සම්බන්ධයෙන් පැවති අභියෝග සහ දේශපාලන ක්‍රියා කවරේද?
3. කෝටාව මගින් පළාත් පාලන ආයතනයන්හි ක්‍රියාකාරීත්වය පිළිඹිබු කර හැඩගස්වා ගත්තේ කෙසේද සහ සභිකවරියන් විසින් මෙම ප්‍රතිඵල අත්වින්දේ කෙසේද?

මෙම අධ්‍යයනය සඳහා ක්‍රම තුනක් භාවිතා කරමින් දත්ත රැස්කිරීම සිදුකරන ලදී. සම්මුඛ පරීක්ෂණ සහ කණ්ඩායම් සාකච්ඡා මගින් රැස් කරගත් දත්ත ගුණාත්මකව විශ්ලේෂණය කරන ලදී. කෝටා ප්‍රතිපත්තියට අදාළව එහි උපදේශන අවධීන්හිදී, ප්‍රතිපත්තිය සම්පාදනයේ දී සහ එය ක්‍රියාත්මක කිරීමේ අංගයන්ට අදාළව පවතින ආඛ්‍යාන ඉස්මතු කරගැනීම සඳහා මෙකී ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය තීරණාත්මක බවට සැලකේ.

1) ප්‍රතිපත්තිය හඳුන්වාදීමේ සහ ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව එහි සන්දර්භය ඇසුරින් අධ්‍යයනය කිරීම සඳහා පාර්ලිමේන්තු හැන්සාඩ්, පුවත්පත්, සමාජ මාධ්‍ය සහ වෙනත් පාඨ ගතකළ දත්ත ඇතුළු මූලාශ්‍ර පාඨ පරිශීලන කෙරිණි.
2) නීති සම්පාදකයින්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නන් සහ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන් ඇතුළු සිවිල් සමාජ ක්‍රියාකාරීන් සමඟ මේ සම්මුඛ සාකච්ඡා සිදු කෙරිණි.

3) ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවන්, වාර්ගික සුළුතර කණ්ඩායම් සහ ප්‍රධාන දේශපාලන පක්ෂ මෙන්ම කුඩා පක්ෂවලට අයත් මන්ත්‍රීවරුන් නියෝජනය කරන පළාත් පාලන නියෝජිතයන් සමඟ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා, ගාල්ල, බදුල්ල, යාපනය, කුරුණෑගල සහ පුත්තලම යන ප්‍රදේශවල පැවැත්විණි.

මේ ආකාරයේ අධ්‍යයනයක් ප්‍රමාණනය කිරීම අපහසුය. එබැවින්, ප්‍රධාන පාර්ශවකරුවන් අතර සිදු වන අන්තර්ක්‍රියා අවබෝධ කර ගනිමින් ඔවුන් සාකච්ඡා කළ ආකාරය, සිතූ පැතූ ආකාරය අවබෝධ කර ගත යුතු වේ. මෙම අධ්‍යයනය සංඛ්‍යා මත යැපීම අඩු වන අතර කෝටාව ඇති වූ ආකාරය සහ එහි බලපෑම කුමක්ද යන්න පෙන්වා දෙන පුළුල් අත්දැකීම් සමුදායක් භාවිතා කරයි. ප්‍රධාන තොරතුරු සපයන්නන් තෝරාගනු ලැබුවේ දිගු කාලීනව කෝටාව ඇති කිරීම වෙනුවෙන් ඔවුන් විසින් දක්වන ලද මැදිහත්වීම සලකා බැලීමෙනි. වර්ෂ 2015-2018 කාලය තුළ කෝටාව සඳහා සහය දුන් දේශපාලන පක්ෂ නායකයන් සහ කෝටාව ඵලදායී හෝ ප්‍රායෝගික නොවන බව එකල හැඟුණු කිහිප දෙනෙකු සහ කෝටාව කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වූ රාජ්‍ය නිලධාරීහු ද තොරතුරු සපයන්නන් ලෙස සහභාගී වූහ.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අංගයක් වන්නේ හිටපු සභිකවරියන් සමඟ සිදු කරන ලද ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා වේ. කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගී වූ කාන්තාවන්ගෙන් බහුතරයක් ග්‍රාමීය ප්‍රදේශවලින් වූ අතර නාගරික ප්‍රදේශවලට අයත් කිහිප දෙනෙක්ද සම්බන්ධ වූහ. ඔවුන් සියලු දෙනාම ප්‍රධාන දේශපාලන පක්ෂ, වාර්ගික සුළු ජාතීන් නියෝජනය කරන පක්ෂ මෙන්ම සාපේක්ෂව කුඩා පක්ෂ නියෝජනය කරන අය වූහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් පළාත් පාලන මන්ත්‍රීවරුන් ලෙස කටයුතු කිරීමට පෙර, එම කාලය තුළ සහ ඉන් පසුව දේශපාලනික වශයෙන් ඉතා ක්‍රියාකාරී තැනැත්තන් වූහ. ඔවුන්ගේ හඬ සංඛ්‍යාත්මක වශයෙන් නියෝජනය කිරීමට අදහස් නොකරන නමුත්, මෙම අධ්‍යයනය මගින් කෝටාවෙහි බලපෑම තක්සේරු කිරීම සඳහා ඔවුන්ගේ අත්දැකීම් තීරණාත්මක සාධක ලෙස සලකනු ලැබේ. කෝටාව පිළිබඳ සාකච්ඡා තුළ ආධිපත්‍යය දැරීමේ නැඹුරුවක් ඇති, වඩාත් ප්‍රභූ මූලික සහ කොළඹ මූලික කරගත් හඬවලට අභියෝග කිරීමක් ඔවුන්ගේ හඬ මෙසේ මතු කිරීම තුළින් අදහස් කෙරේ. සාකච්ඡාවලදී පැවසූ දේ තහවුරු කර ගැනීමට කටයුතු කළ අතර අර්ධ-ව්‍යුහගත ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා මගින් හිටපු සභිකවරියන් විසින් සාකච්ඡාවන් හි විවිධ අවස්ථාවන් වලදී එකඟ වීම සහ එකඟ නොවීම සිදු කරන ලදී.

මීට අමතරව, ක්‍රමානුකූල මූලාශ්‍ර අධ්‍යයනයකට ලක් නොකළ නමුත් (මෙය වෙනම අධ්‍යයනයක් වනු ඇති බැවින්) ඒවා සම්මුඛ සාකච්ඡා සහ කණ්ඩායම් සාකච්ඡා හරහා රැස් කරගත් තොරතුරු තහවුරු කිරීමට සහ දත්ත තහවුරු කිරීමට භාවිතා කරන ලදී.

2

# දත්ත විශ්ලේෂණය

මෙම අධ්‍යයනය සඳහා අප විසින් අනුගමනය කරන ලද අදියර තුනක ව්‍යුහය මත පදනම්ව මෙම කොටසෙහි දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය කිරීම සිදු කරනු ලැබේ. එසේ වුවද, අදාළ සෑම අවස්ථාවකදීම, අදාළ තේමාවන් පිළිබඳ ඉදිරි දර්ශනය සහ විවරණ එක් කිරීම සඳහා අප විසින් දැඩි කාලානුක්‍රමයෙන් බැහැරව මේ සඳහා අත්දැකීම් සහ විශ්ලේෂණ ඇතුළත් කර ඇත. ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමේ අදියරී යන මාතෘකාව යටතේ ඇති කොටස විසින් ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමට අදාළ සිදුවීම් පෙළගැස්මට ප්‍රවේශ වන්නේ සියයට විසි පහේ කෝටා ප්‍රතිපත්තිය හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම කටයුතු කළ පුද්ගලයන් පිළිබඳ පුළුල් කාණ්ඩ දෙකකට අනුරූප වන කාල රාමු දෙකක් හරහා ය:

(i) දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ කෝටාව වෙනුවෙන් පෙනී සිටි කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම් සහ පුහුණුවීම් සහ උපදේශන හරහා කෝටාව සඳහා පදනම සකස් කළ අනෙකුත් සිවිල් සමාජ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන; හා

(ii) 2015/16 පමණ සිට සියයට 25 කෝටාව සම්මත කිරීමට හා ක්‍රියාත්මක කිරීමට එක්ව කටයුතු කළ දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් සහ රාජ්‍ය නිලධාරීන්.

ප්‍රතිපත්තිය 'ක්‍රියාත්මක කිරීමේ අදියර' වශයෙන් නම් කරන ලද කොටස යටතේ, ප්‍රතිපත්තිය ක්‍රියාවලි තුනක් හරහා ක්‍රියාත්මක වූ ආකාරය ගවේෂණය කරයි: පුහුණු කිරීම්, නාමයෝජනා සහ ප්‍රචාරණයේදී කාන්තා අපේක්ෂකයින් මුහුණ දුන් අභියෝග. 'පශ්චාත් මැතිවරණ අත්දැකීම්' යන මාතෘකාවෙන් යුත් ඊළඟ කොටස මගින් කාන්තා කමිටු පිහිටුවීම පිළිබඳ පළාත් පාලන සභිකවරියන්ගේ අත්දැකීම්, 'කොට්ඨාශයට' එදිරිව 'ලැයිස්තු' සාමාජිකයින් පිළිබඳ අත්දැකීම්, අපේක්ෂකයින් සහ මන්ත්‍රීවරුන් ලෙස ඔවුන්ගේ අත්දැකීම් නිර්මාණය කරන ලද විවිධ ආගමික, සමාජීය සහ සංස්කෘතික අසමානතාවයන්, සහ පක්ෂ අතර සන්ධාන පිහිටවූ සභිකවරියන් වශයෙන් ඔවුන්ගේ අත්දැකීම් ගවේෂණය කරයි. අවසාන කොටසේදී, ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඇති විය හැකි අනාගත තත්ත්වයන් මෙන්ම එය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම නිරූපණය කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා වලදී මතු වූ අදාළ මාතෘකා කිහිපයක් පිළිබඳව සාකච්ඡා කෙරේ.

## 2.1. ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමේ අදියර ↗

කාන්තා නියෝජිතයින් සඳහා වන සියයට 25 ක කෝටාව යථාර්ථයක් බවට පත් කිරීමට ප්‍රධාන පුද්ගල කාණ්ඩ දෙකක් දායක වූහ: පාලන තන්ත්‍රය තුළ කාන්තා නියෝජනය ඉහළ නැංවීම ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කළ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිකයින් සහ සිවිල් සමාජ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන සහ කෝටාව කෙටුම්පත් කිරීමේ සහ සාකච්ඡා කිරීමේ ක්‍රියාවලියට හා 2015 දී පමණ එය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වූ දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන්. කෝටාව පිළිබඳ ඔවුන්ගේ ආඛ්‍යාන, අත්දැකීම් සහ අතීත ආවර්ජනයන් වාර්තා කර විශ්ලේෂණය කෙරිණි. කෝටාව පරමාදර්ශී ඉල්ලීමක සිට එහි කෙටුම්පත් කිරීමේ අදියරේදී කේවල් කිරීම් සමුදායක් හරහා යථාර්ථයක් වීමේ දී සිදු වූ තරග කිරීම් සහ ගැටුම් විමසා බැලිණි.

### 2.1.1. විවාදය සම්බන්ධයෙන් කාන්තා කණ්ඩායම්වල මැදිහත්වීම ↗

මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡාවට ලක් කළ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන් විසින් සියයට 25 ක කෝටාව පිළිබඳ චින්තනයේ මූලාරම්භය පිළිබඳව විවිධ අදහස් පළ කරන ලදී. කෝටාව ගෙන ඒම සඳහා ඔවුන් විසින් සිදු කරන ලද ඉහළ සාන්ද්‍රිත ප්‍රයත්නයන් ඔවුන් විසින් පුළුල් කාලරාමුවක් තුළ ස්ථානගත කරන ලදී. 1970 වර්ෂයන්හි සිට ආරම්භ වෙමින්, මෙහි මුල් සන්ධිස්ථාන වූයේ 1993 කාන්තා ප්‍රඥප්තියෙහි සහ 1995 බීජිං හි පැවති කාන්තාවන් පිළිබඳ සිව්වන ලෝක සමුළුවේ ප්‍රකාශිත කාන්තාවන් සඳහා වන කෝටාවක හැකියාව දැකීමට කාන්තා කණ්ඩායම් පෙළඹවූ 1992 තරුණ කෝටාවයි. ඉන්පසුව, පොදුරාජ්‍ය මණ්ඩලීය බලපෑම සහ පංචායත් ක්‍රමය සඳහා ඉන්දියාවේ

පැවති සියයට 30 කාන්තා කෝටාව ද මෙම කණ්ඩායම්වලට අනුප්‍රාණය දෙන ලෙදී. එක් ක්‍රියාකාරිනියක වන කුමුදිනී සැමුවෙල් මහත්මිය (අධ්‍යනයට අදහස් ලබා දීමේදී තම නමින් එම අදහස් පළකරන ලෙස ඉල්ලූ) සඳහන් කළේ තමන් ප්‍රමුඛ කාන්තා ක්‍රියාකාරිනියන් විසින් ප්‍රධාන සන්ධිස්ථාන සැලසුම් කරමින් දේශපාලන පක්ෂ සමඟ අඛණ්ඩව සම්බන්ධ වන විට : "තරුණයන් සඳහා වන කෝටාවෙන් අඩක් කාන්තාවන්ට ලබා දෙන බවට අවබෝධයක් තිබුණා, නමුත් එය අවසානයේ ඒ අයුරින් සාර්ථක වුයේ නැහැ." මෙම මුල් ඉල්ලීම් ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපතිවරිය තේරී පත් වූ 1994 මැතිවරණයේදී කාන්තා නියෝජනය වැඩි කිරීමකට පරිවර්තනය වූ බව ඇය පෙන්වා දුන්නාය. කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම් විසින් පළාත් පාලන මැතිවරණ සඳහා තරුණ කෝටාව යටතේ කාන්තා අපේක්ෂකයින් ඉදිරිපත් කරන ලෙස දේශපාලන පක්ෂවලට බලපෑම් කරන ලදී (6 වන සහභාගීවන්නා, සිවිල් සමාජය). ඇය විසින් සිහිපත් කළ තවත් සන්ධිස්ථානයක් වුයේ, 1995 න් පසු, කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රියාකාරී කරුණු 12 ක් ඉදිරිපත් කළ, ශ්‍රී ලංකා කාන්තා රාජ්‍ය නොවන සංවිධාන සංසදයයි (SLWomen NGO Forum).

1998 වන විට, කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන් විසින් "සත්‍යාර්ථ ක්‍රියාමාර්ග" ගැන සාකච්ඡා කරමින් සිටියහ - "අපි 'කෝටා' යන වචනය භාවිතා කරන්නේ මන්දැයි මම නොදනිමි. විවිධ ආකාරයේ සත්‍යාර්ථ ක්‍රියාමාර්ග තිබේ...". 2001 වන විට, "වෙනසක් ඇතිකිරීමට සංඛ්‍යාත්මකව අතවශ්‍ය කණ්ඩායම" සම්බන්ධයෙන් ගෝලීය සම්මුතියක් තිබීම හේතුවෙන්, කාන්තා කණ්ඩායම් විසින් සියයට 25-30 ක නියෝජනයක් ඉල්ලා සිටියහ. කෙසේ හෝ ශ්‍රී ලංකා රජය සියයට 25 සම්බන්ධයෙන් පමණක් සැළකිල්ලක් දක්වන ලදී." මෙයින් ඇඟවෙන්නේ සියයට 25 ක සංඛ්‍යාව කාන්තා කන්ඩායම් වලින් ආරම්භ නොවූ බවයි, මන්ද ඔවුන් අවම වශයෙන් බීජිං සමුළුව තෙක් දිවෙන්නා වූ අතීතයක සිට පැමිණෙන වෙනසක් ඇතිකිරීමට සංඛ්‍යාත්මකව අතවශ්‍ය කණ්ඩායම වටා ගොඩනැගුණු කතිකාවක් පිළිබඳව කටයුතු කළ බැවිනි. එසේ වුවද, අප විසින් සම්මුඛ සාකච්ඡාවට ලක් කළ සියලුම කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිනියන් විසින් ශ්‍රී ලංකාවේ කෝටාව සඳහා වන ඉල්ලුම සැකසීමේ උත්සාහයේ හිමිකාරිත්වය පිළිබඳ පැහැදිලි අයිතිවාසිකමක් ප්‍රකාශ කළහ. (කාන්තා නියෝජනය සඳහා වන ඉල්ලීම සම්බන්ධයෙන් කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම්වල මැදිහත්වීම පිළිබඳ ඉතිහාසය සම්බන්ධයෙන් වන සවිස්තරාත්මක සාකච්ඡාවක් සඳහා කොඩිකාර, 2016 බලන්න).

කාන්තා කණ්ඩායම් විසින් නියෝජනය වැඩි කිරීමට ගත් උත්සාහයන්හි තවත් මුල්ම පිළිඹිබුවක් වුයේ ආචාර්ය නිමල්කා ප්‍රනාන්දුගේ නායකත්වයෙන් යුතු ස්වාධීන කාන්තා කණ්ඩායමක් පිහිටුවීමයි. මෙම කණ්ඩායම ස්වාධීන කණ්ඩායමක් විසින් ඉදිරිපත් කරන ලද කාන්තාවන්ගෙන් පමණක් සැඳුම්ලත් ලැයිස්තුවකින් 2002 දී කොළඹ මහ නගර සභාවට තරඟ වැදුණි. අවාසනාවකට, ඔවුන්ට කිසිදු ආසනයක් හිමි නොවීය. කාන්තාවන්ට ඡන්දය දෙන ලෙස කාන්තාවන්ගෙන් ඉල්ලා සිටීමෙන් කාන්තා නියෝජනය තහවුරු නොවන බවට අවබෝධ කර ගැනීමට කාන්තා කණ්ඩායම්වලට මෙමගින් හැකි වූ බව ආචාර්ය ප්‍රනාන්දු විසින් අප සමඟ කළ සම්මුඛ සාකච්ඡාවකදී කියා සිටියාය. මේ අනුව, මෙම කාලය ආසන්නයේ සිට කාන්තා නියෝජනය පිළිබඳ සංවාදය මැතිවරණ ප්‍රතිසංස්කරණ සඳහා වන ඉල්ලුම වෙත මාරු වේ. උදාහරණයක් ලෙස, කොඩිකාර (2009), පවසන්නේ, "2003 සිට, ශ්‍රී ලංකාවේ කාන්තාවන් වෙනුවෙන් කෝටාවක් සඳහා වන ඉල්ලීම මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට, විශේෂයෙන් පළාත් පාලන මට්ටමින්, මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ට බද්ධ කර ඇත".

## දේශපාලන පක්ෂ සමග කටයුතු කිරීම

අපගේ අධ්‍යයනයෙන් එළඹෙන ලද එක් නිගමනයක් වන්නේ, කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම් අතර කෝටාවක් ගෙන ඒමේ අභිලාෂයන් වර්ධනය වුයේ දේශපාලන පක්ෂ සමඟ ඔවුන්ට පැවති පුළුල් සම්බන්ධතාවයන් හේතුවෙන්ද වන බවයි. එක් සහභාගිවන්නෙකු විසින් පවසන පරිදි, කෝටාව "මතු වුයේ" දේශපාලන පක්ෂ (සහභාගීවන්නන් 1, සිවිල් සමාජය) සමඟ ඔවුන්ට පැවති දිගුකාලීන සබඳතා නිසාය. මෙය සාධනීය ප්‍රවණතාවක් වුවද, අවසානයේ වඩාත් උද්යෝගිමත් ක්‍රියාකාරීන් පවා වඩාත් අවිධිමත් මට්ටමින් දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කර ලබාගත හැකි දේට කෙතරම් සීමා වී ඇත්ද යන්න ද මෙමගින් පෙන්වා දෙයි. කාන්තා නියෝජනය වැඩි කිරීම සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ අතර තිබූ උනන්දුව එකල නාමික විය. පක්ෂ හා කාන්තා ක්‍රියාකාරීන් අතර මෙම සාකච්ඡා ද සමාන මට්ටමකින් නොවීය. කාන්තාවන් මැතිවරණයට ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා දේශපාලන පක්ෂ සමඟ ක්‍රියාකාරීන් විසින් සමීපව කටයුතු කරනු ලැබුවද, එම ක්‍රියාකාරීන්ගේ හඬට දේශපාලන පක්ෂ බොහෝ විට සවන් දුන්නේ නැත. නිදසුනක් වශයෙන්, 2011 පළාත් පාලන මැතිවරණයේදී, කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් නාමයෝජනා වශයෙන් සලකා

බැලීම සඳහා තරුණ කාන්තාවන්ගේ (අවුරුදු 35 ට අඩු) ලැයිස්තු දේශපාලන පක්ෂ වෙත යොමු කර ඇත. දේශපාලන පක්ෂ බොහෝ විට නාමයෝජනා වලදී “පළමු තේරීම පිරිමින්ට” ලබා දුන් බව එක් සිවිල් සමාජ සහභාගිවන්නෙක් සිහිපත් කළේය. බොහෝ විට, කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම්වලට තරුණ කෝටාව හරහා දේශපාලන පක්ෂවල නාමයෝජනා සඳහා කාන්තා ප්‍රවේශය ලබා ගත හැකි විය. මෙහිදී අමතරගැටළුවක් වූයේ නාමයෝජනා සඳහා නවකයින්ට ඉදිරිපත් වීමට ඉඩ ප්‍රස්තාව තිබුණත් කෝටාවේ පවතින වයස් බාධකය හේතුවෙන් වයස අවුරුදු 35 ට වැඩි ඉහළ පළපුරුද්දක් සහිත කාන්තාවන්ට නාම යෝජනා ලබා ගැනීමට නොහැකි බවයි. මෙයින් පෙනී යන්නේ කාන්තා කණ්ඩායම් දේශපාලන නියෝජනය සඳහා පොළඹවීම පමණක් නොව, පවතින ප්‍රතිපත්තිමය සීමාවන් සහ කාන්තාවන් නම් කිරීම සම්බන්ධයෙන් පක්ෂවල ඇති අකමැත්ත මධ්‍යයේ එම බාධක මගහරිමින් කටයුතු කිරීමේ මාර්ග සෙවීමට ද උත්සාහ කළ බවයි.

## ප්‍රකෘති තත්ත්වයට ඇති කිරීම

වාමාංශිකයින් ඇතුළු දේශපාලන පක්ෂ සමූහය හරහා වැඩි කාන්තා නියෝජනයක් වෙනුවෙන් ලැබෙන සහයෝගය අවම වීම හේතුවෙන්, කාන්තා කණ්ඩායම් වල ඔරොත්තු දීමේ හැකියාව ගොඩනගාගෙන ඇති බව එක් සහභාගිවන්නෙක් විසින් පෙන්වා දෙන ලදී. නිදසුනක් වශයෙන්, කාන්තා ක්‍රියාකාරී කමිටුව වැනි ක්‍රියාකාරී කාන්තා කණ්ඩායම්වලට, විවියන් ගුණවර්ධන වැනි කාන්තා දේශපාලනඥයින් සහභාගී වීම සම්බන්ධයෙන් ලංකා සම සමාජ පක්ෂය සහ ශ්‍රී ලංකා සම සමාජ පක්ෂය ඉතා ප්‍රතිරෝධයක් දැක්වූයේ එවැනි කණ්ඩායම් ඉතාමත් ස්ත්‍රීවාදී බව ඔවුන්ට හැඟුණු බැවිනි: “ඔවුන් හිතුවේ අපි වැඩකරන පන්ති අරගලයේ වැඩකරන පන්තිය විනාශ කරන්න යනවා කියලා.” (සහභාගිවන්නා 1, සිවිල් සමාජය). ඇය තවදුරටත් කියා සිටියේ බාලා තම්පෝගේ නායකත්වයෙන් යුත් වෘත්තීය සමිති මෙහිදී ව්‍යතිරේකයක් වන නමුත්, සමස්තයක් ලෙස, දේශපාලන පක්ෂ කාන්තා කණ්ඩායම් කෙරෙහි ප්‍රතිරෝධයක් දැක්වූ බවයි. මෙමගින් කාන්තා කණ්ඩායම් තුළ ඔවුන්ගේ අරමුණට ඔරොත්තු දීමේ හැකියාව වැඩි වූ අතර, එය කාන්තා නියෝජනය සම්බන්ධ තරඟකිරීම්වලදී ඔවුන්ට උපකාර විය.

මේ අනුව, අවම වශයෙන් දශක ගණනාවක් තිස්සේ තම අයිතිවාසිකම් වෙනුවෙන් මේ වන විටත් අරගල කරන ලද කාන්තාවන්ගේ කෝණයෙන් බලන කල්හි, කාන්තා කෝටාව යනු යහපාලන රජය බලයට පත් වූ 2015 දී පමණ මතු වූ අලුත් සංවාදයක් නොවේ.[3] මෙම දිගු හා ඵල රහිත අරගල මෙම ක්‍රියාකාරීන් කලකිරීමට පත් කර තිබූ හෙයින් 2016 දී, කෝටාවක් ලබා ගත හැකි බව පෙනෙන විට, කෝටා ක්‍රමය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් දීර්ඝ හා වඩා සූක්ෂ්ම සාකච්ඡා සඳහා ඉල්ලීම් අඩුවෙන් ඉදිරිපත් විය.

දේශීය සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ කාන්තා කණ්ඩායම් යන දෙඅංශයෙන්ම මෙම වැදගත් ක්‍රියාමාර්ග පිළිබඳව උද්යෝගිමත් ප්‍රතිචාර තිබුණද, පසුව සඳහන් කරන ලද කණ්ඩායමෙහි යම් සූදානමක් නොමැති ස්වභාවයක් ද, එසේම, කාන්තා නියෝජනය නිසිලෙස වැඩි කළ යුතු ආකාරය පිළිබඳව යම් අවස්ථාවන්හී දී බෙදුණු ස්වභාවයක් ද, සම්මුඛ සාකච්ඡා මගින් අනාවරණය විය. කෝටාව පිළිබඳ සංවාදයේ වෙනත් විකල්ප යෝජනා ඇතුළත් වූ බව මෙම අපැහැදිලි බව තුළින් පෙන්නුම් කරන්නේය. කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම්වලට අවශ්‍ය වූයේ කෙසේ හෝ කෝටාව ක්‍රියාත්මක කරවා ගැනීම පමණක් බව එකල නිසැකවම කෝටාවට සහාය දුන් අයට පවා හැඟී ගියේ ආපසු හැරී බැලීමේදී ය. එහි අවසාන හැඩය කුමක් විය යුතුද, නැතහොත් එය ක්‍රියාත්මක කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව ඔවුන් සිතා තිබුණේ නැත. තවත් කාන්තා ක්‍රියාකාරිනියක් පැවසූ පරිදි: “කාන්තා කණ්ඩායම්වලට සියයට 25 කෝටාව; එය ඇති වූයේ කෙසේද සහ ඇයි? පිළිබඳ පැහැදිලි අදහසක් නොතිබුණි. අදටත් ඔබ ඔවුන්ගෙන් කෝටාව කුමක්දැයි ඇසුවොත්, ඔවුන්ට ඒ පිළිබඳව කියන්නට හෝ තේරුම් කිරීමට නොහැකි වනු ඇති බවට මම ඔබට අභියෝග කරනවා” (සහභාගීවන්නන් 6, සිවිල් සමාජය). එසේ හෙයින්, කාන්තා කණ්ඩායම් විසින් කෝටාව පිළිබඳ අදහසට සහය දෙනු ලැබුවද, එහි අවසාන ප්‍රතිඵලය කුමක් විය යුතුද සහ එය ක්‍රියාත්මක කිරීම කෙබඳු විය යුතුද යන්න ගැන ඔවුන් සිතා නොතිබූ බවක් පෙනෙන්නට තිබුණි.

[3] යහපාලන ආණ්ඩුව යන්නෙන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ පත්වීමත් (එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් කැඩී ආ කණ්ඩායම නියෝජනය කරමින්) සමග 2015 ජනවාරියේ දී එක්සත් ජාතික පක්ෂය සහ එම කැඩී ආ කොටස එක්ව පිහිටුවා ගත් ආණ්ඩුව අදහස් වේ. එය පිහිටුවා ගැනීමෙන් ඉක්බිතිවම එජාප නායක රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා වශයෙන් පත්කරන ලදී.

උද්යෝගයෙන් වෙහෙස නොබලා වැඩ කිරීම, දිනපතා අමාත්‍යාංශයට යාම, මහජන අදහස් විමසීම් සංවිධානය කිරීම, අමාත්‍යාංශ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම, පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට සහභාගී වීම යනාදිය තුළින් කාන්තා කණ්ඩායම් කෙතරම් දුරට ක්‍රියාවලියේ නියැලී ඇත්ද යන්න නිරූපණය කළේය. ක්‍රියාකාරිකයෙක් පැවසුවේ "සියලුම සිවිල් සමාජ සංවිධාන පාහේ රට පුරා බොහෝ සාකච්ඡා පැවැත්වූවා. අපි හැමතැනම ගිහින් තියෙනවා" (සහභාගීවන්නන් 3, සිවිල් සමාජය). නමුත් අවසානයේ දී කෝටාව අසාර්ථක වූ බව ඇයට හැඟුණේ එය සකස් කිරීමේ දී ප්‍රමාණවත් සැලසුමක් සිදු කර නොති බූ බැවිණි. තරඟ කළ හැක්කේ කාටද සහ ඔවුන්ගේ සුදුසුකම් කුමක් විය යුතුද යන්න පිළිබඳව නිර්ණායක ගෙනහැර දක්වමින් ලැයිස්තු සකස් කර තිබූ ආකාරය පිළිබඳව ඇය විශේෂයෙන් සඳහන් කළාය. නිර්ණායක 30 කින් සමන්විත ලැයිස්තුවක් නිර්ණායක 5 දක්වා අඩු කර තිබූ ආකාරය සහ තමන් සහ අනෙකුත් කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන් සාකච්ඡාවලට සහභාගී වීමට සහ කෝටාව සඳහා බලපෑම් කිරීමට උත්සාහ කළත්, තමන්ව සාකච්ඡාවලින් ඉවත් කරනු ලැබූ ආකාරය ඇය විස්තර කළාය.

උදාහරණයක් ලෙස, අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙක් විසින් කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම් පිළිබඳව පහත ආකාරයට පැවසූ බව ඇය කීවාය: 'ඔය ගෑණුත් එක්ක කයිවාරු ගහ ගහ මේව කරන්න ගියොත් හොඳට හිටියි' (අපි මේ දේවල් කාන්තාවන් සමඟ කථා කරමින් සිදු කරන්නට උත්සාහ කළහොත්, මෙය සිදු නොවනු ඇත). මේ හේතුවෙන්, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට තමන්ව ප්‍රමාණවත් ලෙස සම්බන්ධ කර නොගන්නා බව ඇතැම් කාන්තා කණ්ඩායම් වලට හැඟුණි. ඉහත ක්‍රියාකාරිකයා තවදුරටත් මෙසේ පැවසීය: "පළාත් පාලන අමාත්‍යාංශය විසින් අනුග මනය කරන ලද ක්‍රියාවලියේ එක් ප්‍රධාන දෝෂයක් වන්නේ මහජන අදහස් විමසීමෙන් පසු තාක්ෂණික සාකච්ඡා නොපැවැත්වීමයි... තාක්ෂණික සාකච්ඡා පැවැත්වීමට උත්සාහ කරන විට පවා, ඒවා කාන්තා ප්‍රශ්න ලෙස හඳුන්වමින් බොහෝ වෘත්තිකයන් ඉදිරිපත් නොවීය. මේ හේතුවෙන් නිසි ක්‍රියාකාරී සැලැස්මක් නොමැති විය" (සහභාගීවන්නන් 3, සිවිල් සමාජය). මෙම සහභාගිවන්නා මෙසේ පැවසුවේය, "මෙයට දේශපාලන න්‍යාය පත්‍රයක් තිබුණා. ඔවුන් කීවේ ඔවුන්ට කෙසේ හෝ කාන්තාවන් ඇතුළත් කර ගැනීමට අවශ්‍ය බවත්," ඇය දැකීමට කැමත්තක් දැක්වූයේ වත්මන් කෝටාව "කාන්තා නියෝජනය සඳහා වන 'ආවේණික කෝටාවක්' බවට පරිවර්තනය කිරීම බවත්ය. එවැනි ප්‍රකාශයන් එක් අතකින් පෙන්නුම් කරන්නේ දේශපාලන මෙවලමක් ලෙස  සැබෑ දේශපාලන වෙනසක් ගෙන ඒමට වත්මන් කෝටාව ප්‍රමාණවත් නොවන බව ය. අනෙක් අතට පළාත් පාලන ආයතන තුළ සියයට 25ක කාන්තා නියෝජනයක් ඇති බව සහතික කිරීම හැර කෝටාව මගින් කුමන ආකාරයේ ප්‍රතිඵලයක් ළඟා කරගැනීමට බලාපොරොත්තු වූයේ ද යන්න පිළිබඳ එකගතාවයක් නොතිබූ ආකාරය ද ඔවුහු පෙන්වා දෙති.

කාන්තා කෝටාව හඳුන්වා දීමට පෙර සිවිල් සමාජ සංවිධාන සහ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ඇතුළු සංවිධාන විශාල සංඛ්‍යාවක් කාන්තා නියෝජනය සංඛ්‍යාත්මක වශයෙන් වැඩි කිරීමට සහ කාන්තා සාහිකයින්ගේ ධාරිතාව ශක්තිමත් කිරීමට සක්‍රියව සම්බන්ධ විය. වසර 2000 කාලසීමාවේදී, පළාත් පාලන අයතනවල කාන්තාවන් ආසන්න වශයෙන් සියයට දෙකක් පමණ සිටියහ. සමහර කාන්තා කණ්ඩායම් සහ ක්‍රියාකාරීන් දේශපාලන පක්ෂවල කාන්තා අංශවලට සහයෝගය දැක්වීමට වෙහෙස මහන්සි වී වැඩ කළහ. 2011 පළාත් පාලන මැතිවරණයේදී, ප්‍රධාන වශයෙන් මෙම පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් ලබන කාන්තා කණ්ඩායම් විසින් සියලුම දේශපාලන පක්ෂවලට අයත් කාන්තාවන් පුහුණු කරන ලදී. උදාහරණයක් ලෙස, "කාන්තාවන්ගේ දේශපාලන ඇකඩමිය" නම් ව්‍යාපෘතියක් සඳහ යුරෝපා සමූහයේ අරමුදල් රැස් කරන ලදී. එවැනි වර්ධනයන් තුළින් පෙන්නුම් කරන්නේ කාන්තා සිවිල් සමාජ සංවිධාන සහ ක්‍රියාකාරීන්ගේ අඛණ්ඩ උත්සාහයන් මගින් කාන්තා කෝටාවක් සඳහා වන පදනම සකස් කිරීම සහ එම කෝටාව අවසානයේ සහතික කිරීම සඳහා සබඳතා ගොඩනගා ගැනීම සිදු කළ ආකාරයයි.

## 2.1.2. ව්‍යවස්ථාදායකයන්ගේ සහ රජයේ නිලධාරීන්ගේ කාර්යභාරය ↗

ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ දේශපාලන පක්ෂ නායකයින් හා නියෝජිතයින් සහ රජයේ නිලධාරීන් යනු කෝටාව හඳුන්වා දීම සම්බන්ධයෙන් මූලික වූ දෙවන පුද්ගලයින් කණ්ඩායමයි. ඔවුන්ගෙන් ඇතැමෙක් ඒ සඳහා බලපෑම් කර කෝටාව හඳුන්වාදීම සක්‍රීයව කළහ. කාන්තා කෝටාව සම්බන්ධයෙන් මෙම කණ්ඩායම තුළ පැවති උනන්දුව සාපේක්ෂ වශයෙන් අලුත් එකක් වුවත්, ඔවුන් විසින් 2015-19 රජය සමයේදී මෙම කෝටාව හැඩගැස්වීමට සහ සම්මත කිරීමට අදාළව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදී. ඔවුන්ගේ වාද විවාද සහ කේවල් කිරීමේ ක්‍රියාවලීන් තුළින් ප්‍රතිපත්ති සන්දර්භය හැඩගැසුණු ආකාරය සහ එක් කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිනියක විසින් "අඩක් බේක් කරන ලද කේක්" එකක් ලෙස විස්තර කරන ලද කෝටාවට බලපෑම් කර ඇත්තේ කෙසේදැයි අපි මීළඟට පරීක්ෂා කරන්නෙමු.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන 2015 දී බලයට පත් වූයේ දූෂණය අවසන් කිරීමට, අන්තර්කරණය ශක්තිමත් කිරීමට සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් සඳහා පොරොන්දු වූ පුළුල් සන්ධානයක් හරහා වූ යහපාලනයේ වේදිකාවක් මතින්ය. මැතිවරණ ක්‍රියාවලිය ප්‍රතිසංස්කරණය කිරීම 2015 දී අලුතින් තේරී පත් වූ සිරිසේන ආණ්ඩුවේ ප්‍රමුඛතා ලැයිස්තුවේ ඉහළින්ම තිබූ නමුත් කාලයත් සමඟ ඒ සම්බන්ධයෙන් පැවති උද්යෝගය හීන විය. ජනාධිපති, අගමැති සහ මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට සම්බන්ධ අනෙකුත් දේශපාලන ක්‍රියාකාරීන්ගේ සහය ඇතිව මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමේ දී පැවති උද්යෝගය එක් සහභාගිවන්නෙක් විස්තර කළේ ය: "ඒ එවකට අගමැති රනිල් වික්‍රමසිංහ විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒම සඳහා මුළු පාර්ලිමේන්තුවම රැස්වීමකට අසුන් ගන්නා බවත් ඒ සඳහා මෙහෙයුම් කමිටුවක් පිහිටුවා ඇති බවත් පැවසීමට පාර්ලිමේන්තුවේ යෝජනාවක් ඉදිරිපත් කරන ලද කාලයයි." (සහභාගීවන්නා 3, ව්‍යවස්ථාදායකයා) මැතිවරණ ප්‍රතිසංස්කරණයට අදාළ ක්‍රියාවලිය කල් යද්දී සහ පළාත් පාලන මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් රජයට පැවති බලපෑම ඉහළ යද්දී, මෙම උද්යෝගය හීන විය.

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ එවකට ක්‍රියාකාරීව සිටි නිලධාරීන් කිහිප දෙනෙකු විසින්ම කාන්තා කෝටාව ක්‍රියාත්මක කිරීමට තුඩු දුන් ක්‍රියාවලිය ඉතා කඩිමුඩියේ සහ නිසි මෙහෙයවීමකින් තොරව සිදු වූ ආකාරය විස්තර කරන ලදී. කෝටාව ක්‍රියාත්මක කිරීම සඳහා අලුත් අවස්ථාවක් ලැබුණොත් ඔහු වෙනස් ආකාරයකින් කරන්නේ කුමක්දැයි එක් අමාත්‍යාංශ නිලධාරියෙකුගෙන් පසුකාලීනව විමසූ විට, සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට පෙර කෝටාව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව බැලීමට තමා මුලින්ම නියාමක පිරික්සුමක් සිදු කරන බව ඔහු පැවසීය: "මෙම කෝටාව පිළිබඳව ආරම්භයේ දී පාර්ලිමේන්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය වැනි විවිධ සංසදවලදී විවිධ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කරන ලදී. විභව දෝෂ සහ තාක්ෂණික අක්‍රමිකතා නිවැරදි කිරීම සඳහා නියාමක පිරික්සුමක් සිදු කිරීම සම්බන්ධයෙන්ද එම සංසදවලදී අපි කතා කළෙමු" (සහභාගීවන්නා 7, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නා). පෙර කොටසේ දී උපුටා දැක්වූ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන්ට මෙන්ම, මෙම ක්‍රියාවලිය ඉක්මන් වැඩි බව මෙම නිලධාරියාට ද හැඟී ගියේය. එය ප්‍රභූ දේශපාලන පක්ෂ නායකයන්ගේ විවිධ ආකාරයේ කේවල් කිරීම්වලින් වට වී තිබිණි. මෙම වාද විවාද හා කේවල් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව මීළඟට සාකච්ඡා කෙරේ.

## මැතිවරණ කල්දැමීම සඳහා පැවති ව්‍යාජ හේතුව

2015 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන මැතිවරණය කල් දැමුණු අතර එය 2018 පෙබරවාරි මාසය තෙක් නොපැවැත්විණි. කාන්තා කෝටාව අන්තර් කාලසීමාව තුළ හඳුන්වා දුන් අතර 2012 මැතිවරණ ප්‍රතිසංස්කරණවලට[4] අදාළ සීමා නිර්ණ කටයුතු මෙන්ම කාන්තා කෝටාව හඳුන්වාදීම හේතුවෙන් මෙම ප්‍රමාදය සිදු විය. 2016 සිට බහුතර සිංහල ප්‍රජාව අතර සිරිසේන ආණ්ඩුවේ පැවති ජනප්‍රියතාවය අඩුවීම (2015 බැඳුම්කර වංචාව සහ ප්‍රතිසන්ධාන මුලපිරීම් වැනි විවිධ සිදුවීම් හේතුවෙන්) සහ බහුතර සිංහල ජනතාව අතර රාජපක්ෂ දේශපාලන කඳවුර (පොදුජන පෙරමුණ) භුක්ති විඳි පොදු මැතිවරණ වාසියත් හේතුවෙන්, පළාත් පාලන මැතිවරණය කල් දැමීම යහපාලන ආණ්ඩුවේ අවශ්‍යතා වෙනුවෙන් වාසිදායක විය. එක් ප්‍රධාන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නෙකු පැවසූ පරිදි, යූඑන්පී ප්‍රමුඛ ආණ්ඩුවට කාන්තා කෝටාව සහ මැතිවරණ ප්‍රතිසංස්කරණ, කඩතුරාවක් ලෙස යොදා ගනිමින් මැතිවරණ කල් දැමීමට අවශ්‍ය වූයේ නම්, එය ඔවුන්ට අවශ්‍ය දේ ලබා දුන්නේය (සහභාගීවන්නා 5). එම සහභාගිවන්නාම පැවසුවේ, "මේ සියල්ලටම සමාන්තරව, පළාත් පාලන මැතිවරණය කල් දැමීම සඳහා රජය විසින් විවිධ මාර්ග සහ ක්‍රම සොයමින් සිටියේය. ඔවුන් ලබා දුන් නිදහසට කරුණ නම් එවකට පැවති පළාත් පාලන මැතිවරණ ක්‍රමය තුළ කාන්තාවන් ඇතුළත් නොවීමයි" (සහභාගීවන්නා 3, ව්‍යවස්ථාදායකයා). මෙම දුර්ලභ හා අවංක සම්මුඛ සාකච්ඡාවේදී, සමහර දේශපාලන ක්‍රියාකාරීන්ගේ දෘෂ්ටිකෝණයෙන් බලන කල්හි, කාන්තා කෝටාව මැතිවරණ කල් දැමීම උදෙසා වන නිදහසට කරුණක් වූ බව හෝ එසේ සලකන බවට හැඟීමක් තිබූ බවට මෙම සහභාගිවන්නා පිළිගත්තේය.

මැතිවරණය කල් දැමූ අවස්ථාවේදී, පළාත් පාලන ආයතනවල හිටපු මන්ත්‍රීවරුන් පිරිසක් විසින් පළාත් පාලන මැතිවරණය නොපැවැත්වීම හේතුවෙන් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවටත් පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතු බවටත් වන තීන්දුවක් ලබා දෙන ලෙසට ඉල්ලමින් මූලික අයිතිවාසිකම් පිළිබඳ ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ

[4] 2012 පළාත් පාලන මැතිවරණ ප්‍රතිසංස්කරණ අනුව, කොට්ඨාශ සහ මැතිවරණ බලප්‍රදේශවලට අයත් සීමාවන් නැවත නිර්ණය කිරීම සඳහා සීමා නිර්ණ කමිටුවක් පත් කරන ලදී. පළාත් පාලන ආයතනයන්හි කාලසීමාව අවසන් වීමෙන් මාස දෙකකට පසුව, එනම් 2015 ජූනි මස මෙම කමිටුවෙහි වාර්තාව සම්පූර්ණ කරන ලදී (සන්ඩේ ටයිම්ස්, 2015; SC FR No. 35/2016, පිටුව. 13).

ගොනු කරන ලදී. අගවිනිසුරුවරයා තීන්දු කළේ “2012 අංක 22 දරන පළාත් පාලන ආයතන (සංශෝධන) පනත 2012 දී පනවනු ලැබුවත්, මේ දක්වා , ඒ යටතේ මැතිවරණ පැවැත්වීමට අවශ්‍ය අවශ්‍යතා සපුරා නොමැති බැවින් ඒ යටතේ මැතිවරණ පැවැත්වීමට නොහැකි බවයි... සීමා නිර්ණය කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තුරු මැතිවරණ පැවැත්විය නොහැකි”□ බව සහ ”□රජය විසින් පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති”□ බවයි ”(ස තඎ ඉල්ලීම් අංක 35/2016).

මැතිවරණ කල්දැමීම ගැන මහජන විරෝධයක් ඇති වූ බවට වූ ප්‍රකාශය, විශේෂයෙන් ඒකාබද්ධ විපක්ෂයෙන් මතුවන ප්‍රකාශය, ද්විතීයික සාහිත්‍යය මගින් සනාථ කරයි. මාධ්‍ය හමුවකදී විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභාපති ජී.එල් පීරිස් විසින් ප්‍රකාශ කර සිටියේ “වසර දෙකහමාරකින් පළාත් පාලන මැතිවරණය නොපැවැත්වූ රටක් ලෝකයේ නැත” (දිවයින, 2017 , පි. 9) සහ ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ඩලස් අලහප්පෙරුම ප්‍රකාශ කළේ “මේ රජය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය සහ එහි උත්තරීතරභාවය හෑල්ලු කළා. එය ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය පවරා ගත්තා [""] එය කළ ආකාරය විස්තර කළ හැක්කේ ගැමි භාෂාවෙන් පමණි, එනම් නංගී පෙන්වා අක්කා විවාහ කර දීම ලෙස නොව නංගී පෙන්වා ආච්චිව විවාහ කර දීම යනුවෙනි (2017 සැප්තැම්බර් 23, දිවයින, පිටුව 9). විපක්ෂයේ දේශපාලනඥයන්ගේ මෙවැනි ලිංගික භාෂා භාවිතයෙන් පෙනෙන්නේ පළාත් පාලන මැතිවරණය කල් දැමීම සම්බන්ධයෙන් රජයට අභියෝග කිරීමට බලවත් පදනමක ඔවුන් සිටි බවත්, නීත්‍යානුකූල නොවන ආකාරයෙන් නීත්‍යානුකූළ නොවන පදනම් මත පළාත් පාලන මැතිවරණය කල් දැමූ බවට සාමාන්‍ය හැඟීමක් තිබූ බවත්ය. මැතිවරණ පැවැත්වීමට රජයට එල්ල වූ පීඩනය ඉතා ඉහළ විය. එවකට පැවති ඩෙංගු වසංගතයේ බරපතලකම නිසා මෙය වඩාත් තීව්‍ර වූ අතර මහජන සෞඛ්‍ය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සෘජු වගකීමක් පළාත් පාලන ආයතනට ඇති බැවින් මේ බලපෑම ඉතා තදබල එකක් විය.

## තීරණ ගැනීමේ ක්‍රියාවලිය කමිටුකරණයට ලක්වීම

මැතිවරණ ප්‍රතිසංස්කරණ කෙතරම් “ඉක්මන්” වූයේද යන්න පිළිබඳව රසවත් ආඛ්‍යානයක් ඉස්මතු විය. ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම කඩිමුඩියේ සිදු වූ බව අයිතිවාසිකම් කණ්ඩායම් සහ අමාත්‍යාංශ නිලධාරීන්ට හැඟී ගිය අතර, දේශපාලන පක්ෂ නායකයින්ට හැඟී ගියේ එය මන්දගාමී හා ඇදගෙන යාමේ ස්වරූපයක් ගත් බවයි. අදාළ පනත් දෙක සම්මත වූ 2016 පෙබරවාරි සිට 2017 අගෝස්තු දක්වා කාලය තුළ කාන්තා කෝටාව ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු මැතිවරණ ක්‍රමයක් පිළිබඳව සාකච්ඡා කිරීමට මාස 18 ක කවුළුවක් තිබුණි. පුළුල් මැතිවරණ ආකෘතිය 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ සඳහන් මැතිවරණ රාමුව මත පදනම් විය යුතු බවට ආණ්ඩුවේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක (එජාප සහ ශ්‍රීලනිප), මෙන්ම මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පිහිටුවීමට ගිය) කැඩී ගිය කණ්ඩායම අතරද එකඟතාවයක් තිබුණි. මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික නියෝජන (MMPR) මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් එතරම් මතභේද ඇති බවක් පෙනෙන්නට නොතිබුණි. නිශ්චිත මැතිවරණ ක්‍රමය සහ සංයුතිය තීරණය කිරීමේ ප්‍රමාදය දේශපාලන පක්ෂ, මැතිවරණ නිලධාරීන් සහ සිවිල් සමාජය සමඟ බහුවිධ කමිටු ඇතිකර සාකච්ඡා පැවැත්වීම නිසා ඇතිවූ ප්‍රතිඵලයකි. මැතිවරණ කොට්ඨාශ සීමා නිර්ණය කිරීම සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ සතුව පවතින ගැටළු සොයා බැලීම සඳහා පත් කරන ලද අශෝක පීරිස් කමිටුව ඇතුළු කමිටු බොහෝමයක් රජය විසින් පත් කරන ලදී (සන්ඩේ ඔබ්සර්වර්, 2017, පිටුව.8). එසේ වුවද, අශෝක පීරිස් කමිටුවේ නිලධාරීන් වැනි ප්‍රධාන නිලධාරීන්, පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට රජය ඉදිරිපත් නොවීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ විවේචනය කළහ (ඩේලි මිරර්, 2017).

තීරණ ගැනීමේ ක්‍රියාවලීය එලෙසින් “කමිටුකරණය” (කමිටු බෙහෝමයක් මගින් පාලනය) කිරීම තුළින් සාමාන්‍යයෙන් දීර්ඝ ප්‍රමාදයන් ඇති වේ. දේශපාලන පක්ෂ බොහොමයක් “ප්‍රතිසංස්කරණයට විරුද්ධ වූ” (සහභාගිවන්නිය 5, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නා) කමිටු සමඟ නිරන්තරව රැස්වීම් ගැන සහභාගිවන්නන් කිහිප දෙනෙකු විසින් විස්තර කළ අතර මෙම අධ්‍යයනය සඳහා සහභාගී වූ එක් දේශපාලනඥවරියක් විසින් මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යෝජනාව ගෙන ආ පක්ෂයේ සිටින ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයන් පවා ”සැබෑ මැතිවරණ මට්ටමේ දී කෝටාවේ ප්‍රායෝගික නොවන තත්ත්වය පිළිබඳව සඳහන් කරමින්” කෝටාවට විරුද්ධ වූ ආකාරය පෙන්වා දෙන ලදී. (සහභාගීවන්නා 7, ව්‍යවස්ථාදායකයා). මෙවැනි විවිධ අතීතාවර්ජන ප්‍රකාශ තුළින් නිගමනය කළ හැක්කේ මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් එකඟ වීමට දේශපාලන පක්ෂ බොහෝ කාලයක් ගත කළ බවයි. මේ හේතුවෙන්, තාක්ෂණික සාකච්ඡා පැවැත්වීමට සහ ප්‍රතිපත්තියේ අඩංගු කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීමට සුළු කාලයක් පමණක් ඉතිරි විය. උදාහරණයක් ලෙස, ඉහත සඳහන් කළ පරිදි, රාජ්‍ය නිලධාරීන්ට සහ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන්ට හැඟී

ගියේ, නාමයෝජනා සඳහා වන නිර්ණායක සකස් කිරීම, යෝජිත කෝටාව සම්බන්ධව නියාමක පිරික්සුමක් කිරීම ඇතුළු තාක්ෂණික කාරණා සම්බන්ධයෙන් ප්‍රමාණවත් ලෙස කටයුතු කර නොමැති බවයි. එවැනි ප්‍රමාද කිරීම් තුළින් පෙන්නුම් කරන්නේ වැඩ කිරීමේදී පවතින තරඟකාරී වුවමනාවන් එකිනෙකාට එරෙහිව ක්‍රියාකළ ආකාරය සහ ක්‍රියාවලියේ පවතින මන්දගාමීත්වයයි. මෙම දිගුකාලීන ප්‍රමාදය කාන්තා කෝටාව සඳහා වූ මහජන දැනුවත්භාවය සහ ඉල්ලුම වැඩි වීමට ද හේතු විය. උදාහරණයක් වශයෙන්, සියයට 25 ක කෝටාවට පක්ෂව රජයේ ඇමතිවරුන් ප්‍රමුඛව මහජන පෙළපාළි පැවැත්විණි. එම කෝටාවට රජයේ ඉහළම මට්ටමේ සහාය ලැබෙන බව පැහැදිලි විය. එපමණක් නොව, රාජ්‍ය නිලධාරීන් ද කෝටාව සඳහා පූර්ණ සහයෝගය ලබා දුන්හ. කෝටාව පිළිබඳව දැනුවත් කිරීමට සහ නව කෝටා ක්‍රමය යටතේ මැතිවරණවලට ඉදිරිපත් වීමට අපේක්ෂා කරන්නන් හට තිබිය හැකි ගැටලු පිළිබඳව විමසීමට රේඛීය අමාත්‍යාංශය විසින් සිවිල් සමාජ සංවිධාන සමඟ සහයෝගයෙන් දිවයිනේ සියලුම පළාත්වල උපදේශන ද සංවිධානය කළේය. උපදේශන වලදී මතු වූ අදහස් ඇතුළත් ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන සහභාගීත්වය වැඩි දියුණු කිරීම් යන මැයෙන් වූ ප්‍රකාශනයක් මහජන උත්සවයකදී ජනාධිපතිතුමා වෙත පිළිගැන්විණි. ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරීන්ට වැඩි කාලයක් ලබා ගැනීමට කමිටුකරණය උපකාරී වූයේ නම්, මැතිවරණ ප්‍රමාද කිරීමේ අපවාදය වෙනතකට යොමු කිරීමට ඉහත ආකාරයේ මහජන පෙළපාලි තුළින් අවස්ථාවක් ලබා දුන්නේය. එහෙත්, දේශපාලන පක්ෂ තුළ සහ සමාජය තුළ විශාල වශයෙන් කාන්තා දේශපාලන සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා පවතින කැමැත්ත සහ කැපවීම ද මෙම ක්‍රියාවලීන් මගින් ඉහළ නංවන ලදී.

## විවිධ දේශපාලන අරමුණුවල පෙළගැස්වීම

මේ අතර, කාන්තා කෝටාව හඳුන්වාදීමේ මොහොත "ඉතා ශක්තිමත් දේශපාලන ක්‍රීඩාවක්" ලෙස දුටු තවත් පිරිසක් සිටි අතර එය "පුද්ගලික අභිමානය" සඳහා සිදු කළ දෙයක් ලෙසට ඔවුහු වටහා ගත්හ (සහභාගීවන්නන් 3, සිවිල් සමාජය). කාන්තා කෝටාව හඳුන්වාදීමේ දේශපාලන මොහොත තීරණය වූයේ විවිධ දේශපාලන අවශ්‍යතා පෙළගැස්වීම මගින් වන අතර, ඒ වනවිට පළාත් පාලන මැතිවරණය ප්‍රමාද කිරීමෙන් ලබා ගැනීමට කිසිවක් නොමැති ප්‍රධාන බලවේගය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පමණක් බව පෙනෙන්නට තිබුණි. මැතිවරණය පැවැත්වීමෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට වාසිදායක විය හැකි බව පෙනුණු අතර මැතිවරණය ප්‍රමාද කිරීම ආණ්ඩුවේ සිටි ප්‍රධාන දේශපාලන පක්ෂ සියල්ලටම වාසි අත්වනු ඇති බවද පෙනිණි.

ඉහත සඳහන් කළ පරිදි, වසර තුනකට ආසන්න කාලයක් මැතිවරණ ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් හවුල් ආණ්ඩුවේ ප්‍රධාන හවුල්කරුවන් විවේචනයට ලක් විය. ආණ්ඩුවේ ප්‍රධාන හවුල්කරුවා ලෙස එජාපය මෙම ප්‍රමාදයට හේතු වූ ප්‍රධාන පාර්ශ්වයක් ලෙස සැලකිණි. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඉවත් වීමෙන් පසුව සාපේක්ෂව කුඩා පක්ෂයක් බවට පත් වූ එජනිස විසින් මුළු ඡන්ද ප්‍රමාණයෙන් සියයට 12ක් පමණ ලබා ගත්තේය. මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවේදී එජනිස වෙනුවෙන් මැතිවරණ සාකච්ඡා මෙහෙයවූ ප්‍රධාන ව්‍යවස්ථාදායකයකු පැවසූ පරිදි, "අපි මෙම මැතිවරණ ආකෘතියට එකඟ වූයේ, අපට වැඩි ආසන ලබා ගැනීමට පැවති හොඳම ආදර්ශය එය වූ නිසා [""]" (සහභාගි වන්නා 1, ව්‍යවස්ථාදායකයා). තමන්ට අවාසිදායක මැතිවරණයක් තුළ, නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීමෙන් මේ ප්‍රධාන පක්ෂ දෙකට පැහැදිළිව වාසි රැසක් හිමි විය. නව මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් කුඩා පක්ෂයන්හි එකඟතාව ලබා ගැනීම සඳහා, පක්ෂයට ආසන දෙකක් පමණක් ලැබුණහොත් කාන්තාවක් පත් කිරීම අනිවාර්ය නොකිරීම, සියයට 5 ක අවම සුදුසුකම් කඩඉම ඉවත දැමීම වැනි සහන කිහිපයක් එම කුඩා පක්ෂවලට ලබා දෙන ලදී (සහභාගීවන්නන් 5, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නා).

සියයට 25 කෝටාව කිසිලෙසකින් ක්‍රියාත්මක නොවේ යන උපකල්පනය මත අනෙකුත් සමහර පක්ෂ වැඩ කටයුතු කර තිබුණි. තමන් ගේ පක්ෂය මෙම නව කෝටා ක්‍රමයට විරුද්ධ වූ බව සමහර සහභාගිවන්නන් (ව්‍යවස්ථාදායකයන්) විසින් පිළිගත්හ. ජනවාර්ගික සුළුතර දේශපාලන පක්ෂයක එක් ලේකම්වරයෙකු පැවසූ පරිදි, "කාන්තාවන් සඳහා වන කෝටා ක්‍රමය පැමිණියේ ජනතාවගෙන් පැමිණෙන ඉල්ලීමකට වඩා බාහිර බලකිරීමක් ලෙසය. මෙම කෝටා ක්‍රමය දේශපාලන පක්ෂවලට හිරිහැරයක් වූයේ බොහෝ දේශපාලන පක්ෂවල කාන්තාවන් ප්‍රමාණවත් ලෙස නොසිටීම නිසාය. පක්ෂවල කාන්තාවන් අතරින් පවා ඉතා සුළු පිරිසක් පමණක් මැතිවරණවලට ඉදිරිපත් වී ජයග්‍රහණය කර ඇත" (සහභාගීවන්නා 3, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නා). එසේ හෙයින්, කෝටාව සිදු නොවනු ඇතැයි සරලව උපකල්පනය කරමින් සිටි පක්ෂ, අවසාන මොහොතේ, කාන්තා අපේක්ෂකයින් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීමට සිදු වූ විට කැළඹීමට පත් විය (වැඩිදුර විස්තර සඳහා පහත 2.2 කොටස බලන්න).

## ප්‍රධාන පුද්ගලයන්ගේ කාර්යභාරය

කාන්තා දේශපාලන නියෝජනය වැඩි කිරීමට දේශපාලන පක්ෂ සම්පූර්ණයෙන් ම නතුනොවූ මෙම සන්දර්භය තුළ, විවිධ දේශපාලන අභිලාෂයන්, පුද්ගලික විශ්වාසයන්, දේශපාලන කැපවීම් සහ පුද්ගලයන් මෙන්ම දේශපාලන පක්ෂ සහ දේශපාලන අවස්ථාවාදීන් කෝටාව හඳුන්වා දීමත් සමඟ එකට පෙළගැසුණි. මෙම කෝටාව හඳුන්වාදීම සම්බන්ධයෙන් ඇතැම් පුද්ගලයන් සෘජුවම වගකිව යුතු යැයි ඇතැමුන් සිතූ අතර තවත් සමහරු සිතුවේ එය තම තමන්ගේ පක්ෂවල දේශපාලන අවශ්‍යතා සපුරාලන්නට පාවිච්චි කල හැකි බවයි. කාන්තා නියෝජනය සඳහා වූ සූත්‍රය ඔවුන්ට අවශ්‍ය වන්නේ කෙසේදැයි එවකට සිටි අගමැතිවරයා විසින් කාන්තා කණ්ඩායම් ක්‍රියාකාරිනියකගෙන් විමසූ ආකාරය විස්තර කරමින්, එක් සහභාගිවන්නෙක් විසින් ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට අදාළ සන්දර්භය තුළ ප්‍රධාන පුද්ගලයින්ගේ කාර්යභාරය උදාහරණ සහිතව පෙන්වා දුන්නේය. සංචිත නාමයෝජනා වෙනුවට ආසන වෙන්කර ගැනීම සඳහා කෝටාව භාවිතා කල හැකි ආකාරය ගැන විවිධ සූත්‍ර අගමැතිවරයා විසින් යෝජනා කළ බවත්, ඒ අවස්ථාවේදී ඔහු ඒ ගැන බැරෑරුම් ලෙස සිතමින් සිටි බවට තමාට හැඟුණු බවත් ඇය ප්‍රකාශ කළාය (සහභාගීවන්නා 6, සිවිල් සමාජය).

කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිනියකගේ මෙම කථාව, තවත් සහභාගිවන්නන් කිහිප දෙනෙකුගේම කතාන්දරවලට සමාන විය. කාන්තාවන් සඳහා කෝටාවක් සම්මත කර ගැනීමට රජය යොමු කිරීම සම්බන්ධයෙන් එවකට අගමැතිවරයා සහ ඔහුගේ බිරිඳ (ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයනය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් උසුලන ජ්‍යෙෂ්ඨ විද්වතෙක්) විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ බවට සැවොම එකඟ වූහ. එසේම, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නීති නිලධාරිනී (කාන්තා) ගයනි ප්‍රේමතිලක මහත්මිය ද බොහෝ දෙනාගේ පිළිගැනීමට ලක්විය. අප ඇය සමඟ කළ සම්මුඛ සාකච්ඡාවේදී ඇයව පෙළඹවූයේ කුමක්දැයි විමසූ විට ප්‍රේමතිලක මහත්මිය පැවසුවේ "මම ප්‍රාදේශීය සභා මට්ටමින් බොහෝ රැස්වීම්වලට සහභාගි වුණා. ඒවායේ සිටියේ පිරිමින් පමණි. එතන පිරිමි විතරක් ඉන්නවා දැකලා මට එපා වුණා." තම තනතුර නිසා කෝටාව සැලසුම් කිරීමේ ක්‍රියාවලියට සහභාගී වුවත්, කාන්තාවක් ලෙස ඇය එම තනතුරෙහි සිටීම, මෙම රැස්වීම්වලට ඇයගේ පැමිණීම, කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට යම් ධනාත්මක බලපෑමක් ඇති කළේය.

බලය ඇති පුද්ගලයන් සහ වෙනසක් ඇති කිරීමට ඇති කැපවීම පිළිබඳ මෙම වෘත්තාන්තය තුළ පැහැදිලිව දිස්වන ප්‍රගතිශීලී බලපෑමක් තිබුණද, එවැනි වෘත්තාන්ත ශ්‍රී ලාංකීය දේශපාලන ක්‍රමය තුළ පවතින පුද්ගල-නැඹුරු ස්වභාවයේ ලක්ෂණ වේ. පද්ධතිය තුළ ඇති ව්‍යුහාත්මක ගැටලු සැලකිල්ලට ගැනීමට එවැනි පුද්ගලවාදී සහ තනි පුද්ගල මූලික ප්‍රතිපත්ති සම්පාදනය අසමත් වන අතර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ හැකි ආකාරය පිළිබඳ පුළුල් එකඟතාවයක් ගොඩනගා ගැනීමට අවසානයේ අසමත් වේ. එවැනි ඉහළ මට්ටමේ උද්යෝගයක්, ඉඩකඩ ඇතිකිරීමක් සහ සහයෝගයක් නොමැතිව මෙවැනි නව ප්‍රතිපත්ති කිසිසේත්ම ඇති නොවන බව ද සත්‍යයකි. මේ අනුව, කෝටා ප්‍රතිපත්තිය වඩාත් ප්‍රගතිශීලී පුද්ගලයන් (බහු-පක්ෂ සම්මුතියට පටහැනිව) සහ වෙනස් වීමට ප්‍රතිරෝධයක් දක්වන දේශපාලන පක්ෂ ක්‍රමයන් අතර ඝට්ටනයකට හේතු වුවත්, අදාළ බලවත් පුද්ගලයින්ගේ තිබූ විශේෂ උනන්දුව නිසා එය සම්මත වූ අතර සමහර පක්ෂ මට්ටමේ අවශ්‍යතා වල සමපාත වීමක් ද සිදුව ඇති බව පෙනේ. ඒ අනුව, පක්ෂ තුළ පවතින උනන්දුව, කෝටාවෙහි අපේක්ෂිත ප්‍රතිඵලය නොවුණද, පක්ෂ තුළ පවතින උනන්දුව එමගින් ලබාගත හැකි සාපේක්ෂ වාසියක් විය.

## කෙටුම්පත් කිරීමේ අවධියෙහි පැවති සීමාවන්

ප්‍රතිපත්තියේ පැවති තවත් සීමාවක් වූයේ කෝටාව හරහා තේරී පත් වූ කාන්තාවන් මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීමට අසමත් වීමයි. පළාත් පාලන ආයතනයේ සභාපතිවරයාගේ දැවැන්ත බලතල සහ අනෙකුත් විධිමත් හා අවිධිමත් අන්තර්කරණය නොවූ බලය පිළිබඳ සැකසුම් එවැනි අභියෝගයන් මධ්‍යයේ තිබුණි. කෝටා ක්‍රමය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළ අනන්‍ය සාධාරණ පද්ධතියක් යටතේ සඵලදායී ලෙස කටයුතු කිරීමට සභිකයන්ට හැකියාව ලබා දෙන්නා වූ අන්තර්කරණය සහ විනිවිදභාවය පිළිබඳ ප්‍රමාණවත් ආරක්ෂාවක් නොතිබුණි. නිදසුනක් වශයෙන්, පළාත් පාලන සභාවේ මූල්‍ය කමිටුවට සාමාජිකයන් පත් කිරීම මුලසුනේ අභිමතය පරිදි සිදු වේ. වියදම් පිළිබඳව සාකච්ඡා කරන්නා වූ එවැනි තීරණාත්මක කමිටු සඳහා කාන්තාවන් පත් කරනු ලැබුවේ ඉතාමත් කලාතුරකින් වීමත් තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ගෙන් ඔවුන් බැහැර කරනු ලැබීමත් පුදුමයට කරුණක් නොවේ. පද්ධතිය පුරාම, පළාත් පාලන ආයතනයක් සඳහා එකම සභාපතිනියක් හෝ පත් කර නොතිබූ අතර, එක් මන්ත්‍රීවරියක් පමණක් උපසභාපති

ලෙස පත් කර තිබුණි. පද්ධතිය තුළ පවතින එවැනි ව්‍යුහාත්මක දුර්වලතා කෝටා ක්‍රමයක් මගින් සම්පූර්ණයෙන් විසඳිය නොහැකි අතර පළාත් පාලන ආයතන වඩාත් අන්තර්කරණය වූ තීරණ ගැනීමේ අවකාශයන් බවට සහතික කිරීම සඳහා මූලික ප්‍රජාතන්ත්‍රවාදී ආරක්ෂාවන් ක්‍රියාත්මක විය යුතු අතර, කාන්තා කෝටාව වැනි ස්ථිර ක්‍රියාවන් මගින් නාමික නියෝජනයට වඩා ප්‍රතිඵල අත්කර ගත හැකිය.

දේශපාලන පක්ෂ තුළ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය සහ විනිවිදභාවය නොමැතිකම ද ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමේ අදියරේදී නොසලකා හරින ලද බාධකයක් විය. ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් උල්ලංඝණය කිරීම සහ මූල්‍ය විනිවිදභාවය පවත්වා නොගැනීම යන අංශ දෙකම සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ විනිර්මුක්තියකින් යුතුව ක්‍රියා කරන බැවින් ඕනෑම ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණයක් අඩපණ කිරීමේ විභවය සැමවිටම පවතී. මෙම සිද්ධියේදී, නිදසුනක් වශයෙන්, ප්‍රතිපත්තිය මගින්ම ආසනවලින් සියයට 25 ක් පමණක් මන්ත්‍රීවරියන් සඳහා අනිවාර්ය කර ඇත. කෙසේ වෙතත්, තේරීම් ක්‍රියාවලිය, නාමයෝජනා ලබා දෙන ආකාරය, අපේක්ෂකයින් ඉදිරිපත් කිරීම, කාන්තා අපේක්ෂකයින්ට සම්පත් බෙදා හැරීම, ඔවුන් සම්බන්ධ කරගත් ජාලයන්, කාන්තා අපේක්ෂකයින් සමඟ පක්ෂයට පැවති අවබෝධය යනාදිය සම්බන්ධයෙන් දේශපාලන පක්ෂවලට අධිකාරිය තිබුණි. අවසානයේ, පක්ෂයේ පවතින දේශපාලන සංස්කෘතිය සහ භාවිතයන් විසින් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ආකාරය සම්බන්ධයෙන් තීරණය කළේය. එක් කාන්තා ක්‍රියාකාරිනියක් පැවසූ පරිදි, "මම හිතන්නේ අපිට වැරදුණු තැන දේශපාලන පක්ෂ සමගයි. එය පුරුෂයන් විසින් මෙහෙයවන දේශපාලන පක්ෂවල ඔබ දකින ඉතා පීතෘමූලික ක්‍රමයක්" (සහභාගීවන්නා 5, සිවිල් සමාජය). තවත් ක්‍රියාකාරිකයෙක් එය ප්‍රකාශ කළේ, "එය සමානුපාතික නියෝජන ක්‍රමයක් බැවින් කාන්තාවන් නම් කරන ලෙසට අපි දේශපාලන පක්ෂවලට කන්නලව් කළ යුතුයි. කිසිදු පක්ෂයකට සංවෘත ලැයිස්තුවක් නොමැත" (සහභාගීවන්නා 6, සිවිල් සමාජය). එවැනි භාවිතයන් ප්‍රතිපත්තිය තුළින් හෝ නොවැළැක්වූ අතර, ඒ හේතුවෙන් එහි මුල් අභිප්‍රායන් සමහරක් යටපත් වූ අතර එහි ප්‍රතිඵලය කාන්තාවන්ගේ සංඛ්‍යාත්මක නියෝජනය වැඩි කිරීමට පමණක් සීමා විය.

කෝටාව සම්බන්ධ තවත් මතභේදාත්මක කරුණක් වූයේ එය කොපමණ කාලයක් ඵලදායී වනු ඇතැයි අපේක්ෂා කරන්නේද යන්නයි. මෙම අධ්‍යයනයට සහභාගී වූ සමහර අයට කෝටාව හිරු බැස යන වගන්තියකට යටත් කළ යුතු යැයි හැඟී ගිය අතර තවත් සමහරුන්ට හැඟී ගියේ කාන්තාවන්ටද දේශපාලනය තුළ සාර්ථක විය හැකි බවට ජනතාව තුළ විශ්වාසයක් ඇති කිරීම වෙනුවෙන් කාන්තා දේශපාලනඥයින්ට අවස්ථාවක් ලබා දීමට කෝටාව මගින් අපේක්ෂා කරන බැවින්, සැලකිය යුතු වෙනසක් ඇති කිරීමට අවශ්‍ය තාක් කල් එය ක්‍රියාත්මක විය යුතු බවය. එක් ජ්‍යෙෂ්ඨ දේශපාලනඥවරියක් තර්ක කළ පරිදි, "කෝටාව යනු කාන්තාවන්ට ද ඉදිරිපත් විය හැකි බව මිනිසුන්ට දැකීම සඳහා ඉඩ සලස්වන තාවකාලික පියවරකි." (සහභාගීවන්නා 7, ව්‍යවස්ථාදායකයා). එවැනි අපේක්ෂාවන් මගින් උපකල්පනය කළේ කෝටාව විසින් දේශපාලන ක්‍රමය තුළ වඩාත් අන්තර්කරණ වෙනස්කම් ඇති කරමින් සමාන පදනමකින් මැතිවරණවලට තරඟ කිරීමට හැකි පරිසරයක් කාන්තාවන් වෙනුවෙන් නිර්මාණය කරනු ඇති බවයි.

එය දේශීය අවශ්‍යතා ආමන්ත්‍රණය කරන දේශපාලන පියවරකට වඩා බටහිර න්‍යාය පත්‍රවල ප්‍රතිඵලයක් බව පවසමින් සමහර දේශපාලකයින් විසින් කෝටාව විවේචනය කළේය. කාන්තා නියෝජනයක් සඳහා වන ඉල්ලීම තුළ දේපළ අයිතිවාසිකම් හරහා කාන්තාවන්ට සමාජය තුළ පවතින සැඟවුණු බලය සහ දේපල අයිතිවාසිකම් හිමිවීම යනාදිය සම්බන්ධයෙන් මෙම සමාජය දිගු කලක් තිස්සේ මාතෘ මූලික වී ඇති ආකාරය සම්බන්ධයෙන් සැළකිල්ලට නොගන්නා බවට එක් ජ්‍යෙෂ්ඨ පිරිමි දේශපාලනඥයෙකු තර්ක කළේය. මෙහිදී ඔහු විශේෂයෙන්ම අදහස් කළේ නැගෙනහිර පළාතේ සිටින කාන්තාවන් පිළිබඳවය. කෝටාව කෙරෙහි ඇති උනන්දුව හේතුවෙන් නැගෙනහිර ප්‍රදේශයේ පවතින බරපතළ ඉඩම් ප්‍රශ්න සහ ස්ත්‍රී පුරුෂ භාවය සමඟ සෘජුව සම්බන්ධ නොවන එවැනි ප්‍රශ්නවලට සම්බන්ධ ජනවාර්ගික දේශපාලනය පිළිබඳ සාකච්ඡා වැළැක්වෙන බව ද ඔහු යෝජනා කළේය. කෝටා හඳුන්වා දෙන්නේ නම්, සුළුතර ප්‍රජාවන්ට, විශේෂයෙන්ම පීඩා විඳින ස්වදේශික ආදිවාසී ප්‍රජාවන්ට ප්‍රමුඛත්වය දිය යුතු බව ඔහු තර්ක කළේය, මන්ද ඔවුන්ට බලපාන ගැටලු තුළින් දේශපාලනයේ අනාගතය හැඩගස්වනු ඇත (සහභාගීවන්නා 3, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නා). තවත් නැගෙනහිර දේශපාලනඥයෙක් විසින් පෙන්වා දුන්නේ කාත්තන්කුඩි වැනි නගර ඉතා ඉහළ ජන ඝණත්වයක් හේතුවෙන් දැඩි ලෙස අවහිර වී සිටින බවත් මේ හේතුවෙන් බරපතළ සනීපාරක්ෂක ගැටලු නිර්මාණය වී ඇති බවත්ය. කෝටාව යෝජනා කරන අවස්ථාවේ කතිකාව හැඩගස්වා ගත යුතු සැගවුණු සංස්කෘතික දේශපාලනය සහ කෝටාව විශේෂයෙන්ම, සමාජයේ හෝ කාන්තාවන්ගේ සැබෑ ප්‍රශ්නවලට ආමන්ත්‍රණය නොකරන දෙයක් ලෙස පොදුවේ දේශපාලනඥයන් විසින් කෝටාව දකින්නට ඇති ආකාරය එවැනි ප්‍රකාශය තුළින් පෙන්වා දෙන්නේය.

## 2.2 ක්‍රියාත්මක කිරීමේ අදියර ↗

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අදියර වූයේ අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත සම්මත වූ 2017 අගෝස්තු සිට මැතිවරණය පැවැත්වූ 2018 පෙබරවාරි අතර වූ කාලසීමාවයි. මෙම අධ්‍යයනය සඳහා එකතු කරන ලද දත්ත මඟින් අවධානය යොමු කළ යුතු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රධාන තේමාවන් තුනක් යෝජනා කරයි: කාන්තාවන් සඳහා පුහුණුවීම්, නාමයෝජනා ක්‍රියාවලිය සහ අපේක්ෂකයින් (විශේෂයෙන් කාන්තා අපේක්ෂකයින්) හිරිහැර හා ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීම සඳහා නීතිමය රාමුවක්. මෙම කාල සීමාව තුළ අපේක්ෂකයින්ගේ සහ අනාගත කාන්තා පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ අධ්‍යාපන ක්‍රියාවලිය කෙරෙහි යම් අවධානයක් යොමු විය. එහෙත්, ඉහත සඳහන් කළ ක්ෂේත්‍ර තුන හා සම්බන්ධ ගැටලු දිගටම පැවති අතර ක්‍රියාත්මක කිරීමේ අදියරේදී  තීරණාත්මක විය.

### කාන්තාවන් සඳහා පුහුණු

දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජය විසින් වත්මන් සහ අනාගත සභිකවරියන්ට ලබා දෙන පුහුණුවේ අන්තර්ගතය දෙයාකාරයක් විය. පළමුව, කෝටාවට පෙර, අපේක්ෂකයින් වීමට සහ මැතිවරණ ප්‍රචාරක ගොඩනැගීමට සහ නායකත්ව වැඩසටහන් හරහා තේරී පත් වීමට ඔවුන් විසින් කාන්තාවන් පුහුණු කළහ. දෙවනුව, කෝටාව ක්‍රියාත්මක කිරීමෙන් පසු, පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ පුහුණුවක් සිදු කළ අතර, පෙර පැවති ආකාරයේ පුහුණුවීම් ද අඛණ්ඩව සිදු කරන ලදී. 2020 දී පමණ, කාන්තාවන්ට කටයුතු කිරීමට සිදුවන පරිසරය සමස්තයක් ලෙස වඩාත් අන්තර්කරණය විය යුතු බැවින් කාන්තාවන් පමණක් පුහුණු කිරීම ප්‍රමාණවත් නොවන බවට හැඟීමක් ඇති විය. ඒ හේතුවෙන්, සභා තුළ සිටින පුරුෂයන්ද පුහුණු කිරීමේ අවශ්‍යතාව මතු විය. වර්තමානයේ සමහර පුහුණුවීම් තුළින් මෙම පරිවර්තනය පිළිබිඹු වේ.

කාන්තාවන් තම පිරිමි සගයන්ට වඩා අඩු අධ්‍යාපනයක් ලබා ඇති බවට වන ප්‍රමුඛ ප්‍රකාශය හේතුවෙන්, අනාගත කාන්තා පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා පුහුණුවක් ලබා දීමට ද රජය විසින් යම් අවධානයක් යොමු කර ඇති බව මෙම අධ්‍යයනය සඳහා සිදු කරන ලද සම්මුඛ පරීක්ෂණවලින් පෙනී යන්නේය. පළාත් පාලන ආයතන පිහිටුවීමෙන් ඉක්බිතිවම ලබා දුන් මෙම පුහුණුවීම් තුළින් පළාත් පාලන ආයතනයන්හි ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම අරමුණු විය. රාජ්‍ය ප්‍රතිපාදනවලට වඩා විදේශ ආධාර ලබා දෙන නියෝජිත ආයතනවල සහ දේශීය විශ්වවිද්‍යාලවල සහාය ඇතිව විෂයභාර අමාත්‍යාංශය විසින් උපදේශන, දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය හරහා කාන්තාවන්ට පළාත් පාලන ආයතන තුළ කටයුතු කිරීමට හිතකර පරිසරයක් ඇති කිරීම සඳහා පහසුකම් සැලසූ ආකාරය පිළිබඳව සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වූ එක් අයෙක් විසින් පෙන්වා දුන්නේය. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයට (SLILG) කාන්තා කෝටා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබුණු අතර රජයෙන් අරමුදල් ලැබුණු නමුත් බාහිර අරමුදල් තිබූ බැවින් මෙම අරමුදල් බොහෝ විට අවශ්‍ය නොවීය. එකල මෙම පුහුණු මුලපිරීම් සඳහා පළාත් පාලන අමාත්‍යවරයාගේ පූර්ණ සහාය තිබුණ ද අනෙක් අය මෙම ඉල්ලීමට විරුද්ධ වූ බව සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ එක් අයෙක් (සහභාගීවන්නන් 2, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නා) සිහිපත් කළේය. පුහුණුවීම් සඳහා පහසුකම් සැලසීම සම්බන්ධයෙන් දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ බව මෙයින් පැහැදිලි වේ.

බොහෝ කාන්තාවන්ට විධිමත් අධ්‍යාපනයක් නොමැත යන උපකල්පනය හරහා මෙම පුහුණුවේ අවශ්‍යතාවය සකස් විය. ප්‍රගතිශීලී අනුගාමිකයින් පවා පුහුණුව ගැන සාකච්ඡා කළ ආකාරය තුළින්ද මෙම උපකල්පනයේ ලක්ෂණ පෙනීයයි. විශේෂයෙන්ම අළුතින් හැඩගැසීම සඳහා වන උපදේශන වැඩසටහනක් නොතිබීම සහ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද වැඩසටහන ප්‍රමාණවත් නොවීම නිසා පළාත් පාලන සභාවලට ඇතුළු වන නුගත් කාන්තාවන්ට බියක් දැනෙන්නට ඇති බව ඔවුහු කියා සිටියහ. එක් සහභාගිවන්නෙකුට අනුව (සහභාගීවන්නා 3, සිවිල් සමාජය) පුහුණුලාභීන් අතර බෙදා හරින ලද පොත් පිංචද එහි 'ප්‍රවේශ විය නොහැකි' භාෂාව හේතුවෙන් විවේචනයට ලක් විය. එසේ වුවද, පළාත් පාලන ආයතනයන්හි සභිකවරියන්ගේ අධ්‍යාපන මට්ටමේ විවිධත්වයක් පැවති බව දත්ත පෙන්වා දෙයි. මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡාවට ලක් කළ අය ඉංජිනේරුවන්ගේ සිට තේ දළු නෙළන්නන් දක්වා ද, මාධ්‍යවේදීන්ගේ සිට ගුරුවරුන් දක්වා ද පරාසයක සිටින පුද්ගලයන් විය. එසේ හෙයින්, කාන්තාවන් තම පිරිමි සගයන්ට වඩා අඩු අධ්‍යාපනයක් ලබා ඇති බවට ඇති  ප්‍රමුඛ ආඛ්‍යානය සාමාන්‍යකරණය කළ නොහැක. පළාත් පාලන ආයතනවලට තේරී පත් වූ සභිකවරියන් බොහෝ දුරට ක්‍රියාකාරී දේශපාලන ක්‍රමයෙන් වඩාත් ඈත් කර තිබුණු

තැනැත්තියන් වන අතර ඔවුන් ප්‍රථම වරට පළාත් පාලන ආයතන ක්‍රමයට ඇතුළු වූ හෙයින් පළාත් පාලන ක්‍රමය සහ පළාත් පාලන ආයතන ක්‍රියා කරන ආකාරය පිළිබඳ පුහුණුවක් අවශ්‍ය වූ බව තර්ක කිරීම වඩාත් පිළිගත හැකි වන්නේය. ඔවුන් අධ්‍යාපනය නොලද සහ නුගත් තැනැත්තන් යැයි උපකල්පනයන් සිදු නොකර, සභිකවරියන් විසින් පද්ධතිය තුළ කටයුතු කිරීමට භාවිතා කරනු ලබන උපාය මාර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම සහ ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සිදුකර පුහුණුව ලබා දෙන්නේ නම් එය වඩාත් ඵලදායී වනු ඇත, මන්ද, ඔවුන් අධ්‍යාපනය නොලද සහ නුගත් තැනැත්තන් යැයි උපකල්පනයන් ඇති කර ගැනීම තුළින් පළාත් පාලන සභිකවරියන් තවදුරටත් ඒකාකෘතිකරණයට ලක් වීම සිදු විය හැකි බැවිනි.

## නාමයෝජනා ක්‍රියාවලිය

නව ක්‍රමය යටතේ කාන්තාවන් නම් කිරීම සම්පූර්ණයෙන්ම දේශපාලන පක්ෂ අතෙහි රඳා පැවතුණි. කෝටාව මගින් සියයට 25ක ආසන ප්‍රමාණයක් අනිවාර්ය කර තිබුණද, අපේක්ෂකයින් තෝරා ගැනීම හෝ ඔවුන්ට නාමයෝජනා ලබා දීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් එමගින් අනිවාර්ය කර නොතිබුණි. නාමයෝජනා භාර ගැනීමේ ක්‍රියාවලියේදී කාන්තාවන් මුහුණ දුන් විවිධ ගැටලු පිළිබඳව අපි මෙම කොටසින් සාකච්ඡා කරමු.

හේතු කිහිපයක් නිසා නාමයෝජනා ක්‍රියාවලිය ඉක්මනින්, කෙටි කාලයකින් සිදු කරන ලදී. එම හේතු වූයේ : (i) කෝටාව මගින් නියම කර ඇති පරිදි මැතිවරණය සඳහා අවශ්‍ය කාන්තා අපේක්ෂිකාවන් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීමට දේශපාලන පක්ෂ සූදානම් නොවීය; (ii) ප්‍රජාතන්ත්‍රවාදී සහ විනිවිද පෙනෙන තේරීම් ක්‍රියාවලියක් සහතික කළ හැකි ප්‍රමාණවත් අභ්‍යන්තර ව්‍යුහයක් දේශපාලන පක්ෂ සතුව නොතිබුණි; (iii) දැනටමත් පුහුණු වූ සහ පළපුරුද්ද සහිත කාන්තාවන්ගෙන් සමන්විත සංචිතයකින් තෝරා ගැනීමට ඔවුන්ට හැකියාව ලබා දෙන්නා වූ ශක්තිමත් කාන්තා බලඇණි දේශපාලන පක්ෂ සතුව ප්‍රමාණවත් තරම් නොතිබුණි. අවසාන කරුණ විශේෂයෙන් අවධාරණය කළ යුතුය. මැතිවරණයට ඉදිරිපත් වූ ප්‍රධාන දේශපාලන පක්ෂ දිගු කලක් තිස්සේ ක්‍රියාත්මක වන අතර, එම පක්ෂය නියෝජනය කරමින් තරග කළ හැකි කාන්තාවන් පිරිසක් ක්ෂණිකව සූදානම්ව නොතිබීම යනු ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමය තුළ පවතින පීතෘමූලික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි අසංවේදී ස්වභාවය පිළිබිඹු කරන විස්තරයකි. අවසානයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන විට, දේශපාලන පක්ෂ කාන්තා අපේක්ෂිකාවන් බඳවා ගැනීමට යුහුසුළු වූ අතර, තම පිරිමි සාමාජිකයින්ට පහසුවෙන් ජයග්‍රහණ කළ හැකි වේ යැයි සිතූ කොට්ඨාශ පරදුවට තැබීමට ඔවුන් මැළිකමක් දැක්වූ නිසා කුමන කොට්ඨාශයෙන් කවුරුන් තරග කරන්නේද යන ගැටලුවට පක්ෂ සංවිධායකයින්ට මුහුණ දීමට සිදුවිය. කෙසේ වෙතත්, කෝටාවෙන් මඳක් සහ දේශපාලන පක්ෂ තුළ පවතින ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් නොමැතිකමෙන් පැන නගින මෙම යථායෝග්‍ය ක්‍රියාවලිය විසින් විවිධ ප්‍රජාතන්ත්‍ර සහ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රම භාවිතා කරමින් අපේක්ෂකයින් සෙවීමට පක්ෂ උත්සාහ කරන්නා වූ කලබලයක් නිර්මාණය කළේය. පහත දැක්වෙන්නේ මෙම අධ්‍යයනයේ දත්ත වලින් මතු වූ අදාළ සිදුවීම්පෙළ පිළිබඳ විශ්ලේෂණයකි.

බොහෝ පක්ෂ ක්‍රියා කළේ කාන්තාවන්ට කොට්ඨාශවලින් ජයග්‍රහණය කිරීමට නොහැකි බවටත් කාන්තාවන්ට බලපාන ප්‍රශ්නවලට පමණක් කාන්තාවන් විසින් විසඳුම් ලබා දෙනු ඇති බවටත් වන ස්ත්‍රී පුරුෂ සමාජභාවී උපකල්පනවලිනි. කෝටාවේ ඇතැම් යෝජකයින් විසින් නාමයෝජනා ලබා දෙනු ලබන කාන්තාවන් සඳහා සුදුසුකම් ලැයිස්තුවක් සැකසීමට උත්සාහ කර තිබූ අතර එයම දුෂ්කර ක්‍රියාවලියක් වූ අතර එය අසාර්ථක විය. උදාහරණ කිහිපයකින් සඳහන් වන ආකාරයට, පක්ෂය කෙසේ හෝ පරාජය වනු ඇතැයි පක්ෂ සංවිධායකයින් විසින් විශ්වාස කළ කොට්ඨාශවලට කාන්තාවන් සීමා කිරීමට පටන් ගත් අතර, නාමයෝජනා ලබා දෙන්නේ කුමන කාන්තාවන්ට දැයි තීරණය කිරීමට ප්‍රාදේශීය සංවිධායකයින්ට හෝ වෙනත් පක්ෂ පුද්ගලයින්ට බලය තිබුණි. ඡන්ද කොට්ඨාශයක් ජයග්‍රහණය කළ නොහැකි බව ඔවුන් උපකල්පනය කළ සෑම අවස්ථාවකම, කාන්තාවක් තරඟයට ඉදිරිපත් කරන ලදී: ඇයව "බිලී කෙල්ල" ලෙස හඳුන්වනු ඇති අතර (එනම් "බිලිදෙන දැරිය" (සහභාගී වන්නා 5, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නා), ඇය ජයග්‍රහණය කළ නොහැකි කොට්ඨාශවලට බිලි දීමට හැකි වේ. භාෂාවෙන් කියවෙන ආකාරයටම, මෙයින් අදහස් කළේ සමහර කාන්තාවන් බිලි දීමට පමණක් සිටින බවයි.කෙසේ වෙතත්, කාන්තාවන් 535 ක් ඔවුන්ගේ කොට්ඨාශ ජයග්‍රහණය කළ අතර, එය ජාතික වශයෙන් පළාත් පාලන ආයතනයන්හි සියලුම කොට්ඨාශ සංඛ්‍යාවෙන් සියයට 10 ට වඩා මඳක් වැඩි විය.

පළාත් පාලන මට්ටමේ දී පක්ෂයේ ජ්‍යෙෂ්ඨයින් විසින් දොරටු රැකීම සිදු කිරීම හේතුවෙන් කාන්තා අපේක්ෂකයින්ට එය සමානුපාතික නොවන ලෙස බලපෑවේය. තරඟ කිරීමට කැමැත්තක් දැක්වූ බොහෝ කාන්තාවන්ට නාමයෝජනා ලබා ගැනීම සඳහා දේශපාලනික වශයෙන් ප්‍රාදේශීය නායකයින් සහ පක්ෂ ව්‍යුහයන් සමඟ ආක්‍රමණශීලීව කටයුතු කිරීමට සිදුවිය. පහළ පක්ෂ මට්ටම්වල සිදුවන දොරටු පාලක ක්‍රියාවලිය කාන්තා කෝටාවත් සමඟ පැහැදිලිව දැකගත හැකි විය. බොහෝ අවස්ථාවන්හිදී, පිරිමි අපේක්ෂකයෙකුට අවස්ථාව ලබා දීම සඳහා කාන්තා අපේක්ෂකයින් කොන් කරන ලදී. එසේම සමහර අවස්ථාවල කාන්තාවන් ලැයිස්තුවට ඇතුළත් කර පුරුෂයන්ට උදව් කරන ලෙස ඔවුන්ට පවසන ලදී. වෙනත් අවස්ථාවල දී, උපන් ස්ථානය හෝ කුලය මත පදනම්ව කාන්තාවන් නුසුදුස්සන් කරන ලදී. තමා එම ගම්මානයෙන් විවාහ වී සිටියද උපතින් එම ප්‍රදේශයේ තැනැත්තකු නොවන බැවින් තමාට නාමයෝජනා ප්‍රතික්ෂේප වූ ආකාරය එක් සභිකවරියක් විසින් පෙන්වා දෙන ලදී. පක්ෂයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය පිරිමි සාමාජිකයෙකු ඒ වන විටත් සිටි අතර ඇයට අපේක්ෂකත්වය අහිමි විය. තවත් අවස්ථාවක පිරිමි සාමාජිකයෙකුට (ගාල්ල එෆ්ජීඩී) ප්‍රමුඛත්වය ලබා දීම සඳහා තම කුලය මත පදනම්ව වෙනත් පළාත් පාලන ආයතනයකින් තරඟ කරන ලෙස තමන්ගෙන් ඉල්ලා සිටි ආකාරය පිළිබඳව තවත් කාන්තාවක් විස්තර කළාය. එවැනි අවස්ථාවන්හිදී, නාමයෝජනා අදියරේදී කාන්තාවන් ක්‍රියාවලියෙන් බැහැර කරන දොරටු පාලක යාන්ත්‍රණය බවට දේශපාලන පක්ෂ පත්විය.

දේශපාලන පක්ෂ විසින් නාමයෝජනා ලබා දුන් කාන්තාවන් පිළිබඳ කතාන්දර මගින් බොහෝ විට කියා සිටින්නේ පක්ෂ විසින් දැනට සිටින සාමාජිකයින්ගේ පවුල්වලට හෝ ඥාතීන්ට සැලසුම් නොකරන ලද ආකාරයන්ට නාමයෝජනා ලබා දුන් බවයි. බාහිර දේශපාලන හේතූන් මත නාමයෝජනා ලබා දුන් "සුදුසුකම් නොලත්" කාන්තාවන් තෝරා ගැනීම තුළින් කෝටාවේ අරමුණ පරාජයට පත් වූ බවට වන අදහස පහසුවෙන් ඉදිරිපත් කරන්නා වූ මෙම ආඛ්‍යානය මගින් ඇත්ත වශයෙන්ම කතාවේ කොටසක් පමණක් කියයි. දේශපාලන පක්ෂ විසින්ම පවතින දේශපාලන ව්‍යුහයන් හසුරුවන ලද ආකාරය සහ, ඔවුන් තම පීතෘමූලික නැඹුරුව තවදුරටත් තහවුරු කරගත් ආකාරය මෙමගින් සැලකිල්ලට නොගනී. නිදසුනක් වශයෙන්, එක් දේශපාලන පක්ෂ නියෝජිතයෙකු විසින් අපේක්ෂකයින් තෝරා ගත් නිශ්චිත ක්‍රියාවලිය තක්සේරු කිරීම දුෂ්කර බව පිළිගත් පසු, දේශපාලන පවුල්වලට සම්බන්ධ නොවන කාන්තා අපේක්ෂකයින් සොයා ගැනීම ඉතා අපහසු බව පෙන්වා දෙන ලදී. පක්ෂයක් ලෙස, ඔවුන්ගේ මූලික අවශ්‍යතාවය වූයේ පක්ෂය වෙනුවෙන් හැකි තරම් ඡන්ද ලබා ගැනීමයි (සහභාගීවන්නා 1, ව්‍යවස්ථාදායකයා). මෙයින් පෙනී යන්නේ අපේක්ෂකයන් ඉදිරිපත් කිරීම සඳහා පවතින දේශපාලන සම්බන්ධතා මත විශ්වාසය තැබීමට පක්ෂ නැඹුරු වූ බවත් පොදුවේ ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමයේ ආධිපත්‍යය දරන, දේශපාලන පවුල් සමඟ සම්බන්ධ වූ ක්‍රමයට නැවතත් වැටුණු බවත්ය. මෙය නොවැළැක්විය හැකි දෙයක් ලෙස සලකනු ලැබුවේ එම පක්ෂවලට පහසුවෙන්ම සම්බන්ධ කර ගත හැකි කාන්තාවන් ඔවුන් වූ බැවිනි. අමාත්‍යාංශ නිලධාරීන්ට පවා හැඟී ගියේ කෝටාව "පිරිමි දේශපාලනඥයන්ගේ භාර්යාවන්, දියණියන්, සහෝදරියන් සහ ඥාතීන් අතට පත් වූ" බවයි (සහභාගීවන්නා 7, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නා). එවැනි ආඛ්‍යාන මධ්‍යස්ථව සැලකිය යුතු වන්නේ ඒවා ප්‍රතිපත්ති සැලසුම්කරණයේ සහ පක්ෂ ක්‍රමයේ ඇති දුර්වලතාවයන්, තේරී පත් වූ හෝ පත් කරන ලද කාන්තාවන් වෙත මාරු කිරීමටත් පළාත් පාලන සභිකවරියන් සහ කෝටාව යන දෙකම තවදුරටත් ඒකාකෘතිකරණය කිරීමටත් නැඹුරු වන බැවිනි.

ප්‍රාදේශීය දේශපාලනඥයන්ගේ පවුලේ සාමාජිකයන් වූ, අත්දැකීම් අඩු කාන්තාවන් පළාත් පාලන මන්ත්‍රීවරුන් වූ බවට වන ඒකාකෘතිය ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගී වූ කාන්තාවන් විසින් බරපතල ලෙස අභියෝග යට ලක් කරන ලදී. ඔවුන්ට තම පක්ෂයෙන් නාමයෝජනා ලබා දුන් හේතු ලෙස සිතන්නේ මන්දැයි අප ඔවුන්ගෙ න් විමසූ විට, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් පෙන්වා දුන්නේ ඔවුන් තම ප්‍රජාව තුළ දේශපාලනිකව ක්‍රියාකාරී බව ය. ප්‍රාදේශීය දේශපාලන පසුබිම තුළ, පවුල වැනි අනුග්‍රාහක ජාලයකට සම්බන්ධ වීම සැබවින්ම සෘණාත්මක ලෙස අත්‍යවශ්‍යයෙන්ම දැකිය යුතු නොවේ. ප්‍රාදේශීය දේශපාලකයන් සමග සමීප වීම හේතුවෙන් බොහෝ කාන්තාවන් සමාජ හා ප්‍රජා කටයුතුවල නිරත වූහ. බොහෝ විට, මෙම දේශපාලනික සබඳතා ඇති කාන්තාවන් ඔවුන්ගේ ප්‍රජාවන් තුළ ක්‍රියාකාරී සාමාජිකයන් වූ අතර, යුද්ධයේදී සහ සුනාමියෙන් පසුව ඔවුන් පුහුණු වූ අතර, ප්‍රජා මූලික සංවර්ධන මුලපිරීම් මගින් ක්‍රියාකාරී සංවිධායකයින් ලෙස ඒ වනවිටත් බලමුලු ගන්වා තිබුණි. ඔවුන් සියලු දෙනාම පාහේ දශකයක පමණ අත්දැකීම් (සමහර විට ඊටත් වඩා) පක්ෂය තුළට ගෙන ආහ. ඔවුන් ඉහළ අධ්‍යාපනයක් නොලැබූ අවස්ථා වලදී පවා, ඔවුන් යම් හේතුවක් නිසා තෝරා ගන්නා ලද අතර, ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම ඔවුන්ගේ කාර්ය සාධනයට සැමවිටම බලපාන බවක් පෙනී ගියේ නැත. මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡාවට එක්වූ ඇතැම් දේශපාලන පක්ෂ නායකයින් විසින් පිළිගත් ආකාරයට ඔවුන්ගේ පක්ෂ තුළට ගෙන ආ, ප්‍රජාව තුළ ක්‍රියාකාරී කාන්තාවන්ට ඔවුන් විසින් නාමයෝජනා ලබා දුන් විට කාන්තාවන් හොඳින් කටයුතු කළහ. එක් සහභාගිවන්නෙක් පැවසුවේ, "එය ප්‍රජාව

අතර උද්යෝගය සහ පිළිගැනීම ඇති කළ බව පිළිගැනීමට අකමැත්තෙන් වුවද මට බල කෙරෙයි" (සහභාගීවන්නා 2, ව්‍යවස්ථාදායකය) යනුවෙනි. මෙම අධ්‍යයනය නිගමනය කරන්නේ එවැනි කාන්තාවන්ගේ අරගල, ප්‍රමුඛ ආඛ්‍යානයෙන් ඉවත් වන බවත්, ඔවුන්ගේ ජයග්‍රහණ සහ අභියෝග අඩුවෙන් නිරූපණය වන බවත්, නැතහොත් නාමයෝජනා සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීම විස්තර කිරීමේදී ව්‍යතිරේකයක් ලෙස ඒවා සලකන බවත්ය.

බොහෝ විට පළාත් පාලන මට්ටමේ දේශපාලනය අභිබවා යන ජාතික මට්ටමේ දේශපාලන ප්‍රචාරණයන් සහ ජාතික මට්ටමේ දේශපාලන චරිතවල අධිකාරිය මගින් කාන්තා අපේක්ෂකයින් ද බලපෑමට ලක් විය. 2018 පළාත් පාලන මැතිවරණයේදී සමහර අපේක්ෂකයින් විසින් "ඔවුන්ගේ ඡායාරූප පවා ප්‍රචාරක ද්‍රව්‍යවලට නොදැමූ බවත්, ඒ වෙනුවට තම පක්ෂ නායක මහින්දගේ ඡායාරූපය (සහභාගි වන්නා 3, ව්‍යවස්ථාදායකයා) දැමූ බවත් සම්මුඛ සාකච්ඡාවකට එක් වූ මන්ත්‍රීවරයෙක් කියා සිටියේය. අපේක්ෂකයන්ට නොව පක්ෂයට පමණක් ජනතාව ඡන්දය දුන් ආකාරය සහ මෙම මැතිවරණය "මහින්ද නැවත බලයට ගෙන ඒමේ පඩිපෙළ" ලෙස නම් කළ ආකාරය ඔහු පෙන්වා දුන්නේය. ඔහු පැවසුවේ ඇල්ල ප්‍රාදේශීය සභාවේදී "මැතිවරණයට සති තුනකට පෙර අපේක්ෂකයෙකු මිය ගිය නමුත් එම මියගිය පුද්ගලයා මැතිවරණයේ දී ජයග්‍රහණය කළ බවයි. ජනතාව ඔහුට ඡන්දය දුන්නේ මහින්ද රාජපක්ෂ නැවත බලයට ගෙන ඒමට අවශ්‍ය නිසාය" (සහභාගීවන්නා 3, ව්‍යවස්ථාදායකයා). මේ අනුව, පක්ෂයේ ජාතික මට්ටමේ සහයෝගය සහ ඡන්ද පදනම පළාත් පාලන මැතිවරණය කෙරෙහි ගැඹුරු බලපෑමක් ඇති කළ අතර, ග්‍රාමීය අපේක්ෂකයින්ට, විශේෂයෙන් ඔවුන් කාන්තාවන් නම්, කෝටාව පිළිබඳ සාහිත්‍යයේ සඳහන් පරිදි පරමාදර්ශී චරිත (මෙම වචනය පිළිබඳ පැහැදිලි කිරීමක් සඳහා මෙම වාර්තාවේ 1.2 කොටස බලන්න) ගොඩනැගීමට අවස්ථාවක් නොතිබුණි. ඒ වෙනුවට, අපේක්ෂකයින් විසින් පක්ෂයේ සහ ජාතික මට්ටමේ සිටින නායකයින්ගේ ප්‍රභාව මත විශ්වාසය තැබිය යුතු බවට අපේක්ෂා කළ අතර, උදාහරණයක් ලෙස බදුල්ල ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවේ දී සහභාගී වූවන් විසින් පෙන්වා දුන් පරිදි, එක් එක් අපේක්ෂකයා කවුරුන්ද යන්න එතරම් වැදගත් නොවන බව පෙනුණි.

ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලද ප්‍රදේශයන්හි, මැතිවරණය සඳහා කාන්තාවන් නම් කිරීමේ ක්‍රියාවලිය සැලසුම් විරහිතව සිදු වූ අවස්ථා පිළිබඳව සහභාගිවන්නන් විසින් හෙළි කළහ. බොහෝ කාන්තා අපේක්ෂකයින් සඳහා තරඟ කිරීමට තීරණයක් ගැනීම කෙතරම් සංකීර්ණද යන්න සහ අවසාන මොහොතේ කාන්තාවන්ට බලහත්කාරයෙන් නාමයෝජනා දිය නොහැකි බව දේශපාලන පක්ෂ සම්පූර්ණයෙන්ම නොසලකා හරින ලද ආකාරය පිළිබඳ අවබෝධයක් පහත උපුටා දැක්වීම මගින් සපයයි:

> ප්‍රමාණවත් තරම් කාන්තාවන් සඳහා නාමයෝජනා ලබා නොදුනහොත්, තමන්ට තරග කිරීමට නොහැකි වන බව මේ දේශපාලනඥයන්ට නොතේරුණි. එය ඔවුන්ට වැටහුණේ අවසන් මොහොතේය. ඒ අවසන් මොහොතේ පමණක් කාන්තාවන්ට ඇවිත් තරග කරන්න කියලා ඔවුන් බැගෑපත්ව ඉල්ලා සිටියා [""] පසුදා උදේ නාමයෝජනා ලබා දෙන දිනයයි, ඔවුන් හවස ඇවිත් අපිට තරග කරන්න කියනවා. මෙම කාන්තාවන්ට පවුල සූදානම් කිරීමට අවශ්‍ය විය, ඔවුන්ගේ පවුලේ අයගේ සහයෝගය ලබා ගැනීමට ඔවුන්ට අවශ්‍ය විය. මේ කාලය පුරාවටම ඔවුන් පුහුණුව ලැබූ නමුත් කුමන දේශපාලන පක්ෂයක් තෝරාගත යුතු දැයි ඔවුන් කිසි විටෙකත් සිතුවේ නැත. මම තෝරන දේශපාලන පක්ෂයට මගේ පවුලේ අය සහයෝගය දෙයිද? මගේ සහෝදරයා ඉන්නේ එකම දේශපාලන පක්ෂයේද? [""] අවසාන කරුණ වූයේ කාන්තාවන්ට ඔවුන්ගේ පවුල්වල සහයෝගය අවශ්‍ය බවයි. තීරණාත්මක තීරණයක් ගැනීමට ඔවුන්ට පැය අටක් ලබා දීමට ඔබට නොහැකි අතර පසුදා උදෑසන ඔබ අත්සන් ලබා ගැනීම සඳහා පැමිණේ. මම හිතන්නේ ඒකෙන් තමයි පසුබෑම පටන් ගත්තේ. ඊට පස්සේ මේ පක්ෂ අහඹු ලෙස කාන්තාවන් තමන්ගේ ලැයිස්තුවට දාන්න පටන් ගත්තා. මෙම කාන්තාවන්ගෙන් බොහෝ දෙනෙක් ඔවුන්ව ලැයිස්තුවකට ඇතුළත් කළේ ඇයිදැයි යන්න පවා දැන සිටියේ නැහැ [...] පැය 24 කට අඩු කාලයකදී එවැනි තීරණ ගැනීමට ඔවුන් කාන්තාවන් වන අපෙන් ඉල්ලා සිටින්නේ කෙසේද? එම තීරණ ගැනීමට ඔවුන්ට කොපමණ කාලයක් ගත යුතුව තිබුණාද? (සහභාගීවන්නා 5, සිවිල් සමාජය).

තවත් තැන්වල, දශක ගණනාවක් තිස්සේ පක්ෂයෙන් කොන් වූ කාන්තාවන්ට පක්ෂ විසින් අවසානයේ සහන ලබා දුන්නේය. නිදසුනක් වශයෙන්, 1987-89 කාලය තුළ ඇය පක්ෂයට සම්බන්ධ වීම නිසා දරුණු ශාරීරික හානියකට, වාචික හිංසනයන්ට සහ ජීවිතයට තර්ජනවලට ලක් වූ ආකාරයත්, නමුත් කෝටාව හඳුන්වා දෙන තුරු ඇයට කිසි විටෙකත් නාමයෝජනා ලබා නොදුන් බවත් ගාල්ල කණ්ඩායම් සාකච්ඡාවේදී, එක් දිගුකාලීන පක්ෂ සාමාජිකාවක් විසින් විස්තර කරන ලදී. සෑම ආඛ්‍යානයකදීම, අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් කිරීමට තරම් "හොඳ" කාන්තාවන් නොමැති

බවට දේශපාලන පක්ෂ විසින් කරන ලද ප්‍රකාශය අසත්‍යයක් පමණක් නොව අසාධාරණ බවත් පෙන්වමින්, සිය පක්ෂ විසින් ඔවුන්ව කොන් කර තිබූ ආකාරය පිළිබඳව කාන්තාවෝ කතා කළහ. නාමයෝජනා ක්‍රියාවලිය කඩිමුඩියේ සිදු වූ බව පෙනෙන්නේ, සුදුසු කාන්තාවන් හඳුනා ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී සහ විනිවිදභාවයෙන් යුත් තේරීම් ක්‍රමයක් ඇති කිරීමට පක්ෂ අකමැති වූ නිසාවෙන් පමණක් බව පෙනේ.

## දේශපාලනයේ දී කාන්තාවන්ට එරෙහිව සිදු වන ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ එයට ප්‍රතිචාර දැක්වීම

දේශපාලනඥයන් පිරිමින් හෝ කාන්තාවන් හෝ වුවද, ඔවුන්ගේ ජීවිත නැති කරමින් සහ ඔවුන්ගේ ජීවිත වලට පහර දෙමින්, ශ්‍රී ලංකාවේ දේශපාලනය දිගු කලක් තිස්සේ ප්‍රචණ්ඩත්වයේ ගිලී පවතී. එසේ වුවද, මාර්ගගත සහ මාර්ගගත නොවන වාචික අපයෝජන, සහ ජීවිතයට සහ පවුලට ඇති තර්ජන වැනි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වයන් අනාවරණය කර ගැනීමට අධ්‍යයනය තුළින් හැකි විය. තමන් මාර්ගගත සහ මාර්ගගත නොවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට සහ හිංසනයට ලක් වූ ආකාරය පිළිබඳව කාන්තා අපේක්ෂිකාවන් කිහිප දෙනෙක් විස්තර කළහ. කාන්තාවන්ට එරෙහි හිංසනයට අදාළව දේශීය හා ජාත්‍යන්තර නීති කිහිපයක් තිබුණද, කාන්තාවන් විසින් ඡන්ද ව්‍යාපාර ආරම්භ කිරීමෙන් පසුව, කාන්තාවන් (සහ සංස්කෘතික සුළුතරවලට අයත් කාන්තාවන්) ඉලක්ක කර ගනිමින් අන්තර්ජාලය හරහා සිදු කරන අපවාද සහ වෛරී ප්‍රකාශ පාලනය කිරීමට අපහසු විය. එකල පැවති නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදවල පැවති දුර්වලතාවය මෙයින් සනාථ විය. තමන්ට නින්දා අපහාස කළ ආකාරය, තමන්ට එරෙහිව සමාජ මාධ්‍ය ප්‍රචාර දියත් කළ ආකාරය සහ ඇතැම් විට ශාරීරික තර්ජනවලට පවා ලක් වූ ආකාරය බොහෝ කාන්තාවන් විසින් විස්තර කළහ. “මම මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදු කළොත් ඔවුන් මගේ පවුලට පහර දෙන බව මට කිව්වා. මාධ්‍යවල සහයෝගයේ අඩුවක් තිබුණා, නමුත් පිරිමි අපේක්ෂකයන්ට සහාය ලැබුණා” යනුවෙන් එක් කාන්තාවක් පැහැදිලි කළාය (යාපනය FGD). කාන්තා අපේක්ෂිකාවන්ට එරෙහිව සිදුවන හිංසනය හා ප්‍රචණ්ඩත්වය වැළැක්විය හැකි නීතිමය ක්‍රියාමාර්ගද නොතිබුණි. ප්‍රචණ්ඩත්වය අවුලුවන වෛරී ප්‍රකාශ පැතිරීම වැලැක්වීම සඳහා ෆේස්බුක් සමග සම්බන්ධීකරණයක් ඇති කරගැනීමේ නිසි යාන්ත්‍රණයක් නොමැතිකම 2018 මාර්තු මාසයේදී දිගන ප්‍රදේශයේ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය පුපුරා යාම තුළින් ඉස්මතු විය. මෙම සිද්ධියෙන් පසුව පවා නිසි ගෘහස්ථ යාන්ත්‍රණයක් නොමැතිකම හේතුවෙන් 2018 පළාත් පාලන මැතිවරණයේදී කාන්තා අපේක්ෂිකාවන්ට එරෙහිව සිදු කරන ලද මාර්ගගත අපවාද සහ චරිත ඝාතන සම්බන්ධයෙන් ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට නොහැකි විය. අපේක්ෂකයින් සහ ඔවුන්ගේ ආධාරක ජාල සතුව පුහුණුව සහ දැනුම නොමැතිකම හේතුවෙන් සහ සමාජ මාධ්‍ය ජාලා ප්‍රතිචාර දැක්වීමේදී ඇති වන දිගු ප්‍රමාදයන් සහ ඒවායේ ස්වයංක්‍රීය ‘ප්‍රජා ප්‍රමිතීන්‘ හේතුවෙන් මෙම අවාසිදායක තත්ත්වය තවත් උග්‍ර විය.

මැතිවරණ ප්‍රචාරක කටයුතු අතරතුරදී කාන්තාවන්ට එරෙහිව සිදු කරනු ලබන ප්‍රචණ්ඩත්වය සහ හිංසනය පුද්ගල අයිතීන් උල්ලංඝනය කිරීමක් ලෙස හෝ මැතිවරණ නීතිය උල්ලංඝනය කිරීමක් ලෙස සැලකිය යුතුද යන්න සම්බන්ධයෙන් ද පැහැදිලි බවක් නොතිබුණි. සාමාන්‍යයෙන්, එවැනි ප්‍රචණ්ඩත්වයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී එය හිංසනයක් ලෙස සැලකීම වෙනුවට මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් ලෙස සලකන ලද අතර එම ගැටළු සහ පැමිණිලි බොහෝ විට ඉවත දමන ලදී. (සහභාගීවන්නා 4, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නා). මැතිවරණ කාලවලදී සිදුවන හිරිහැර හා ප්‍රචණ්ඩත්වයට එරෙහිව නීති තිබුණත් එමගින් කාන්තා අපේක්ෂිකාවන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබාදීමට නොහැකි වූ බව මෙයින් පැහැදිලි වේ.

නාමයෝජනා භාරදීමේදී ක්‍රියාවලියේ දී අපේක්ෂිකාවන් විසින් මුහුණ දුන් මෙම දුෂ්කරතා මධ්‍යයේ වුවද, ඔවුන් තම මැතිවරණ ව්‍යාපාරය විශිෂ්ට ඉගෙනුම් අත්දැකීමක් ලෙස හඳුනාගත් ආකාරය පිළිබඳ කරුණු ඉදිරිපත් කළහ. විශේෂයෙන්ම පොදු සමාජය විසින් මැතිවරණයට පෙර සහ පසුව ඔවුන්ට සලකන ආකාරය අතර පවතින වෙනස ද ඔවුන් හඳුනා ගත්හ. මේ අනුව, ඔවුන් ආරක්ෂා කිරීම සඳහා දේශපාලන පක්ෂ සහ නීතිමය රාමුවවක් ප්‍රමාණවත් පරිදි නොතිබුණ හෙයින්, මැතිවරණ ප්‍රචාරක ක්‍රියාවලිය කාන්තා අපේක්ෂකයින්ට දුෂ්කර වූ අතර, මැතිවරණ සමයේදී සහ පසුව ඔවුන්ට ලැබුණු අවස්ථාවන්ගෙන් කාන්තාවන් ප්‍රයෝජනයට ගත් ආකාරය සහභාගිවන්නන්ගේ ආඛ්‍යාන මගින් පෙන්නුම් කළේය. කෝටාව සම්බන්ධයෙන් එකගතාවයක් නොතිබූ බවට වන ප්‍රකාශ ඔවුන්ගේ අත්දැකීම් තුළින් අභියෝගයට ලක් විය. කෝටාව හරහා පැමිණි කාන්තාවන් එයට ප්‍රශංසා කළ අතර, ඔවුන්ට වෙනත් ආකාරයකින් නොලැබෙන

අවස්ථාවක් එමගින් ලබා දුන් බව ඔවුන්ට හැඟුණි. ඔවුන් බලාපොරොත්තු සහගතව සහ දැක්මකින් යුතුව කතා කළ අතර කිහිප දෙනෙක්ම කියා සිටියේ තමන් ලැබූ පුහුණුව හා අත්දැකීම් සමඟ පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන බවයි. කෝටාව අසාර්ථක බව ඔවුන්ට දැනුණේ නැති අතර එය අපකීර්තියට පත් වන කාරණාවක් ලෙස දුටුවේ නැත.

2

## 2.3. පශ්චාත් මැතිවරණ අත්දැකීම්

මේ වනවිට පළාත් පාලන මට්ටමින් කාන්තාවන් සඳහා සියයට 25 ක කෝටාව හඳුන්වා දී වසර පහක් ගත වී ඇති අතර කෝටාවෙහි සඵලතාවය පිළිබඳ විවාදය තවමත් සාකච්ඡා වෙමින් පවතී. මෙම කොටස තුළ හිටපු කාන්තා මන්ත්‍රීවරුන්ගේ, ක්‍රියාකාරීන්ගේ සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ දෘෂ්ටිකෝණයෙන් මෙම ප්‍රශ්නය දෙස බලනු ලැබේ. වර්තමාන කෝටාව තවදුරටත් වැඩිදියුණු කිරීම සහ අපේක්ෂා කළ හැකි වෙනස්කම් හෝ ගැලපීම් අනුව එහි අනාගතය සම්බන්ධයෙන් මෙම කොටස තුළ සාකච්ඡා කරනු ලැබේ.

### කොට්ඨාශ සහ ලැයිස්තු සාමාජිකයන්

තනතුරට පත් වූ පසු, බොහෝ කාන්තා පළාත් පාලන සභිකවරියන්ට ශ්‍රී ලංකාවේ පීතෘමූලික සහ ප්‍රචණ්ඩ දේශපාලන සංස්කෘතියේ යථාර්ථයන් සමඟ සටන් කිරීමට සිදු විය (ජයසුන්දර-ස්මිට්ස්, 2022). රැස්වීම්වලට සහභාගි වීමට සහ එලදායී ලෙස හැසිරීමට මුලදී ඔවුන් දැන සිටියේ නැති වුවා වුවත්, ක්‍රියාවලියේ යෙදීමෙන් ලද අත් දැකීමෙන් මෙන් ම ලබාගත් විවිද පුහුණු වැඩ සටහන් වලින් ද පළාත් පාලන සභිකවරියන් ඉගෙන ගත් බව පෙනේ. එසේ වුවද, පළාත් පාලන ආයතනයන්හි පැවති ප්‍රචණ්ඩ සංස්කෘතිය සහ ඔවුන් කාන්තාවන් ඉලක්ක කර ගැනීම සම්බන්ධයෙන් කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිකයෙකු විසින් ඉදිරිපත් කරන ලද පහත විස්තරයෙන් පැහැදිලි විය. කාන්තා සභිකවරියන්ට සභාවේ දී අදහස් ප්‍රකාශ කිරීමට ඉඩකඩ නොලැබුණු බව පැහැදිලි කල ඇය ප්‍රකාශ කළේ "පිරිමි මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු විසින් සභිකවරියන්ව (කෝටාවේ කොටසක් ලෙස පත් කරන ලද) "පිනා මන්ත්‍රීවරුන්" ලෙස හඳුන්වන බවයි (මෙම පරිභව කිරීමේ යෙදුම "නොමිලේ තේරී පත් වූ මන්ත්‍රීවරුන්" ලෙස ලිහිල්ව පරිවර්තනය කල හැක). කෝටාව නොමිලේ පැමිණෙන්නන්ගේ ලැයිස්තුවක් ලෙස අදහස් කරන ලද අතර, එය සිංහලෙන් අපහාසාත්මක ආකාරයෙන් "පින්-ලයිස්තුව" (නොමිලේ ලබා දෙන) ලෙස හැඳින්වීය. එයින් ඇඟවෙන්නේ ලැයිස්තුව හරහා නම් කරන ලද කාන්තාවන් නොමිලේ පැමිණි තැනැත්තන් බවයි. මෙම ගතිකයට අමතර අංගයක් ඇත. බොහෝ කාන්තා මන්ත්‍රීවරුන් "ලැයිස්තු කාන්තාවන්" වන අතර බොහෝ තැන්වලදී ලැයිස්තුවෙන් පැමිණි මන්ත්‍රීවරයාට වඩා කොට්ඨාශයෙන් තේරී පත්වූ මන්ත්‍රීවරයාට යටිතල පහසුකම් සංවර්ධන වැඩ කොන්ත්‍රාත්තු ලබා දීමේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ (ගාල්ල කණ්ඩායම් සාකච්ඡාව). කොට්ඨාශයක් නොමැති මන්ත්‍රීවරුන්ට මීළඟ මැතිවරණයේදී මන්ත්‍රීවරයාගේ අපේක්ෂකත්වයට සහාය වන ඡන්ද කොට්ඨාශයක් සොයා ගැනීමට නොහැකි වන බැවින් මෙම වෙනස හා සම්බන්ධ දිගුකාලීන බලපෑමක් ද ඇත.

ප්‍රතිපත්තිමය වශයෙන්, පළාත් පාලන ආයතන නීතිය මගින් කොට්ඨාශ මන්ත්‍රීවරුන් සහ ලැයිස්තු මන්ත්‍රීවරුන් අතර වෙනසක් හඳුනා නොගනී. එපමණක් නොව, තේරී පත් වූ පසු, පළාත් පාලන සභිකයන් නිශ්චිත දේශපාලන පක්ෂවල නියෝජිතයන් ලෙස නිල වශයෙන් පිළිගනු නොලැබේ. සැබවින්ම, මෙමගින් ලැයිස්තු මන්ත්‍රීවරුන් සහ කොට්ඨාශ මන්ත්‍රීවරුන් අතර සමානාත්මතාවය සහතික කළ යුතු අතර සියලුම මන්ත්‍රීවරුන්ට ඔවුන්ගේ අයිතිවාසිකම්වලට සමානව ලැබෙන වාතාවරණයක් ඇති කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රායෝගිකව, "නොමිලේ පැමිණි" මන්ත්‍රීවරුන්ගේ ඒකාකෘතිය තුළින්, ලැයිස්තු මන්ත්‍රීවරුන්ට වඩා කොට්ඨාශ මන්ත්‍රීවරුන් කෙසේ හෝ නීත්‍යානුකූල සහ වඩා සුදුසු වන්නේය යන අදහසට මග පාදයි. සමහරුන් අනෙක් අයට වඩා "නියෝජක" බවට පත් කරමින්, කොට්ඨාශ සහ ලැයිස්තු ක්‍රමය යන දෙකම, මෙම මැතිවරණ ක්‍රමය තුළ පවතින ප්‍රතිවිරෝධතාව මගින් තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ. සෑම කොට්ඨාශයකටම එම කොට්ඨාශයට සහ එහි ජනතාවට වගකියන මන්ත්‍රීවරයකු සිටිය යුතුය යන අදහසට ද මෙය සම්බන්ධ වේ. මෙම නියෝජනය පිළිබඳ සංකල්පය 2018 මැතිවරණයේදී සම්මත කරගත් මිශ්‍ර-මන්ත්‍රී සමානුපාතික මැතිවරණ ක්‍රමයෙන් පැන නගී. ලැයිස්තු සභිකයිනී පිළිබඳ මෙම පූර්ව විනිශ්චයෙහි හරය වන්නේ, කොට්ඨාශයකින් තේරී පත්වන මන්ත්‍රීවරයකු තම කොට්ඨාශයට අනෙක් අයට වඩා වගකිව යුතුය යන මැතිවරණ උපකල්පනයට එරෙහිව, මන්ත්‍රීවරුන් සමාන ලෙස සලකනු ලබන පළාත් පාලන මූලධර්මවලින් පැන නගින නොගැළපෙන මූලධර්ම දෙකක්ය.

## දේශපාලන මූල්‍යකරණය සහ අනුග්‍රහය

ශ්‍රී ලංකාවේ මැතිවරණ මූල්‍යකරණ ක්‍රමය ක්‍රියාත්මක වන්නේ දේශපාලන පක්ෂවල හෝ අපේක්ෂකයන්ගේ වාර්තා කරන ලද මූල්‍ය වියදම්වලට පරිබාහිරවය. සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලද බොහෝ කාන්තා පළාත් පාලන සභිකවරියන් කියා සිටියේ ඔවුන්ගේ පක්ෂය විසින් ඔවුන්ගේ ප්‍රචාරක කටයුතු සඳහා අයවැය ප්‍රතිපාදන ලබා නොදුන් බවයි. ඔවුන්ගේ පිරිමි සගයන්ට ද ඔවුන්ගේ මැතිවරණ ව්‍යාපාර සඳහා අයවැය ප්‍රතිපාදන සහය ලැබුණියයි සිතිය නොහැක. එසේ වුවද, සමහර අපේක්ෂකයින්ට පවුලේ හෝ යම් ව්‍යාපාරික සම්බන්ධතා වැනි අනුග්‍රාහක ජාලයක සාමාජිකයෙකු වීමේ කොටසක් වශයෙන් ඔවුන්ගේ ප්‍රාදේශීය නායකයින්ගෙන් සහයෝගය ලැබුණු බව සත්‍යයකි. ඇතැම් කාන්තා අපේක්ෂකයින්ද දේශපාලන පසුබිම්වලින් සහ සම්බන්ධතාවලින් පැමිණි අය නම් එවැනි ජාලවලින් ඔවුන්ටද ප්‍රයෝජන ලැබෙන නමුත්, එවැනි සබඳතා නොමැති කාන්තාවන්ට ඒ හා සමාන තත්ත්වයක් තුළ සිටින පිරිමින්ට වඩා විශාල අවාසියක් සිදු වේ. එවැනි අනුග්‍රහක ක්‍රමවලින් යුතු පුරුෂ මූලික සංස්කෘතිය අනුව, කාන්තාවන්ට වඩා පිරිමින්ට දේශපාලන වශයෙන් ජාලගත වීම පහසුය. මේ වන විට ද එවැනි ජාල සාමාජිකත්ව කාන්තාවන්ට වඩා පිරිමින් අතර බහුලව දක්නට ලැබේ. එපමණක් නොව, කාන්තාවන් එවැනි ජාලයකට අයත් වන විට පවා, එම ජාලයේම සිටින පිරිමි සාමාජිකයින්ට වඩා එම කාන්තාවන්ට මනාපය ලබා නොදෙනු ඇත. අපේක්ෂකයින් එවැනි ජාලයක සාමාජිකයන් නොවන විට, ඔවුන්ට ඔවුන්ගේ සමාජ ප්‍රාග්ධනය හෝ ඔවුන්ගේම මූල්‍ය මාර්ග භාවිත කිරීමට සිදුවේ. තවද, ශ්‍රී ලංකාවේ පවතින පාලන ව්‍යුහයන් තුළ, දේශපාලන නායකත්වයට සමීප වීම මගින් දේශපාලන අනුග්‍රහය සහ දේශපාලන දූෂණයට ඇති මාර්ග සඳහා ඇති ප්‍රවේශය තීරණය කරන්නේය (පීරිස්, 2022; කදිරගාමර්, 2010). පළාත් පාලන පද්ධතිය පුරා නායකත්වය කේන්ද්‍රීය සහ අනුග්‍රහය කෙරෙහි නැඹුරු දේශපාලන සංස්කෘතියක් පවතින අතර, එම පද්ධතිය සාමාන්‍යයෙන් දේශපාලන පක්ෂ ක්‍රමයේ පහළ මට්ටම් අතර සම්පත් බෙදා හැරීමේ ස්ථානයක් ලෙස සැලකේ.

මෙය අනුග්‍රාහක කවයෙන් පිටත සිටින ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම අභියෝගයකි. එසේ වුවද, කාන්තාවන් පිරිමින්ට වඩා දොරටු පාලනයට යටත් වන අතර, ඔවුන් ප්‍රාදේශීය හෝ ජාතික මට්ටමේ නායකයින්ට සමීප නොවන්නේ නම්, මෙම නීත්‍යානුකූල කරන ලද අනුග්‍රහ ව්‍යුහයන්ගෙන් බැහැර කරනු ලැබේ. දූෂණයට සහ අනුග්‍රහයට සමාන්තරව ගමන් කිරීම සඳහා මෙම ක්‍රමය මගින් පහසුකම් සලසන ආකාරය කුරුණෑගල කණ්ඩායම් සාකච්ඡාව සඳහා සහභාගී වූවන් හෙළි කළේය. ඔවුන්ට අනුව, සමහර මන්ත්‍රීවරුන් විසින් නිලධාරීන් සමඟ එක්ව, දේශීය යටිතල පහසුකම් සංවර්ධන කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති ප්‍රජා මූල බැංකු හරහා එවැනි ව්‍යාපෘති සිදු කරනු ලැබේ. ප්‍රජා මූල බැංකු (උදාහරණයක් ලෙස, ගොවි සංවිධාන හෝ වැඩිහිටි සමිති) වෙත යටිතල පහසුකම් ව්‍යාපෘති ලබා දී ඇති නමුත් මන්ත්‍රීවරුන් විසින් ඒවා සැබවින්ම ක්‍රියාත්මක කරන්නේ ඔවුන්ගේ හිතවත් කොන්ත්‍රාත්කරුවන් හරහාය. ප්‍රජා මූල බැංකු සඳහා මුළු කොන්ත්‍රාත්තුවෙන් සියයට දෙකේ සිට පහ දක්වා ප්‍රමාණයක් ලැබෙන අතර, මන්ත්‍රීවරයා සැබෑ කොන්ත්‍රාත්කරු බවට පත් වේ (කුරුණෑගල කණ්ඩායම් සාකච්ඡාව). මෙම අනුග්‍රාහක ජාලයන් සඳහා බොහෝ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගන්නා බැවින් පිරිමි ආධිපත්‍ය සංස්කෘතියක් තුළ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වෙත ප්‍රවේශ වීමෙන් කාන්තාවන් බැහැර කර ඇත.

## කාන්තා කමිටු පිහිටුවීම

පළාත් පාලන ආයතනවල කාන්තා කමිටු පිහිටුවීම යනු කෝටා ක්‍රමයේ කෙටුම්පත්කරුවන්ගේ මුල් සැලසුමේ කොටසක් නොවූ අතර සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ සැලසුම් තුළද එය ඇතුළත් නොවීය. අලුතින් පත් වූ කාන්තා මන්ත්‍රීවරුන් සඳහා වැඩි ඉඩප්‍රස්තාවක් නිර්මාණය කිරීමේ ක්‍රමයක් ලෙස, සමහර ක්‍රියාකාරීන් විසින් කාන්තා කමිටු පිහිටුවීමේ අදහස ගැන කල්පනා කළහ. එසේ වුවද, මෙම අදහස සම්බන්ධයෙන් අඛණ්ඩ ප්‍රතිරෝධයක් පැවති අතර එම අවාසිදායක සන්දර්භය දිගටම පැවතුනි. කාන්තා කමිටු පිහිටුවන ලද්දේ තරමක් ප්‍රමාද වී වන අතර එය සිදු කරන ලද්දේ පළාත් පාලන ආයතන කිහිපයක පමණි. එය සිදු වූයේ විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයට (OGP) වඩාත් විනිවිදභාවයකින් සහ විවෘත කමිටු ඇති කිරීමට තවත් තවත් උනන්දුවක් පැවති 2019-2021 කාලය තුළය. කාන්තා කමිටු පිහිටුවීමට උනන්දුවක් තිබූ ස්ථානවල පවා ඒ සම්බන්ධයෙන් නිලධාරිවාදී විරෝධයක් මෙන්ම සභාපතිවරුන්ගේ විරෝධයක් ද එල්ල විය. ආසන්න වශයෙන් කාන්තා කමිටු 60 ක් පමණක් අවසානයේ පිහිටුවන කරන ලද අතර, ඒවා සාපේක්ෂව ප්‍රමාද වී පශ්චාත් කොවිඩ් කාලපරිච්ඡේදය තුළ පිහිටුවන ලදී. මෙම කමිටු සඳහා ප්‍රතිපාදන වෙන් කළ ආකාරය ඇතුළු අයවැය යාන්ත්‍රණ ද විනිවිදභාවයෙන් යුක්ත නොවීය. එක් ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවක දී සභිකවරියක්:

"කාන්තා සාමාජිකයින්ගෙන් යුත් කමිටුවක් ඇත, නමුත් එයට අරමුදල් කිසිවක් ලබා නොදේ. සභාපතිවරයා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අයෙක් වන අතර ඔහු වෙනත් පක්ෂවල සභිකවරියක් සමඟ කිසිදු අරමුදල් බෙදා නොගනී" යනුවෙන් පැවසුවාය (ගාල්ල කණ්ඩායම් සාකච්ඡාව).

1987 අංක 15 දරන පළාත් පාලන පනත ප්‍රකාරව සෑම පළාත් පාලන අධිකාරියක් විසින්ම අවම වශයෙන් මූල්‍ය කමිටුවක් ඇතුළුව කමිටු හතරක් පිහිටුවීම අවශ්‍ය වේ. එසේ වුවද, මෙම විධිවිධානය බොහෝ විට ක්‍රියාත්මක වී ඇත්තේ අවම වශයෙන් කමිටු හතරක් පිහිටුවීම යන්න වෙනුවට බොහෝ පළාත් පාලන ආයතනවල කමිටු හතරක් පමණක් පිහිටුවා ඇති ආකාරයටය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නීතියෙන් නිශ්චිතව දක්වා ඇත්තේ කමිටු හතරක් පමණක් බව පවසමින් කාන්තා කමිටුවක් පිහිටුවීමට සමහර පළාත් පාලන ආයතන විරුද්ධ විය. සමහර සිවිල් සමාජ ක්‍රියාකාරිකයින් විසින් තම මැතිවරණ කොට්ඨාශයේ තෝරාගත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් හෝ කාන්තාවන්ට ක්‍රියාකාරීව සම්බන්ධ විය හැකි ආකාරයට කාන්තා කමිටු පිහිටුවීම දිරිමත් කිරීමට අමාත්‍යාංශයට බලපෑම් කළහ. සිවිල් සමාජයෙන් පැමිණෙන ඉල්ලීම්වලට ප්‍රතිචාරයක් වශයෙන්, විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2021 නොවැම්බර් 8 වැනි දින චක්‍රලේඛයක් නිකුත් කරමින් කාන්තා කමිටු පිහිටුවන ලෙස පළාත් පාලන ආයතනවලින් ඉල්ලා සිටියේය. මෙම පැහැදිලි කිරීමෙන් පසුව පවා, විවිධ හේතු දක්වමින් බොහෝ පළාත් පාලන ආයතන විසින් කාන්තා කමිටු පිහිටවූයේ නැත. නිදසුනක් වශයෙන්, ගම්පහ ප්‍රදේශයේ පළාත් පාලන කොමසාරිස්වරයෙකු විසින් ලේකම්වරයාගේ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් පනත මගින් කමිටු හතරක් පිහිටුවීම සඳහා පමණක් බලය ලබා දී තිබෙන බවට පවතින වැරදි මතය ඉදිරිපත් කරන ලදී. කාන්තා කමිටු පිහිටුවීමට උනන්දුවක් තිබූ ස්ථානවල පවා ඒ සම්බන්ධයෙන් නිලධාරිවාදී විරෝධයක් මෙන්ම සභාපතිවරුන්ගේ විරෝධයක් ද එල්ල විය. කාන්තා කමිටු සාක්ෂාත් කරගත්තේ කුමක්දැයි යන්න පිළිබඳව විමසූ විට, ප්‍රධාන ප්‍රතිචාරය වූයේ කෝවිඩ්-19 වසංගතය පැවති කාලය තුළ සිදු කළ ප්‍රජා කුස්සිය වැනි යම් සහයෝගීතා වැඩ සම්බන්ධයෙනි. සභිකවරියන්ට සහාය දැක්වීමට හෝ දේශපාලනය පිළිබඳ කාන්තා නැඹුරුවක් සහිත අදහසක් හඳුන්වා දීමට පළාත් පාලන ආයතනවල අනෙකුත් බොහෝ අංශ මෙන්ම මෙම කාන්තා කමිටුවලටද ප්‍රමාණවත් බලයක් හෝ පිටුබලයක් නොතිබූ බව පැහැදිලිය.

## දේශපාලන විශ්වාසය අඩුවීම

ප්‍රජා මූලික සංවිධාන සහ දේශපාලන පක්ෂ අතර සම්බන්ධය මගින් පළාත් පාලන මට්ටමින් මැතිවරණ ක්‍රම ක්‍රියා කරන ආකාරය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කළ හැකිය. එසේ වුවද, දේශපාලන පක්ෂ කෙරෙහි වැඩෙන අවිශ්වාසය සහ දූෂණය සම්බන්ධයෙන් ඔවුන්ගේ කුප්‍රකට තත්ත්වය සැලකිල්ලට ගෙන, බොහෝ ප්‍රජා මූලික සංවිධාන දේශපාලන පක්ෂ සමඟ සෘජුව කටයුතු කිරීමට මැලිකමක් දක්වති. විශේෂයෙන්ම බල සම්බන්ධතා විශාල කාර්යභාරයක් ඉටු කරන ප්‍රාදේශීය මට්ටමේදී මේ තත්වය පැහැදිලිව පෙනේ. දේශපාලන පක්ෂ සමඟ සම්බන්ධ වීමට අකමැති වීම හේතුවෙන් දිගුකාලීන අහිතකර ප්‍රතිවිපාක ඇති විය හැකිය. නිදසුනක් වශයෙන්, යම් කාන්තා නායිකාවක් යම් දේශපාලන පක්ෂයකින් මැතිවරණයට ඉදිරිපත් වූ පසු, ප්‍රජා මූලික සංවිධාන විසින් දේශපාලන පක්ෂ හෝ දේශපාලඥයන් සමඟ සම්බන්ධ වීමට අකමැති නිසා, කාන්තා නායිකාවන්ට තවදුරටත් ප්‍රජා මූලික සංවිධාන සමඟ ඔවුන් විසින් කලින් සිදු කරන ලද වැඩකටයුතු නැවත සිදුකළ නොහැකි බවට කාන්තාවන් කිහිප දෙනෙක් චෝදනා කළහ. දිගුකාලීනව, කාන්තා පළාත් පාලන සභිකවරියන් බිම් මට්ටම් සමඟ ප්‍රගතිශීලී සබඳතා ගොඩනගා ගත යුතු අතර, එවැනි සම්බන්ධතා ගිලිහීම ඔවුන්ගේ දේශපාලන අනාගතයට බෙහෙවින් හානිදායක විය හැකිය. මෙය දේශපාලන සංස්කෘතිය හේතුවෙන් සහ දේශපාලන පක්ෂ හා ප්‍රජා මූලික සංවිධාන අතර විශ්වාසය නොමැතිකම හේතුවෙන් ඇති වී ඇති ගැටළුවකි.

## සභිකවරියන්ගේ කාර්යභාරය සම්බන්ධයෙන් පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී අපේක්ෂා පිළිබඳ පැහැදිලිතාවක් නොමැතිකම

කෝටාව සමග සභිකවරියන් වැඩි වීම හේතුවෙන් කාන්තාවන් සම්බන්ධ සහ කාන්තාවන් කේන්ද්‍රගත වන කරුණු සහ කාන්තා ගැටළු සම්බන්ධයෙන් වැඩිපුර වැඩ කිරීමට කාන්තාවන් යොමු කරනු ඇතැයි සාමාන්‍ය අපේක්ෂාවක් ඇත (සහභාගිවන්නා 2, ව්‍යවස්ථාදායකය). ඇත්ත වශයෙන්ම, තේරී පත් වූ කාන්තාවන්ගේ නිශ්චිත භූමිකාව පිළිබඳ එවැනි ව්‍යාකූලත්වයන්, ප්‍රතිපත්ති සංවාදයේ පැවති පැහැදිලි නොමැතිකමට සමාන්තර වන අතර එහිදී කාන්තාවන් පළාත් පාලන ආයතනවලට පත් කළ යුතු බවට එකගතාවක් තිබුණද ඔවුන්ගේ භූමිකාව පිළිබඳව සම්මුතියක් නොතිබුණි.

එක් ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවක දී, කාන්තාවන් විසින් ප්‍රමුඛත්වය දිය යුත්තේ සාමාන්‍ය යටිතල පහසුකම් සංවර්ධනයට නැතිනම් කාන්තාවන් ඉලක්ක කරගත් ව්‍යාපෘතිවලට යන්න පිළිබඳව කාන්තාවෝ වාද විවාද ඇති කර ගත්හ (යාපනය කණ්ඩායම් සාකච්ඡාව). සමහර කාන්තාවන් තර්ක කළේ ඔවුන් තම පිරිමි සගයන් මෙන් ක්‍රියා කළ යුතු බව, විශේෂයෙන්ම ඔවුන්ගේ කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතු බවත්ය. කාන්තාවන්ගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු බව තවත් සමහරුන්ගේ අදහස විය. බස් නැවතුම් පොළ වැනි පොදු ස්ථානවල කාන්තාවන් සඳහා මව්කිරි දෙන ස්ථාන ඉදිකර ඇති ආකාරය පිළිබඳව පසුව සඳහන් කරන ලද කාන්තාවන් විසින් පෙන්වා දුන්නේය. සමහර විට, සභිකවරියන්ගේ ස්ත්‍රී පුරුෂසමාජභාවී අපේක්ෂාවන් පිළිබඳව කාන්තාවන් වශයෙන්, වඩාත් සැලකිලිමත් විය යුතු ප්‍රශ්න මොනවාද යන්න පිළිබඳ සමාජ සහ වාර්ගික ඒකාකෘති වෙත ආපසු හැරී ගියේය. තවද, කාන්තාවන්ට සෘජුවම බලපාන සෞඛ්‍යය සහ සනීපාරක්ෂාව වැනි ගැටළු වලට අලුතින් පත් වූ සභිකවරියන් අවධානය යොමු නොකළ බවට පක්ෂ නායකයින් සහ ලේකම්වරුන් නිතර අදහස් දැක්වූ අතර ඡන්දයෙන් තේරී පත් වුවද කාන්තාවන් විසින් වැඩි යමක් සිදු නොකළ බවට තවත් සමහරු චෝදනා කළහ. එක් පක්ෂ ලේකම්වරයෙකු පවා පෙන්වා දුන්නේ පළාත් පාලන ආයතනයන්හි සම්පූර්ණ අරමුණ වන්නේ සනීපාරක්ෂාව සම්බන්ධ ගැටළු විසඳීම බවත් සභිකවරියන් එය හඳුනා ගැනීමට අපොහොසත් වී ඇති බවත්ය (සහභාගීවන්නා 2, ව්‍යවස්ථාදායකයා). න්‍යායාත්මකව කාන්තාවන් විසින් වඩාත් කාන්තා නැඹුරු දේශපාලනයක් නිර්මාණය කළ යුතු බවට අපේක්ෂා කළද, ප්‍රායෝගිකව, මෙම ප්‍රතිවිරෝධී අදහස් හා අපේක්ෂා, පවතින ස්ත්‍රී පුරුෂ ඒකාකෘති රාමුව තුළට කොටු කරමින්, සභිකවරියන් අනාගත මැතිවරණ වලදී පිරිමින් හා සමානව තරඟ කළ හැකි සම මට්ටටමේ අපේක්ෂකයින් වීම වැලැක්වීමට මග පාදනු ඇත.

## දේශපාලන අත්දැකීම් නොමැතිකම

ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා අතරතුර මතු වූ තවත් කරුණක් වූයේ පෙර දේශපාලන අත්දැකීම් සහිතව ක්‍රියාවලියට පැමිණි අය සහ එසේ නොතිබූ අය අතර වෙනසක් තිබේද යන්නයි. කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන් සහ අමාත්‍යාංශ නිලධාරීන්ට හැඟී ගියේ කෝටාව හරහා තේරී පත්වන්නේ කුමන ආකාරයේ කාන්තාවන්ද යන්න සම්බන්ධයෙන් නිර්වචනය කිරීමට ප්‍රමාණවත් කාලයක් සහ අධ්‍යයනයක් වෙන් කර නොමැති බවත්, ඉහත සාකච්ඡා කළ පරිදි අත්දැකීම් නොමැති, උගත්කමක් නැති හෝ නූගත් කාන්තාවන් කෝටාව හරහා පළාත් පාලන ආයතනවලට ඇතුළු වූ බවත්ය. ඊට පටහැනිව, දේශපාලනයට පැමිණීමට අවශ්‍යතාවයක් තිබූ කාන්තාවන්ට කෝටාව නිසා තරඟ කිරීමට අවස්ථාවක් ලැබුණු බවත්, කාන්තාවන් නම් කරන ලද සැලසුම් විරහිත ක්‍රමය ඇත්ත වශයෙන්ම සමහර කාන්තාවන්ගේ වාසියට ක්‍රියා කළ බවත් ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා මගින් පෙන්නුම් කළේය. පක්ෂ විසින් අවසාන මොහොතේ තම ලැයිස්තු සකස් කළ නිසා එම පක්ෂ විසින් නාමයෝජනා ලබා නොදීමට ඉඩ තිබූ කාන්තාවන්ට පවා නාමයෝජනා ලබා දෙන ලදී. එක් ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවකදී, සභිකවරියන් පැවසුවේ, "ඊළඟ වතාවේ අපට ඒ අවස්ථාව ලැබෙන්නේ නැහැ" (පුත්තලම කණ්ඩායම් සාකච්ඡාව) යනුවෙනි. මන්ත්‍රීවරයෙකු වශයෙන් ඔවුන් ජීවිතය අත්විඳි ආකාරය අවබෝධ කර ගැනීමේදී, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ඔවුන්ගේ හැඟීම බෙදාහදා ගත් අතර, 2018 වන විට තිබූ ප්‍රචණ්ඩකාරී සහ අසමාන තත්වයට සාපේක්ෂව, මේ වනවිට කාන්තාවන්ට තරඟ කිරීම වඩාත් පහසු වාතාවරණයක් සකස් වී ඇති බව පිළිගත්තේය. මීට පෙර සභික ධුර සඳහා තරඟ කිරීමේ අත්දැකීම් ඇති අය එහි ඇති දුෂ්කරතා පිළිබඳව දැන සිටි අතර කෝටාව ලැබීම ගැන ස්තුතිවන්ත විය. කෝටාව ආශ්‍රයෙන් සිදු වූ සමහර බලගැන්වීම් හේතුවෙන් කාන්තා දේශපාලන පක්ෂයක් ආරම්භ කළ යුතු යැයි සමහර කාන්තා දේශපාලනඥයන්ට හැඟී ඇත. සිත්ගන්නා කරුණ නම්, කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගී වූ බොහෝ තැනැත්තන් ජාතික මට්ටමේ දේශපාලනයට පිවිසීමටත් සහ පාර්ලිමේන්තුවේ සේවය කිරීමටත් කැමැත්තක් දැක්වීමයි.

පෙර දේශපාලන අත්දැකීම් සහිතව පළාත් පාලන ආයතනවලට ඇතුළු වූ කාන්තාවන්ගේ සහ එසේ නොමැති කාන්තාවන්ගේ කාර්ය සාධනය අතර එතරම් වෙනසක් ඇති බවක් නොපෙනේ. නවක කාන්තාවන් ද මෙම ක්‍රියාවලිය තුළ ඉගෙන ගත් බවත්, ඔවුන්ගෙන් සමහරක් ඔවුන්ගේ දේශපාලන ජීවිතයට කැප වූ බවත් දත්ත තුළින් යෝජනා කරනු ලැබේ. ඇත්ත වශයෙන්ම, වඩා ප්‍රමාණාත්මක පර්යේෂණ සහ පුළුල් නියැදියකින් තොරව මෙය සාමාන්‍යකරණය කළ නොහැක. එක් ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවකදී, පළාත් පාලන ආයතනයන්හි සංයුතියට නව පිරිමි සහ කාන්තා මන්ත්‍රීවරුන් බහුතරයක් ඇතුළත් වූ විට, ඔවුන් සියල්ලන්ම අලුත් හෙයින්ද, සියලු දෙනාම ඉගෙන ගනිමින් සිටි හෙයින් ද අඩුවෙන් තමන් ව කොන් කරන බවක් ඔවුන්ට දැනුණු ආකාරය සම්බන්ධයෙන් සභිකවරියන් පැවසූහ (යාපනය කණ්ඩායම් සාකච්ඡාව). නමුත් කාලයත් සමඟ, තමන් ව කොන් කිරීමේ ක්‍රම වඩාත් මුල් බැසගත් විට, සභාවේ කටයුතු

කිරීම තමන්ට වඩාත් අභියෝගාත්මක වූ බව සභිකවරියන් ට හැඟුණි. තමන්ට නැවත නාමයෝජනා නොලැබෙන බවත්, පක්ෂයට වඩාත් කීකරු කාන්තා අපේක්ෂිකාවන් ඉදිරිපත් කිරීමට පක්ෂ කැමැත්තක් දක්වනු ඇති බවත් හැඟී ගිය ඇතැම් සභිකවරියන් ප්‍රකාශ කළ හැඟීම මෙහි දී ප්‍රතිරාවය වේ.

අත්දැකීම් වටා ගොඩනැගුණු විශාල ධුරාවලියක් පැවති ස්ථානවල, පිරිමි මන්ත්‍රීවරුන් විසින් සභිකවරියන්ගේ කුසලතා සහ දැනුම යටපත් කිරීමට උත්සාහ කළහ. එක් මන්ත්‍රීවරයෙක් කියා සිටියේ ඔවුන්ගේ සභාපතිවරයා සාක්ෂරතාව පවා නොමැති පුද්ගලයෙක් වූ බවත්, එහි සිටි කාන්තාවන් නවක වුවද (පුත්තලම කණ්ඩායම් සාකච්ඡාව) ඔවුන් සතුව පැවති දැනුම සමඟ කටයුතු කිරීමට ඔහුට නොහැකි වූ බවත්ය. තවත් හිටපු පළාත් පාලන සභිකවරියක් පැවසුවේ ඇයට මාධ්‍ය පිළිබඳ අත්දැකීම් තිබූ බවත්, එබැවින් අදාළ තොරතුරු සහ දැනුම සොයා ගන්නේ කෙසේදැයි දැන සිටි බවත්ය (සහභාගීවන්නා 3, සිවිල් සමාජය). කසළ කළමනාකරණය පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් පුහුණුවක් ලබා ගැනීමට ඇයට සහ තවත් සාමාජිකාවකට අවශ්‍ය වූ විට, ඔවුන්ගේ සභාව ඔවුන්ට සහාය දීම ප්‍රතික්ෂේප කළේය. ඊට ප්‍රතිචාර වශයෙන් ජපානයේ සංචාරයක් සඳහා ඔවුන් විසින් අරමුදල් රැස් කළ බවත්, එම විෂයය පිළිබඳව ඉගෙන ගත් බවත්, ඔවුන්ගේ අත්දැකීම් සමාජ මාධ්‍යවල පළ කළ බවත් ඇය පැවසුවාය. ඔවුන්ට දැන් විෂයය පිළිබඳ දැනුමක් ඇති නිසා හා ඔවුන් තම රැකියාවට ඇති කැපවීම ඔප්පු කර තිබූ නිසා ඔවුන් ආපසු පැමිණීමෙන් පසු කිසිවෙකු ඔවුන්ට අභියෝග නොකළ බව ඇය පැවසුවාය. එවැනි කථා තුළින් පෙනී යන්නේ කාන්තා පළාත් පාලන සභිකයන් විසින් ඔවුන්ගේ අත්දැකීම් නොමැතිකම අඩුපාඩුවක් ලෙස නොසැලකූ නමුත් එම අභියෝගවලට ජයගැනීමට සහ අවශ්‍ය කුසලතාවන්ගෙන් සහ දැනුමෙන් සන්නද්ධ වීමට මාර්ග සොයා ගත් බවයි. පළාත් පාලන මැතිවරණ අතුරු ව්‍යවස්ථා පිළිබඳව මනා අවබෝධයක් ලබාගෙන, පිරිමි සගයන්ට අභියෝග කිරීමට සහ තමන් ගේ භූමිකාවේ අවශ්‍යතා සපුරාලීමට කාන්තාවන් මැදිහත් වනවිට, ඔවුන් නීතිය පිළිබඳව ප්‍රමාණවත් තරම් දන්නා බව බොහෝ දෙනාට හැඟුණි.

මුල් අවදියේදී සමහර පළාත් පාලන ආයතනවල කතා කිරීමට හෝ ලියකියවිලිවලට අත්සන් කිරීමට ඉඩ නොදුන් ආකාරය පිළිබඳ කතාන්දර සභිකවරියන් විසින් බෙදා ගත් අතර, යම් යම් අවස්ථාවල, ඔවුන් රැස්වීම් වලට පැමිණීම වලක් වා, ගෙදර සිට ඉගෙන ගැනීමට, කියවීමට හා අත්සන් කිරීමට ඔවුන්ට ලිපි සහ ලේඛන ගෙදරට එවන බව පැවසීම, අත්‍යවශ්‍යයෙන්ම ඔවුන් දෙවන ශ්‍රේණියේ සාමාජිකයන් ලෙස ලෙස සැලකීමක් බවට අර්ථකථනය විය. සභිකවරියන්ට පිරිමි සගයන් විසින් ඉතා අගෞරවනීය ආකාරයෙන් අපහාස කරන ආකාරය සහ ආමන්ත්‍රණය කරන ආකාරය පිළිබඳව පැහැදිලි කරමින් එක් සහභාගිවන්නෙක් පැවසුවේ: "කාන්තාවන්ට සලකන ආකාරය නිසා, ඔවුන් ඉතා නිශ්ශබ්ද වී, භීතියට පත්ව, කොන් වී සිටියා" (සහභාගීවන්නා 3, සිවිල් සමාජය). නිදසුනක් වශයෙන්, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අපරාධමය වැරදි 14 කට වරදකරු වූ අතර සියලුම කාන්තා මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් නුසුදුසු ප්‍රකාශ සිදු කිරීම සම්බන්ධයෙන් ඔහු ප්‍රසිද්ධ විය (සහභාගීවන්නන් 3, සිවිල් සමාජය). එපමණක් නොව, සභාවලට සභිකවරියන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා බැරෑරුම් ලෙස නොසැලකූ අතර නිසි පිළිගැනීමක් හෝ සැලකිල්ලක් නොදක්වන ලදී. එක් සභිකවරියක් විසින් යෝජනාවක් ඉදිරිපත් කිරීමට උත්සාහ කළ ආකාරය ඇය විස්තර කළාය: "මම ගුරුවරියක් නිසා මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම සහ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සම්බන්ධ යෝජනා ඉදිරිපත් කළා. නමුත් ඔවුන් මගේ යෝජනා බැරෑරුම් ලෙස සැලකුවේ නැහැ" (කණ්ඩායම් සාකච්ඡාව, යාපනය). ඇයට අධ්‍යාපනයට ගෙන ඒමට අවශ්‍ය වෙනත් වෙනස්කම් මොනවාදැයි අප විමසූ විට, ගැහැණු ළමයින්ට ප්‍රජනන අයිතිවාසිකම් පිළිබඳව ඉගැන්වීමට අවශ්‍ය බව ඇය පැවසුවාය. එවැනි සභිකවරියන්, කාන්තා පළාත් පාලන මන්ත්‍රීවරුන් අක්‍රිය සහ අපැහැදිලි බවට වන සාමාන්‍ය ඒකාකෘතියට ප්‍රතිවිරුද්ධ ලෙසින් කටයුතු  කළ අතර, ඒ වෙනුවට, පළාත් පාලන ආයතන තුළ පවතින පීතෘමූලික සහ පක්ෂග්‍රාහී ව්‍යුහයන් මගින් සමාජය පිළිබඳ ඔවුන්ගේම දැක්ම සහ අවබෝධය යටපත් වූ ආකාරයට උදාහරණ සපයයි. .

පක්ෂ සීමාවන් හරහා වැඩ කිරීමෙන්, සභා කටයුතු පිළිබඳව තමන් ට අවශ්‍ය දැනුම ලබාගැනීමෙන් සහ ක්‍රීඩාවේ නීති ඉගෙන ගෙන ඒ සඳහා ඉතා වේගයෙන් අනුගත වීමෙන් සභිකවරියන් විසින් ඉහත ආකාරයට එවැනි වෙනස් කොට සැලකීම්වලට එදිරිව කටයුතු කළහ. සමහර සභිකවරියන් විසින් මෙම ක්‍රමය හරහා වැඩ කිරීමෙන් සහ ක්‍රමය සමග වැඩ කිරීමෙන් 'කාර්යයන් සිදු කර ගැනීමේ' උපාය මාර්ග සකස් කරන ලදී (උදාහරණ ලෙස සභාවලදී ඒකාබද්ධ යෝජනා ඉදිරිපත් කිරීමට පිරිමි සගයන් දිරිමත් කළ කාන්තා නායිකාවන්, හෝ තම පිරිමි සභාපතිවරයාට හෝ බලවත් පිරිමි මන්ත්‍රීවරුන්ට හිතාමතාම ඔවුන්ගේ කාන්තා කමිටුවට සම්බන්ධ වන ලෙසට ආරාධනා කළ සභිකවරියන් සිටී) පුත්තලමේදී, කාන්තාවන් තම පිරිමි සගයන් සමඟ තරඟ කළ අතර, පිරිමින් විසින් තමන්ට අවශ්‍ය දේ ලබා ගැනීම සඳහා අවිධිමත් සමාජ ව්‍යුහයන් භාවිතා කළ ආකාරය හඳුනාගන්නා ලදී (පුත්තලම කණ්ඩායම් සාකච්ඡාව).

මේ අනුව, "සුදුසුකම් නැති" කාන්තාවන්ට නාමයෝජනා ලබා දී ඇති බවටත්, කෝටාවෙහි අභිප්‍රාය කඩාකප්පල් වී ඇති බවටත් වන ආඛ්‍යාන නොතකා, කාන්තා දේශපාලනඥයන් විසින් ඔවුන්ගේ මැතිවරණයෙන් පසුව සැලකිය යුතු නියෝජිතභාවයක් භාවිතා කළ කළ බව පෙනේ. ව්‍යාකූල ක්‍රියාත්මක කිරීමක් මධ්‍යයේ, කාන්තාවන් විසින් ඔවුන්ගේ නාමයෝජනා ලබා ගැනීම සඳහා සහ ඔවුන්ගේ තනතුරු සම්බන්ධයෙන්, පක්ෂවලට පමණක් නොව ඔවුන් නියෝජනය කළ ප්‍රජාවන් සමග ද සාකච්ඡා කිරීමට ඔවුන්ගේ නියෝජිතභාවය භාවිතා කල බව පෙනේ.

## 2.4. ඉදිරි අපේක්ෂා ↗

මෙම අධ්‍යනය සිදුකරන අවස්ථාව වන විට, සියයට 25ක කාන්තා කෝටාව එක් වාරයක් සඳහා ක්‍රියාත්මක වී ඇත. පසුගිය වසර කිහිපය තුළ, රටේ දේශපාලන සංස්කෘතිය කෙතරම් වෙනස් වී ඇත්ද යත්, ප්‍රතිසංස්කරණ කතිකාවතේ ආර්ථික ප්‍රතිසංස්කරණ ප්‍රමුඛස්ථානයක් ගනී. මෙම සන්දර්භය තුළ, කාන්තා කෝටාව ද මෙම අධ්‍යයනයේ වෙනත් තැන්වල සාකච්ඡා කර ඇති පරිදි ඇතැම් සෘණාත්මක ආඛ්‍යානවල ඉලක්කය වී ඇත. මෙම කොටසෙහි, කෝටාවන් පිළිබඳ යම් සාධාරණීකරණයන් සහ තීරණ ගැනීමේදී කාන්තා සහභාගිත්වය වැඩි දියුණු කිරීම සඳහා වන විකල්ප සම්බන්ධයෙන් සාකච්ඡා කෙරේ.

### කාන්තා නියෝජනය සහතික කිරීම සඳහා විකල්ප ආකෘති

කාන්තා කෝටාව ක්‍රියාත්මක කළ හැකි ක්‍රම කිහිපයක් තිබේ. පළමුවැන්න වන, දැනට ශ්‍රී ලංකාවේ භාවිතා වන ආකෘතිය මගින්, දේශපාලන පක්ෂයට හිමි වන ආසන සංඛ්‍යාව මත පදනම්ව කාන්තාවන් පත් කිරීමයි; දෙවැනි ආකෘතිය මගින් නාමයෝජනා ලැයිස්තුවේ ඇතැම් ආසන හෝ ස්ථාන කාන්තාවන් වෙනුවෙන් වෙන් කරයි. එවැනි ආසන හෝ ස්ථාන විකල්ප රටාවන් මත පදනනම්ව ප්‍රකාශ කර ඇති බැවින්, මෙම ආකෘතිය බොහෝ විට සීබ්‍රා ආකෘති ලෙස හැඳින්වේ. මැතිවරණ ක්‍රම සාකච්ඡා කිරීමේ අදියරේදී, ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ විසින් දැනට පවතින ආකෘතියට වැඩි කැමැත්තක් දක්වා ඇති අතර, සමහර කාන්තා කණ්ඩායම් විසින් සීබ්‍රා ආකෘති වෙනුවෙන් අනුබල දෙන ලදී. ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලදී, බදුල්ල, කුරුණෑගල සහ ගාල්ල යන ප්‍රදේශවල සිටින සභිකවරියන් අනෙක් අයට වඩා වර්තමාන කෝටා ක්‍රමයට පැහැදිලිවම සහයෝගය දැක්වූහ. ඕනෑම කෙනෙකුට තමන්ගේම ප්‍රචාරක ව්‍යාපාරයක් ගොඩනගා ගැනීමට යම් පුරෝකථනයක් එහි අඩංගු වන අතර එහිදී කුසලතා සහිත අපේක්ෂකයින්ට වඩා හොඳ අවස්ථාවක් ලබා දෙයි. සීබ්‍රා ආකෘතියක්, සරල සහ ක්‍රියාත්මක කිරීමට පහසු වුවද, වඩාත් අත්තනෝමතික විය හැකි අතර දේශපාලන වෘත්තීන් ගොඩනැගීම සම්බන්ධයෙන් දේශපාලනඥයන් (පිරිමි සහ ගැහැණු යන දෙපාර්ශවයම) අධෛර්යමත් කරනු ඇත.

### වඩාත් ස්ථිර ක්‍රියාමාර්ගයක් සඳහා වන අවශ්‍යතාවය හඳුනා ගැනීම

බිම් මට්ටමේ පවතින යම් පද්ධතිමය සහ මුල් බැසගත් නියෝජනය සම්බන්ධ ඌනතාවයට විසඳුම් සෙවීම සඳහා කෝටා වල අවශ්‍යතාවය ප්‍රධාන ධාරාවේ දේශපාලන කතිකාව තුළ හඳුනාගෙන ඇත. උදාහරණයක් ලෙස, 2016 දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජිත කමිටුව (PRC) මහජනතාවගෙන් ඉදිරිපත් කිරීම් කැඳවීමට පටන් ගත්තේය. මහජන නියෝජිත කමිටුවේ නිර්දේශය වූයේ ඉතා නිශ්චිත, දේශපාලන හේතූන් මත ප්‍රාදේශීය මට්ටමින් කෝටා ක්‍රමය හඳුන්වා දිය යුතු බවයි:

> කාන්තාවන්, ප්‍රාදේශීය, සුළුතර (වාර්ගික හා සමාජීය යන දෙඅංශයම), තරුණයින් සහ දුප්පතුන් සඳහා වන කෝටාවක් මගින් ඇති කරනු ලබන අනිවාර්ය නියෝජනයක් හරහා, පළාත් පාලනයට සහභාගී වීමට හැකි වන පරිදි ග්‍රාම සභා ක්‍රමය සැලසුම් කළ යුතුය. ග්‍රාමෝදය මණ්ඩල ක්‍රමය යටතේ සිදු වූ පරිදි, ගමේ ප්‍රභූන්, ආණ්ඩු පක්ෂ නියෝජිතයන් සහ දේශපාලන තැරැව්කරුවන් විසින් ග්‍රාම සභා අල්ලා ගැනීම වැළැක්වීම සඳහා මෙය ඉතා වැදගත් වේ (PRC වාර්තාව, 2016, පිටුව 78).

PRC වාර්තාව තුළින් කෝටා සඳහා වන අවශ්‍යතාවය පෙන්වා දුන්නා පමණක් නොව, කාන්තා කෝටාව සම්බන්ධයෙන්ද අවසානයේ ප්‍රධාන ගැටලුවක් බවට පත්වන්නේ කුමක්ද යන්න පිළිබඳව එමගින් හඳුනාගෙන ඇත: ප්‍රාදේශීය මට්ටමේ ඥාති සංග්‍රහය සහ ප්‍රභූ අවශ්‍යතා ප්‍රධාන ගැටළුව ලෙස එහි දක්වා තිබේ. මින් පෙනී යන්නේ ප්‍රාදේශීය මට්ටමේ බල ව්‍යුහයන් පිළිබඳ අවබෝධයක් ලබා දෙන නියෝජනයක් කමිටුවේදී ඉදිරිපත් කර ඇති බවයි. එක් සහභාගිවන්නෙකු

පෙන්වා දුන් පරිදි, "මට මතකයි පුළුල් ලෙස ඉදිරිපත් කිරීම් ලිව්වා ... බොහෝ කණ්ඩායම් ඔවුන් නීතිය නොදන්නා බව පැවසූ නිසා පසුබට වුණා," ඇය කියා සිටියේ තම කණ්ඩායම කොමිසමට යන ලෙස කාන්තා කණ්ඩායම්වලට බල කරමින් රට පුරා ගිය බවයි. "එවිට, මෙම කාන්තා කණ්ඩායම් පුළුල් ලෙස බලමුලු ගැන්වූ අතර, ඔවුන් අතර නියෝජනයක් සිදු වන පරිදි ඉල්ලීම් රාශියක් ඉදිරිපත් කරන ලදී" යනුවෙන් ඇය ආවර්ජනය කළාය (සහභාගිවන්නිය 6, සිවිල් සමාජය). කාන්තා කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද විශාල නියෝජනයන් සම්බන්ධයෙන් PRC විසින් සටහන් කරන ලදි. මෙම විශේෂිත සන්දර්භය තුළ කාන්තා කෝටාව සඳහන් කළ යුතු වීමෙන් පෙන්නුම් කරන්නේ සාධාරණ නියෝජනයක් සඳහා ප්‍රමාණවත් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවයි. ස්ථිර ක්‍රියාකාරී කොමිසමක් ස්ථාපිත කළ යුතු බවට කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

## තරුණ කෝටාවන්

වැඩි වශයෙන් තරුණයන් විසින් මෙහෙයවන ලද 2022 රාජ්‍ය විරෝධී මහජන විරෝධතාවලින් පසුව, තරුණයින්ට පාලන තන්ත්‍රය තුළ වැඩි නියෝජනයක් තිබිය යුතු බවට වැඩෙන සම්මුතියක් පවතී. පාර්ලිමේන්තුවේ (ජනාධිපති කාර්යාලය, 2023) විවිධ ආංශික අධීක්ෂණ කමිටුවලට උපදෙස් ලබා ගැනීම සඳහා තරුණයින් පන්සියයක් ලැයිස්තුගත කර ඇති අතර තරුණ කෝටාවක් හඳුන්වා දීම සඳහා පෞද්ගලික මන්ත්‍රී යෝජනා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. තරුණ කෝටාව මැඩලමින් කාන්තා කෝටාව හඳුන්වා දුන් බවට පොදු වැරදි මතයක් තිබේ. 1990 අංක 254 දරන පළාත් පාලන මැතිවරණ පනත හරහා ක්‍රියාත්මක කරන ලද පළමු තරුණ කෝටාව 2012 පළාත් පාලන මැතිවරණ ප්‍රතිසංස්කරණ මගින් අනිවාර්ය නොවන්නක් බවට පත් කිරීම නිසා මෙම දුර්මතය පැන නගී. මෙය කාන්තා කෝටාව හඳුන්වා දීමට පෙර සහ රාජපක්ෂ ආණ්ඩුව සමයේදී සිදු විය. කාන්තා කෝටාව 2017 තෙක් හඳුන්වා නොදෙන ලදී. ශ්‍රී ලංකා ඉතිහාසය තුළ ප්‍රධාන ජන කණ්ඩායමක් සඳහා දේශපාලන නියෝජනයක් ලබා දුන් පළමු ස්ථිරසාර ක්‍රියාව මෙම පළමු තරුණ කෝටාවයි. එය කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම්වලට ස්ථිරසාර ක්‍රියාමාර්ගයක් (ඉහත සාකච්ඡා කර ඇත) ඉල්ලා සිටීමට පෙලඹවූ අතර, ඔවුන් එය දුටුවේ අපේක්ෂකත්වය සඳහා කාන්තාවන් ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලෙසය. මේ අනුව, කාන්තා කෝටාව පසුපසට තල්ලු කළ හැකි තරුණ කෝටාව සඳහා වන දේශපාලන තල්ලුව පිළිබඳව මෙම දිගු ඉතිහාසයට අනුව කියවිය යුතුය අතර මෙහිදී දෙකම එකවර සිදු විය නොහැකි සේ නොදකින අතර අතර එකක් අනෙකා යටපත් කරමින් පැමිණිය යුතු නොවේ.

## නිර්ණායක පදනම් කරගත් බඳවා ගැනීම්

කෝටාව යෝජනා කරන්නන් අතර මතභේදයට තුඩු දුන් තවත් කරුණක් වූයේ නිර්ණායක මත පදනම්ව සභිකවරියන් බඳවා ගැනීම හඳුන්වා දිය යුතුද යන්නයි. නිර්ණායක මත පදනම් වූ බඳවා ගැනීම සහ නාමයෝජනා යනු අන්තර්කරණයේ ජීවගුණය යටපත් කිරීමේ විභවයක් සහිත විවාදාත්මක අදහසකි. කෝටාව සඳහා වන ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම උදෙසා නිර්ණායක 30 කාන්තා කණ්ඩායම් විසින් ආරම්භයේ දී සකස් කළ ආකාරයත්, එය අවසානයේ පහ දක්වා අඩු කරන ලද ආකාරයත් එක් සහභාගිවන්නෙක් විසින් පෙන්වා දෙන ලදී (සහභාගීවන්නන් 3, සිවිල් සමාජය). කෙසේ වෙතත්, එවැනි නිර්ණායක පදනම් කරගත් බඳවා ගැනීම් ව්‍යවස්ථානුකූලව වෙනස් කොට සැලකීමක් වනු ඇති බව අමාත්‍යාංශ නිලධාරීහු පෙන්වා දුන්හ. උසස් සුදුසුකම් මත පදනම්ව කාන්තාවන් බඳවා ගැනීමට අපේක්ෂා කිරීම වැරදි සහ වෙනස් කොට සැලකීමක් ලෙස පෙනෙන නමුත්, එය හඳුන්වා දුනහොත්, එමගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන්නේද යන්න පිළිබඳව තීරණයක් ලබා ගැනීම සඳහා අවසානයේදී එය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමට සිදුවනු ඇත. නිර්ණායක මත පදනම් වූ බඳවා ගැනීම් ක්‍රියාවට නැංවිය හැකි තවත් ක්‍රමයක් නම්, අවසාන වශයෙන් කාන්තා අපේක්ෂකයින් නම් කරන දේශපාලන පක්ෂ හරහා වන අතර එය සිදු කළ හැක්කේ අවසානයේ පළාත් පාලන ආයතනයක් වෙත තේරී පත් විය හැක්කේ කාටද යන්න පිළිබඳව සීමා පැනවීම මගිනි. එසේ වුවද, කාන්තාවන් සම්බන්ධයෙන් පමණක් එවැනි නිර්ණායක පැවතීම වෙනස් කොට සැලකීමක් වන නමුත් ඒවා පිරිමින් දක්වා ව්‍යාප්ත කිරීම සඳහා පුළුල් දේශපාලන ක්‍රියාවලියක් සහ තාක්ෂණික ලෙස මනාව සකස් කිරීමක් අවශ්‍ය වනු ඇත.

## සීමා නීර්ණය සහ කාන්තා කෝටාව නිකුත් කිරීම

නීති සම්පාදකයින් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවලදී, ඔවුන් කෝටාවෙහි ඉතිහාසය විස්තර කරන ආකාරය තුළ සීමා නිර්ණය සහ කාන්තා කෝටාව අතර සම්බන්ධයක් ව්‍යංගයෙන් ඉස්මතු විය සීමා නිර්ණය සහ මිශ්‍ර සාමාජික සමානුපාතික නියෝජන මැතිවරණ ක්‍රමය මගින් දැනටමත් පළාත් පාලන සභික සංඛ්‍යාව වැඩි කිරීමට පවතින

අවශ්‍යතාව සඳහන් කර තිබුණු නමුත්, සභික සංඛ්‍යාව වැඩිවීම සම්බන්ධයෙන් කාන්තා කෝටාව සම්පූර්ණයෙන්ම වගකිව යුතු බවට බොහෝ විට වැරදි වැටහීමකට ලක්ව ඇත. එක් කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිනියක් ප්‍රකාශ කළ පරිදි, "අපි කෝටාව සම්මුතියට පත් කළ හැකි සීමා නිර්ණය ඇතුළු බොහෝ ප්‍රශ්න සමඟ කටයුතු කරමින් සිටියෙමු. සීමා නිර්ණය තුළින් මැතිවරණ කොට්ඨාශ අඩු කිරීමට හැකි බැවින් එය අප විසින් අවධානය යොමු කළ යුතු තවත් ක්‍රියාවලියකි" (සහභාගීවන්නා 6, සිවිල් සමාජය). සීමා නිර්ණය කිරීම තුළින් විශාල කොට්ඨාශ ඇති විය හැකි බවත්, ඒ හේතුවෙන් කාන්තා අපේක්ෂකයින්ට විශාල ප්‍රදේශවල ඔවුන්ගේ ප්‍රචාරණ කටයුතු ඵලදායි ලෙස පවත්වාගෙන යාම දුෂ්කර වනු ඇති බවත් (සහභාගීවන්නා, නීති සම්පාදක) නීති සම්පාදකයෙක් විසින් පෙන්වා දුන්නේය. එබැවින්, පහතින් වඩාත් විස්තරාත්මකව දක්වා ඇති සීමා නිර්ණය කිරීමේ ඉතිහාසය සහ කෝටාව සමග එහි තිබෙන සම්බන්ධතාවය සම්බන්ධයෙන් අවධාරණය කිරීම වැදගත් වේ.

2012 අංක 22 දරන පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) පනතට අනුව අලුතින් පිහිටුවන ලද මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික මැතිවරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සීමා නිර්ණය කමිටුවක් පත් කිරීම අවශ්‍ය විය. එම කමිටුව විසින් 2011 වසරේ තේරී පත් වූ පළාත් පාලන ආයතනවල කාලසීමාව ඉකුත්වීමෙන් මාස දෙකකට පසුව, එනම් 2015 ජූනි මාසයේදී සිය වාර්තාව භාර දුන්නේය. කේවල ක්‍රමය යටතේ සම්පූර්ණ කළ යුතු කොට්ඨාස 5,081ක් එම වාර්තාව මගින් හඳුනාගෙන ඇති අතර, සෑම කොට්ඨාසයකටම ප්‍රාදේශීය මට්ටමින් තේරී පත් වූ නියෝජිතයෙකු සිටින බව සහතික විය. එම 5,081 න් 4,573 ක් තනි කොට්ඨාසවලින් තේරී පත් වීමට නියමිතව තිබූ අතර කොට්ඨාස 241 කට මන්ත්‍රීවරුන් දෙදෙනෙකු බැගින් සිටිය යුතු විය. ශ්‍රී ලංකාවේ කොට්ඨාස නවයකට මන්ත්‍රීවරුන් තිදෙනෙකු බැගින් සිටිය යුතු විය. මෙම කොට්ඨාස 5,081 මගින් 2012 ප්‍රතිසංස්කරණයේ සඳහන් සියයට 70 ක FPTP සංරචකය සකස් වනු ඇත. තවත් මන්ත්‍රීවරුන් සියයට 30ක ප්‍රමාණයක් ලැයිස්තුවක් මගින් පත් කෙරෙනු ඇති අතර එමගින් සභික සංඛ්‍යාව 1525කින් වැඩි වනු ඇත. මෙයින් අදහස් කළේ පළාත් පාලන මට්ටමේ මන්ත්‍රීවරුන් 6,600ක පමණ සම්පූර්ණ සංඛ්‍යාවක් වේ.

පෙර මැතිවරණ ක්‍රමයට සාපේක්ෂව, මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික මැතිවරණ ක්‍රමයට මන්ත්‍රීවරුන් සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩි වීමක් - 2200ක් පමණ අවශ්‍ය විය. කෙසේ වෙතත්, සියයට 25ක කාන්තා කෝටාව හඳුන්වාදීම මගින් 2017 පළාත් පාලන ආයතන මැතිවරණ ප්‍රතිසංස්කරණවලින් පෙන්නුම් කරන පරිදි, මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික ක්‍රම යටතේ සියයට 60 සහ කේවල ක්‍රමයට 40% දක්වා සංශෝධනය කිරීම අවශ්‍ය විය. දැනට ක්‍රියාත්මක වන මෙම නව ක්‍රමය කුඩා/විකල්ප දේශපාලන පක්ෂවලට හිතකර ලෙස සැලකෙන්නේ ඔවුන්ට ඒ තුළ ඉහළ තරගයකට මුහුණ දීමට සිදු නොවන බැවිනි. මෙය විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ විෂය පථයට ඔබ්බෙන් වන අතර, එවැනි කථිකාවන් තුළින් කාන්තා කෝටාව කෙරෙහි දිගු කාලීන බලපෑම් ඇති වන බැවින් ඒ සම්බන්ධයෙන් කල්තියා කටයුතු කළ යුතුය.

3

# නිර්දේශ

සියයට 25ක කාන්තා කෝටාවෙහි වර්ථමාන සහ අනාගත ස්වරූපවලට වඩාත් සමීපව සම්බන්ධ, බලපෑමට ලක් වන සහ බලපෑම් කරන ප්‍රධාන අංශ තුන යටතේ මෙම අධ්‍යයනයේ නිර්දේශ වර්ගීකරණය කර ඇත. එම අංශ තුන වන්නේ දේශපාලන පක්ෂ, කෝටාව වෙනුවෙන් පෙනී සිටින්නන් (රජය/ආධාර දෙන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන/ප්‍රජා මූලික සංවිධාන) සහ කාන්තා මන්ත්‍රීවරුන්/පළාත් පාලන ආයතන වේ.

| | නිර්දේශය | ක්ෂේත්‍රය | | |
|---|---|---|---|---|
| | | කෝටාව වෙනුවෙන් පෙනී සිටින්නන් (රජය/පරිත්‍යාගශීලීන්/ රාජ්‍ය නොවන සංවිධාන/ප්‍රජා මූලික සංවිධාන) | දේශපාලන පක්ෂ | කාන්තා මන්ත්‍රීවරුන්/ පළාත් පාලන ආයතන |
| 1. | සියයට 25 ක කෝටාව සම්පූර්ණ වශයෙන්ම සාක්ෂාත් කරගැනීම උදෙසා අවශ්‍යවන්නා වූ පියවර ගැනීම මගින් පළාත් පාලන ආයතන තුළ කාන්තාවන්ගේ සංඛ්‍යාත්මක නියෝජනය අවම වශයෙන් දැනට නියම කර ඇති සියයට 25ක හෝ පවතින බවට සහතික කිරීම. | කාන්තා කෝටාවෙන් ලැබෙන ප්‍රතිඵල හඳුනාගනිමින් හා ඒ පිළිබඳව අවධාරණය කරමින් කාන්තා කෝටාව සඳහා තවදුරටත් සහය දීම.<br><br>පවතින කෝටාව තුළ පවතින තාක්ෂණික දෝෂ නිවැරදි කිරීමට කටයුතු කිරීම<br><br>වත්මන් සන්දර්භය තුළ, තරුණ කෝටාවට ප්‍රමුඛත්වය දීමට ඉඩ ඇති බැවින්, සියයට 25ක කාන්තා කෝටාව ආරක්ෂා කර ගැනීමේ ක්‍රම සෙවීමට ප්‍රගතිශීලීව කටයුතු කිරීම | සහයෝගීත්ව පාලන ආකෘතියක් තුළ ඒකාබද්ධව වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා දේශපාලන පක්ෂ දිරිමත් කිරීම. පවතින පක්ෂ ක්‍රමයට බාහිරින් සිටින අයට ද ප්‍රමාණවත් අධ්‍යාපන සහ පුහුණු අවස්ථා එවැනි ආකෘතියකට ඇතුළත් විය යුතුය.<br><br>දේශපාලනය තුළ පවතින ඥාති සංග්‍රහය සහ එහි බලපෑම අවම කිරීම සඳහා යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීමට දේශපාලන පක්ෂ දිරිමත් කිරීම | කෝටාවෙන් ලැබෙන ජයග්‍රහණ වාර්තා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදු කිරීම. |
| 2. | ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී සහභාගීත්වය, බල ව්‍යුහයන්, ක්‍රියාවලීන් සහ කාන්තාවන් ප්‍රවර්ධනය සහතික කිරීම සඳහා දේශපාලන පක්ෂ<br><br>තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම. | දේශපාලන පක්ෂ තුළ කාන්තාවන්ගේ හඬ පුළුල් කිරීම මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිපත්ති වර්ධනය කිරීමට දේශපාලන පක්ෂ දිරිමත් කිරීම සහ පහසුකම් සැලසීම.<br><br>ප්‍රචාරක මූල්‍යකරණය සඳහා අධීක්ෂණ පද්ධති ශක්තිමත් කිරීම. | පහත සඳහන් කාරණා ඇතුළුව  පක්ෂ තුළ ස්ත්‍රීපුරුෂ සමාජභාවී ප්‍රතිපත්ති දියුණු කිරීම:<br><br>• අභ්‍යන්තර පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම.<br><br>• ප්‍රචාරක මූල්‍යකරණය සහ දේශපාලන පක්ෂ මූල්‍ය විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම. | දේශපාලන පක්ෂවල ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් ශක්තිමත් කිරීම සඳහා එහි නායකත්වය ක්‍රියාකාරීව සම්බන්ධ කර ගැනීම. |

| | නිර්දේශය | ක්ෂේත්‍රය | | |
|---|---|---|---|---|
| | | කෝටාව වෙනුවෙන් පෙනී සිටින්නන් (රජය/පරිත්‍යාගශීලීන්/ රාජ්‍ය නොවන සංවිධාන/ප්‍රජා මූලික සංවිධාන) | දේශපාලන පක්ෂ | කාන්තා මන්ත්‍රීවරුන්/ පළාත් පාලන ආයතන |
| 3. | කාන්තා කෝටාවක් සම්මත කොට ක්‍රියාවට නැංවීමේ දී, එකිනෙක හා තරගකාරී වීම වෙනුවට, දේශපාලන පක්ෂ අතර එකගතා ප්‍රවර්ධනය දිරිමත් කිරීම. | සහයෝගී කෝටාවන් දියුණු කිරීමට දේශපාලන පක්ෂ දිරිමත් කිරීම සහ පහසුකම් සැලසීම. වෙනත් රටවල පක්ෂ අතර ඇති කරගෙන තිබෙන සම්මුතිය පදනම් කරගත් කෝටාවන් පිළිබඳව දේශපාලන පක්ෂ දැනුවත් කිරීම. | රජයේ සෑම ස්ථරයකම සම්මුතිය පදනම් කරගත් කෝටාවන් ක්‍රියාත්මක කිරීමට දේශපාලන පක්ෂ සහ පාර්ලිමේන්තු කාන්තා බල මණ්ඩලය දිරිමත් කිරීම. | ස්ත්‍රී පුරුෂ සමාජභාවී නියෝජනය වැඩි කිරීම සඳහා සහ පක්ෂ අතර කෝටා සඳහා ඇති ඉල්ලුම වැඩි කිරීම සඳහා කාන්තා පළාත් මන්ත්‍රීවරුන්ගෙන් සහ පළාත් සභිකයින්ගෙන් (පිරිමි මන්ත්‍රීවරුන් ද ඇතුළුව) යුක්ත පක්ෂ අතර සන්ධාන ඇති කිරීම. |
| 4. | කෝටාවක් වැනි ප්‍රතිජනනාත්මක ප්‍රතිපත්තියක් ඉල්ලීමක සිට ප්‍රතිපත්තියක් දක්වා පරිවර්තනය කිරීමේ සංකීර්ණත්වය පිළිබඳ අවබෝධයක් ඒවායේ යෝජකයින් අතර ඇති බව සහතික කිරීම සහ ඔවුන් අතර සම්මුතිය ප්‍රවර්ධනය දිරිමත් කිරීම මඟින්, එවන් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිකයක් දේශපාලන පක්ෂවල හෝ ඒවායේ ප්‍රධාන පුද්ගලයන්ගේ අභිලාෂයන්ට සීමා නොවන බව සහතික කිරීම. | මැතිවරණ ක්‍රමයේ නෛතික සහ දේශපාලනික රාමු පිළිබඳව පවතින අවබෝධය ශක්තිමත් කිරීම උදෙසා පුරවැසි අධ්‍යාපන ප්‍රාරම්භකත්ව වැඩසටහන් පැවැත්වීම මගින් ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ ක්‍රියාවලියට යෝජකයන්ට සක්‍රීයව සහභාගී වීමට අවස්ථාව ලබා දීම.<br><br>කෝටාව සහ කාන්තා මන්ත්‍රීවරුන් පිළිබඳ අපේක්ෂාවන් සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධාන, කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම් සහ ප්‍රජා මූලික සංවිධාන අතර සම්මුතියක් ගොඩන නැගීම | කෝටා සඳහා වන සහාය ක්ෂණික ප්‍රායෝගික අවශ්‍යතා මගින් පමණක් මෙහෙයවනු නොලබන ආකාරයට සම්මුතිය මත පදනම් වූ නිර්ණායක මත සකස් වන නාමයෝජනා ලැයිස්තු හඳුන්වා දීම. | න්‍යායාත්මකව සහ ප්‍රායෝගිකව පළාත් පාලන පද්ධතිය ක්‍රියා කරන ආකාරය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ඇති වන පරිදි පළාත් පාලන ආයතනයන්හි වැඩ කිරීම සම්බන්ධ අත්දැකීම් පුළුල් ලෙස බෙදා ගැනීම. |

| නිර්දේශය | | ක්ෂේත්‍රය | | |
|---|---|---|---|---|
| | | කෝටාව වෙනුවෙන් පෙනී සිටින්නන් (රජය/පරිත්‍යාගශීලීන්/රාජ්‍ය නොවන සංවිධාන/ප්‍රජා මූලික සංවිධාන) | දේශපාලන පක්ෂ | කාන්තා මන්ත්‍රීවරුන්/පළාත් පාලන ආයතන |
| 5. | සියයට 25 ක කෝටාව පළාත් සභා මට්ටමින් සපුරාලීම සඳහා 2017 අංක 17 දරන පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත යටතේ මැතිවරණ පැවැත්වීම සිදු වන බවට සහතික කර ගත යුතු අතර පාර්ලිමේන්තු මට්ටම තුළ කාන්තාවන් සඳහා අවම වශයෙන් සියයට 25 ක කෝටාවක් හඳුන්වා දීම. | කෝටාව සම්බන්ධයෙන් වඩාත් පැහැදිලිව නිර්වචනය කරන ලද අපේක්ෂාවන් සහ ප්‍රතිඵල ඇති කර ගැනීම. එසේම පළාත් සභා මට්ටමින් කාන්තා කෝටාවක් වෙනුවෙන් පෙනී සිටීම. | | |
| 6. | වර්තමානයේ දී කාන්තා මන්ත්‍රීවරුන් සඳහා ලබා දෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදිතා පුහුණුව මෙන්ම නිපුණතා ඉලක්ක කරගත් පුහුණුව පිරිමි මන්ත්‍රීවරුන්ට ද ලබා දීම. | පුරුෂ සහ කාන්තා යන දෙපාර්ශවයම අතර ධනාත්මක චර්යා පද්ධතියක් ඇති කිරීමට හැකි සම්මතයන් සහ මාර්ගෝපදේශ මාලාවක් ඇති කිරීම සඳහා පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම. | දේශපාලන අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කර කාන්තාවන් සඳහා පමණක් නොවන පුහුණු සඳහා ආයෝජනය කළ කිරීම (මූල්‍යය සහ අනෙකුත් සම්පත් වෙන් කිරීම). | |
| 7. | අන්තර්කරණ සම්මතයන් (අවස්ථා සහ සම්පත් සඳහා සමාන ප්‍රවේශයක් ලබා දීම) ශක්තිමත් කිරීම සහ දේශපාලන තේමා පිළිබඳව වාර්තා කිරීමේදී මාධ්‍ය තුළ (සමාජ මාධ්‍ය ඇතුළුව) පවතින භාවිතයන් වඩාත් අන්තර්ග්‍රාහී බවට පත්කිරීම මෙන් ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට සහ කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම සිදු කරන අපරාධකරුවන්ට එරෙහිව සාර්ථක ලෙස ක්‍රියාත්මක වන,ශක්තිමත් සහ ප්‍රවේශ විය හැකි නීතිමය රාමු සකස් කිරීම. | දේශපාලනයේ සිටින කාන්තාවන් පිළිබඳ වාර්තා කිරීම සඳහා ආචාර ධර්ම පද්ධතියක් ස්ථාපිත කිරීමට මාධ්‍ය නියාමකයින් සම්බන්ධ කරගැනීම.<br><br>සමාජ මාධ්‍යවල සිදුවන ප්‍රචණ්ඩත්වයන්ට එරෙහිව කාන්තා දේශපාලනඥයින්ට සහය ලබා ගැනීම සඳහා විශ්වාසදායක වාර්තාකරණ/සහන සැලසීමේ මාර්ග/යාන්ත්‍රණ ස්ථාපිත කිරීම. | කාන්තා දේශපාලනඥයන්ගේ ක්‍රියාකාරකම්, සාමූහිකව සහ තනි තනිව සමාජ මාධ්‍ය තුළ ප්‍රවර්ධනය කිරීම. | |

| නිර්දේශය | ක්ෂේත්‍රය | | |
|---|---|---|---|
| | කෝටාව වෙනුවෙන් පෙනී සිටින්නන් (රජය/පරිත්‍යාගශීලීන්/ රාජ්‍ය නොවන සංවිධාන/ප්‍රජා මූලික සංවිධාන) | දේශපාලන පක්ෂ | කාන්තා මන්ත්‍රීවරුන්/ පළාත් පාලන ආයතන |
| 8. පළාත් පාලන පද්ධතිය වඩාත් සහභාගිත්ව, අන්තර්ග්‍රාහී සහ ප්‍රජාතන්ත්‍රවාදී කිරීම උදෙසා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම | අධ්‍යාපනය සහ අඛණ්ඩ පුහුණුව කාන්තා මන්ත්‍රීවරුන් සඳහා පමණක් නොව, පළාත් පාලන ආයතනවල සියලු ම දේශපාලන සාමාජිකයින් සඳහා සැලසුම් කර පැවැත්වීම. | දේශපාලන පක්ෂ වඩාත් අන්තර්කරණය කිරීම | පළාත් පාලන ආයතනවල කාන්තා කමිටු පිහිටුවා ඒවාට ප්‍රමාණවත් ලෙස අරමුදල් ලැබෙන බවට සහතික කිරීම.<br>සියලු ම පළාත් පාලන කමිටු සහ අයවැය ප්‍රතිපාදන විවිධත්වය කෙරෙහි සංවේදී වන බව සහතික කිරීම.<br>ජාතික භාෂා ප්‍රතිපත්තිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම |
| 9. සභිකවරියන්ට වඩාත් සඵලදායි ලෙස ක්‍රියා කිරීමට හැකි වන පරිදි දේශපාලන පක්ෂ අතර කාන්තාවන්ගේ සන්ධාන සහ එකගතාවන් ප්‍රවර්ධනය කිරීම. | | මැතිවරණ ප්‍රචාරක සහාය නීත්‍යානුකූල කිරීමේ මාර්ගයක් ලෙස, පළාත් පාලන ආයතනයන්හි සභිකවරියන්ට පුහුණුව ලබා දීමට සහ ප්‍රචාරක සහාය ලබා දීම උදෙසා පාර්ලිමේන්තුවේ කාන්තා බල මණ්ඩලය ශක්තිමත් කිරීම. | |

# 4

# සමාප්ති සටහන් සහ අධ්‍යයනයෙහි සීමා

සියයට 25 කෝටාව මගින්, "සමාජ සම්මුති" දුර්වල වූ බිඳෙන සුලු ප්‍රජාතන්ත්‍රවාදී රටවල ප්‍රතිජානන ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරන ආකාරය පිළිබඳ උදාහරණයක් සපයයි. මෙම අධ්‍යයනයෙන් මතුවන පුළුල් නිගමනවලින් එකක් නම්, දැනටමත් සමාජයේ පවතින පුළුල් අසමානතා මෙන්ම දුර්වල වූ දේශපාලන පද්ධතීන්ද සැලකිල්ලට නොගත් විට ප්‍රතිජානන ප්‍රතිපත්තිවල සඵලතාව අඩාල විය හැකි බවයි. මේ අනුව, ඉතා යහපත් අභිප්‍රායන් තිබුණද, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ප්‍රතිපත්ති කෙටුම්පත් කරන්නන් විසින් පුළුල් සමාජ හා දේශපාලන සන්දර්භය සැලකිල්ලට නොගන්නේ නම්, ප්‍රතිජානන ප්‍රතිපත්තිය සඵලදායී නොවනු ඇත. කෝටාවෙහි යෝජකයින් විසින් එය පරිකල්පනය කරන ලද ආකාරය සහ එහි ප්‍රතිඵල සැබවින්ම පිළිබිඹු වූ ආකාරය අතර පැහැදිලි වෙනසක් ඇති බව මෙම අධ්‍යයනයේදී පෙනුනි. එබැවින්, එවැනි ප්‍රතිසංස්කරණ ඵලදායී වීම උදෙසා මෙම සන්දර්භීය සාධක කෙරෙහි අවධානය යොමු කරමින්, ඒවා වඩාත් සවිස්තරාත්මකව සංකල්ප ගතකිරීම සහ වරනැගීම සිදු කළ යුතු ය. මෙම අවස්ථාවේදී, ප්‍රතිපත්තිය තුළින් ඉලක්ක කර ඇත්තේ සංඛ්‍යාත්මක නියෝජනයේ වැඩි වීමක් පමණක් වන අතර කෝටාව මගින් ලබා දුන්නේ ද එපමණක් පමණක් බව පෙනේ. අද වන විට, කාන්තා කෝටාව අසම්පූර්ණ ක්‍රමයක් තුළ දියාරු ස්වරූපයෙන් සම්මත වූවා ය යන ප්‍රවාදය අපට ඇසෙන විට, එසේ හඳුනාගත් අසාර්ථකත්වය අදාළ පණත කෙටුම්පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු වූ ආකාරය දක්වා ම දිවෙන බව පිළිගත යුතුය. සභිකවරියන්ගේ අත්දැකීම් අඩු බව සහ අකාර්යක්ෂම බව පිළිබඳ දොස් පැවරීමේ ඊනියා ඒකාකෘතික ස්වරූපය මගින් ප්‍රතිපත්තියේ, එය සකස් කිරීමේ සහ එය ක්‍රියාත්මක කිරීමේ පවතින ව්‍යුහාත්මක ගැටලු වසන් කරයි. ඇතැම් විට දෙවන පාර්ශ්වයක් විසින් හිතාමතා හෝ නොදැනුවත්ව ක්‍රියාවලිය අඩපණ කළ හැකි බැවින් ප්‍රතිපත්තියේ යෝජකයින් විරුද්ධවාදීන්ට සහ වෙනත් දේශපාලන වාසි සඳහා ප්‍රතිපත්තිය භාවිත කිරීමට උත්සාහ දරන අයට වඩා ඉදිරියෙන් සිතිය යුතුය.

රාජ්‍ය යාන්ත්‍රණ සමග වැඩ කරමින් ම, කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා රජයේ ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීමට කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම් උත්සාහ කර තිබේ. කෙසේ වෙතත්, දේශපාලන පක්ෂ සමඟ කටයුතු කිරීමට තිබූ මාර්ග සීමිත වූ අතර, දැනුවත් කිරීම සම්බන්ධයෙන් පවා දේශපාලන පක්ෂවලින් ලද පිළිගැනීම දිරිගන්වන සුලු නොවේ. කෝටාව සම්බන්ධයෙන් අදාළ පාර්ශවකරුවන් අතර තිබූ මේ දුරස්තර භාවය සහ එකිනෙකා පිළිබඳ අඩු අවබෝධය කෝටාව කෙටුම්පත් කිරීමේ, සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ අඩුපාඩුවලට වගකිව යුතු වේ. තව ද ප්‍රතිපත්තිය සම්පාදනයේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික මට්ටමේ දී මුහුණ දුන් දුෂ්කරතා ද මෙමගින් අර්ධ වශයෙන් හෝ පැහැදිලි කරනු ලැබේ. එවැනි දුෂ්කරතා සහ කඩාකප්පල් කිරීම් පැමිණියේ, කුසලතාවන්ට එරෙහිව දොරටු අවහිර කිරීම, පවුල් බලය තහවුරු කිරීම සහ පුළුල් කිරීම සඳහා කෝටාව අනිසි ලෙස භාවිත කිරීම හෝ පුද්ගලික ප්‍රතිලාභවල ස්වරූපයෙනි. ඒ අතරම, කාන්තා කෝටාවේ අවශ්‍යතාව සපුරාලීම සඳහා පක්ෂයේ පැරණි මන්ත්‍රීවරුන් වෙනුවට නව සභිකවරියන් පත් කිරීමට සමහර පක්ෂ නායකයින්ට සිදු විය. මෙයින් පෙනුනේ කෝටාවෙහි වගකීම සියලු දේශපාලන පක්ෂ අතර සමසේ බෙදී නොගිය බවයි.

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ඉතා අස්ථාවර අවධියක පවතින අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ස්ථිර ප්‍රතිපත්ති ක්‍රියාවලිය තවමත් එහි ආරම්භක අවධියේ පවතී. ඒ අනුව, ප්‍රතිජානන ප්‍රතිපත්ති මගින් සිදු කෙරෙන ප්‍රතිසංස්කරණ "සියලු ඔරු එක හා සමානව ඉහළ නංවන වඩදියක්" ලෙස සැලකීම, එනම් සියලු පසුගාමීත්වයන්ට පිළියම් සපයනු ඇත් ප්‍රතිපත්තියක් ලෙස නොසැලකිය යුතුය. අතිශයින් ආතතියට පත් ශ්‍රී ලංකාව වැනි දේශපාලන සංදර්භයක් තුළ පවතින අස්ථාවරත්වය හමුවේ දේශපාලන පක්ෂ සිය පැවැත්ම සඳහා අරගලයක් නියුතුව සිටිය දී සිදු කෙරෙන ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියක් දියත් වීමේ දී අදාළ ප්‍රතිපත්තිවල සැබෑ අරමුණු සෑහෙන දුරට හෑල්ලු වීමට ඉඩ තිබේ. සියයට විසි පහ ප්‍රතිපත්තිය සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය හැඩගස්වනු ලැබූ ප්‍රභූ තරගකාරීත්වය මගින් ද අපට පෙනෙන්නේ මෙකී සංකීර්ණ පරිසරක ප්‍රතිපත්ති සම්පාදනයේ පවතින ආවේණික

දුෂ්කරතා සහ ඔද්දල් වීම් ය. එසේ වුවද, දේශපාලන පද්ධති සහ සංස්කෘතීන් වෙනස් කිරීම සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ කටයුතු කිරීමේදී, එහි ඍජු බලපෑමට ලක්වන පාර්ශ්වයන්ගෙන් වෙන් වීම හෝ ඔවුන්ගෙන් ඈත් වීමට උත්සාහ කිරීම සාර්ථක විය හැකි නොවේ. කෝටාවෙහි බලපෑම තක්සේරු කිරීමට උත්සාහ කරන මෙම අධ්‍යයනයේදී නිරීක්ෂණය කිරීමට හැකි වන්නේ එකී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වූ එක් වටයක් පමණි. තව ද, එය ද 2018 සිට පැවති දුෂ්කර හා ධ්‍රැවීකරණය වූ දේශපාලන තත්වයක් තුළ වූ බව අමතක නොකළ යුතු ය. එහි ප්‍රතිඵලයක් ලෙස, කෝටාව මගින් තේරී පත් වූ සභිකවරියන්ට පෙර නොවූ විරූ අවිනිශ්චිත කාල සීමාවන් තුළ කටයුතු කිරීමට සිදු විය. දේශපාලන පද්ධතිය අඩපණ කළ 2018 ඔක්තෝබර් මාසයේදී සිදු වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කුමන්ත්‍රණය, 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය, ප්‍රධාන වශයෙන් ජනවාර්ගික බහුතරයේ ජනවරම අනුව පමණක් යැයි සැලකෙන ජනාධිපතිවරයකු 2019 දී තෝරා ගැනීම, කොවිඩ්-19 වසංගතය පැතිරීම, 2022 ආර්ථික අර්බුදයේ උච්චතම අවස්ථාව සහ එම වසරේම ඇති වූ මහජන විරෝධතා ඇතුළු විශාල ප්‍රමාණයේ සමාජ-දේශපාලන බිඳ වැටීම් මෙම අවිනිශ්චිත කාල සීමාවට ඇතුළත් විය. මෙම ඉතා අස්ථාවර කාලය තුළ ප්‍රජාව ගොඩනැගීම සහ නායකත්වය ඔස්සේ (ආර්ථික අර්බුදය පැවති කාලසීමාව තුල ප්‍රජා මුළුතැන්ගෙය වැනි කටයුතු සංවිධානය කිරීම වැනි) සිය වටිනාකම ඔප්පු කිරීමට සමහර සභිකවරියන්ට අවස්ථාව ලැබුණි.

අධ්‍යයනයේ දී හමු වූ තවත් ප්‍රධාන සීමා දෙකක් සටහන් කිරීමට අපි කැමැත්තෙමු. පළමුව, මෙය ගුණාත්මක අධ්‍යයනයක් වූ බැවින්, අප විසින් තෝරා ගෙන තිබූ එක් එක් කාණ්ඩය තුළ සිටින පුද්ගලයන් පරාසයක් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට අපට නොහැකි විය. උදාහරණයක් වශයෙන්, අප විසින් සියලු ම දේශපාලන පක්ෂවලට හෝ සියලු ම කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම්වලට අයත් නියෝජිතයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වූයේ නැත. එසේ හෙයින්, අපගේ සොයාගැනීම් මගින් කෝටාව පිළිබඳ කතිකාවේ තිබෙන සියලු හඬවල් පිළිබිඹු නොවේ. ධනාත්මක සහ ඍණාත්මක යන දෙයාකාරයෙන් ම සියලු දෙනා විසින් සිදු කරන ලද දායකත්වය අනුව ඔවුන්ව මෙම වාර්තාව තුළ හඳුනා නොගන්නා බැවින් මෙය සීමාකාරී වේ. තව ද, පළාත් පාලන මන්ත්‍රීවරුන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සඳහා අප විසින් වඩාත් රුචිකත්වයක් දැක්වූ ක්‍රමය කණ්ඩායම් සාකච්ඡා වූ බැවින්, මෙම අධ්‍යයනය දිස්ත්‍රික්ක පහකට සීමා විය. එහෙත්, හැකිතාක් හඬ පරාසයක් ඇතුළත් කර ගැනීම සඳහා අප විසින් උපරිම උත්සහයක් ගන්නා ලදී. ආපසු හැරී බැලීමේදී, අප සමඟ කතා කළ කාන්තාවන් බොහෝ විට වඩාත් ප්‍රගතිශීලී සහ ක්‍රියාශීලී අය බවත්, කාන්තා පළාත් පාලන සභිකවරියන් හා සම්බන්ධ ඒකාකෘති පිළිබඳව විමර්ශනය කිරීමට, හා ඔවුන්ගේ අත්දැකීම්වල පවතින සංකීර්ණත්වය තේරුම් ගැනීමට වැඩිදුර අධ්‍යයනයන් සිදු කළ යුතු බවත් සඳහන් කිරීමට කැමැත්තෙමු. දෙවනුව, පවුල් ජාල සහ වෙනත් අනුග්‍රහ ව්‍යුහයන් හරහා දේශපාලනයට පිවිසි බව කියන කාන්තාවන් සංඛ්‍යාව පිළිබඳ සමූහගත දත්ත නොමැති අතර එය වර්තමාන අධ්‍යයනයේ විෂය පථයට ඔබ්බෙන් පැවතුණි.

මෙම වාර්තාව ලිවීමේදී, සාර්ථක වූයේ කුමක්ද සහ කෝටාව වෙනුවෙන් පෙනී සිටින්නන් සහ ඒවා ක්‍රියාත්මක කරන්නන් ශක්තිමත්ව නැගී සිටියේ සහ අසාර්ථක වූයේ කොතැනද යන්න සොයා බැලීමට හැකියාව ලැබිණි. කෙසේ වෙතත්, දශක ගණනාවක් පුරා කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම් සහ ක්‍රියාකාරිනියන් විසින් වෙහෙස නොබලා අඛණ්ඩව දරන ලද උත්සාහයන් මගින් සිදු කෙරුණු සියුම් හා සාර්ථක කටයුතු පිළිබඳව අප සමඟ බෙදා ගත් විස්තර මෙන්ම සභිකවරියන් විසින් අතිශයින් අසමාන දේශපාලන පද්ධතියකට අවතීර්ණ වී එය කොතරම් දුෂ්කරද යන්න හොඳින්ම දැනුවත්ව රාජකාරිය පිළිබඳව ඉගෙන ගැනීමට හේතු වූ අධිෂ්ඨානයද ග්‍රහණය කර ගැනීම මෙවන් සීමිත අධ්‍යයනයකින් කිරීම අපහසු බව ද අපට ඉතා හොඳින් අවබෝධ විය. අවසානයේදී, ඕනෑම අනාගත අධ්‍යයනයක් සඳහා යොමු වීමේ දී ඔවුන්ගේ හඬට ඉඩක් ලබා දීමේ අවශ්‍යතාව සහ කෝටාව පිළිබඳ ඔවුන්ගේ ඇගයීම සැලකිල්ලට ගැනීමේ වැදගත්කම මෙම අධ්‍යයනය මගින් පෙන්වා දෙයි. කෝටාව ක්‍රියාත්මක කිරීමේ මීළඟ වාරයන්හි දී, කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම්, ක්‍රියාකාරිනියන් සහ අත් දැකීම් ලත් සභිකවරියන් දේශපාලන පක්ෂ සමඟ කරන සාකච්ඡා මගින් හා දේශපාලන කණ්ඩායම් ඔවුන්ගෙන් උකහා ගන්නා අවබෝධයන් විසින්, අවසානයේදී කෝටාවක් හඳුන්වා දීමේ මෙම ප්‍රතිජානන ප්‍රතිපත්තිය කොතරම දුරට දිගුකාලීන සහ ප්‍රගතිශීලී දේශපාලන වෙනසක් ඇති කරයිද යන්න තීරණය කරනු ඇත.

# 5

# පරිශීලන මූලාශ්‍ර

Athukorala, Shehara, Supriya Ramanthan, Meredith Applegate, and Sarah Bibler (2021 September). "Women's political representation in Sri Lanka: Electoral system analysis and recommendations," International Foundation for Electoral Systems, Sri Lanka.

Bjarnegård, E., Håkansson, S., & Zetterberg, P. (2022). Gender and Violence against Political Candidates: Lessons from Sri Lanka, Politics & Gender, 18, 33-61.

Centre for Poverty Analysis, (2022 September). Women in Learning and Leadership (WILL): Strengthening Women's Voice and Participation in Political Decision Making in Sri Lanka, https://www.sfcg.org/wp-content/uploads/2022/12/WILL-Final-Evaluation-Report-V4-30Sep22-clean-merged.pdf.

Centre for Women's Research Sri Lanka (2019). People's Development Justice Report on National Review and Monitoring of SDG's in Sri Lanka, https://apwld.org/wp-content/uploads/2020/07/CENWOR_Peoples-Development-Justice-Report.pdf.

Dahlerup, Drude (2021). "Women in decision-making in public life: Type, usage, and effects of temporary measures, including gender quotas," UN Women and the Commission for the Status of Women, New York.

Daily Mirror (2017 January 23). Some ministers call officials 'Booruwa' -- Asoka Peiris https://www.dailymirror.lk/article/Some-ministers-call-officials-Booruwa-Asoka-Peiris-122576.html.

Democracy Reporting International (2021 October). Improving Women's political participation in Sri Lanka, https://democracyreporting.s3.eu-central-1.amazonaws.com/images/3649DRI_Sri%20Lanka_Improving%20Women_s%20Political%20Participation_Briefing%20Paper_October%202021.pdf.

Divaina (2017 September). National Archives. Accessed 2023 October 06.

Elections Commission of Sri Lanka (2017). "Strategic Plan 2017-2020," https://elections.gov.lk/web/wp-content/uploads/2018/09/Strategic-Plan-2017-En.pdf.

European Democracy Hub (2021). EU support for women's political participation and leadership under the EU's gender action plan: A case study on Sri Lanka, https://epd.eu/wp-content/uploads/2021/12/gap-sri-lanka-final.pdf.

Franceschet, Susan, Mona Lena Krook, and Jennifer M. Piscopo (2009 September 3-6). "The impact of gender quotas," Paper presented at the Annual Meeting of the American Political Science Association, Toronto, Canada.

Herath, M (2018 January). කෝටාව ඇත, කාන්තාව?. Dinamina, pp. 9, 24.

Inter Parliamentary Union, (2022 October 03). When Quotas go wrong - and what to do about it, https://www.ipu.org/news/case-studies/2022-03/when-quotas-go-wrong-and-what-do-about-it.

Inter Parliamentary Union (2023). "Women in power in 2023: New data shows progress but wide regional gaps," https://www.ipu.org/news/press-releases/2023-03/women-in-power-in-2023-new-data-shows-progress-wide-regional-gaps.

Jayasundara-Smits, Shyamika (2022). An Uneasy Hegemony: Politics of State-building and Struggles for Justice in Sri Lanka. Cambridge, UK: Cambridge University Press.

Kadirgamar, A. (2010). "State power, state patronage and elections in Sri Lanka. Economic and Political Weekly, 45 (22), pp. 21-24.

Kamdar, B (2020 September 25). Women in Sri Lanka Make up 56% of Voters, But Only 5% of Legislators, The Diplomat, https://thediplomat.com/2020/09/women-in-sri-lanka-make-up-56-of-voters-but-only-5-of-legislators/.

Karunarathne, S. (2020 August 25). Sri Lanka's women are deprived of positions in political power yet again, EconomyNext, https://economynext.com/sri-lankas-women-are-deprived-of-positions-in-political-power-yet-again-73329/.

Kodikara, Chulani (2009). "The struggle for equal political representation of women in Sri Lanka," UNDP, Sri Lanka.

Kodikara, Chulani (2016). The Long March, Options 51 (13-15).

Kodikara, Chulani and Kumudini Samuel (2018 July 02), "The significance of the 25% quota for women in local government," Groundviews, https://groundviews.org/2018/02/07/the-significance-of-the-25-quota-for-women-in-local-government/.

Liyanage, Kamala (2012), "ශ්‍රී ලංකික පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය: අභියෝග හා අපේක්ෂා [Women's Representation in Sri Lankan Local Government: Challenges and Prospects]" Friedrich-Ebert-Stiftung, Colombo, Sri Lanka.

Manuratne, P., Dassanayake, H. & Dullewe, M. (2022). Women in political parties: A mapping of policy and practices regarding political participation of women. One-Text Initiative.

Mustafa, Faizer (2017 September 17). පළාත් පාලන ඡන්දය තියන්න සීමා නිර්ණය මාස 4කදී අවසන් කරනවා, Lankadeepa, p. 5.

OGP Report (2019). "Independent Reporting Mechanism (IRM): Sri Lanka End-of-Term Report 2016–2018," https://www.opengovpartnership.org/wp-content/uploads/2019/07/Sri-Lanka_End-Term_Report_2016-2018_EN.pdf.

Peiris, P (2022). Catch-all parties and party-voter nexus in Sri Lanka. Singapore: Palgrave Macmillan.

Peiris, P. & Lecamwasam, H. (2021). Necessary yet insufficient: Women's quota for wider political representation in Sri Lanka. Women and Media Collective.

Peiris, G. L. (2017, September 17). මේකද ප්‍රජාතන්ත්‍රවාදය?, reported by Chaminda Munasinghe, Lankadeepa, p. 4.

Peiris, G. L. (2017 September 27). පනතින් ඡන්ද බලයට මරු පහරක් එල්ල වුණා, Lankadeepa, p. 16.

Philips, Mira (2015 May 26). "The necessity of increasing women's political representation in Sri Lanka," Colombo Telegraph, https://www.colombotelegraph.com/index.php/the-necessity-of-increasing-womens-political-representation-in-sri-lanka/.

Perera, I. (2021). Women, Quota and the press: Media coverage of the 2018 local government elections. Women and Media Collective.

Political Columnist of Sunday Times (2017 October 9). Palath Palana Chandaya Hariyatama thiyennene Kawadada? (in Sinhala translation); Irida Lankadeepa, p. 19.

President's Office (2023). https://www.presidentsoffice.gov.lk/index.php/2023/05/13/sri-lanka-is-the-first-country-in-the-world-to-provide-opportunities-for-youth-representatives-to-engage-with-parliamentary-sectoral-oversight-committees/.

Ranawana, K. & Brown, S. (2021). Women, Quota and local councils. Women and Media Collective.

SC FR Application No. 35/2016, https://www.supremecourt.lk/images/documents/scfr_35_2016.pdf.

Sunday Observer (2017 January 8). Miles to go before LG poll https://archives1.sundayobserver.lk/2017/01/08/news/miles-go-lg-polls.

The Sunday Times (2015 June 28). "Ward-based electoral system for local authorities recommended," https://www.sundaytimes.lk/150628/news/ward-based-electoral-system-for-local-authorities-recommended-154990.html.

The Sunday Times (2015 October 25), Demarcation headache brings in new committee. https://www.sundaytimes.lk/151025/news/demarcation-headache-brings-in-new-committee-169193.html.

UNDP (2022). Gender equality strategy, UNDP Sri Lanka Country Office, 2019-2022.

Vijeyarasa, Ramona (2020). Women's absence in Sri Lankan politics: Lessons on the effectiveness and limitations of quotas to address under-representation, Women's Studies International Forum, Volume 81, https://doi.org/10.1016/j.wsif.2020.102371.

Wanigasinghe, Lakshila (2022 March 08), Breaking the Bias: Increasing Women's Political Participation in Sri Lanka, Talking Economics, https://www.ips.lk/talkingeconomics/2022/03/08/breaking-the-bias-increasing-womens-political-participation-in-sri-lanka/.

Wickramasighe, Maithree, and Kodikara, Chulani (2012) 'Representation in Politics: Women and Gender in the Sri Lankan Republic', in, The Sri Lankan Republic at 40: Reflections on Constitutional History, Theory and Practice- An Edited Collection of Essays, Centre for Policy Alternatives, Colombo, http://constitutionalreforms.org/wp-content/uploads/2020/03/Representation-in-Politics1.pdf.

Women's Charter (Sri Lanka) (1993 March). National Committee on Women, Ministry of Women's Empowerment and Social Welfare, Colombo, Sri Lanka, https://www.ilo.org/dyn/natlex/docs/ELECTRONIC/50168/110633/F1379312050/LKA50168.pdf.

Women's Parliamentary Caucus, Enhancing Women's Political Participation in Sri Lanka, year, 2017.